# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# வருடாந்த செயலாற்றுகை அறிக்கை
# Annual Performance Report

# 2018

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

# වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2018

අධ්‍යාපන අමාත්‍යාංශය

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 402 හි 2.4.1. ඡේදයට අනුව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා පිළියෙල කරන ලදි.

2019 මැයි


නියාමන හා කාර්යසාධන සමාලෝචන ශාඛාව
සැලසුම් හා කාර්යසාධන සමාලෝචන අංශය
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

## අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධාන අංශ, තනතුරු හා නිලධාරීන් (2018.12.31 දිනට)

**අධ්‍යාපන අමාත්‍ය**

ගරු අකිල විරාජ් කාරියවසම් මැතිතුමා

**අධ්‍යාපන ලේකම්**

පද්මසිරි ජයමාන්න මයා

**ප්‍රතිපත්ති සැලසුම් හා කාර්යසාධන සමාලෝචන අංශය**

අතිරේක ලේකම් - ආචාර්ය මධුරා එම් වෙහැල්ල මිය

**අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන අංශය**

අතිරේක ලේකම් - ආර්.එම්.එම්.රත්නායක මයා

**අධ්‍යාපන සේවා ආයතන අංශය**

අතිරේක ලේකම් - එච්.යූ. ප්‍රේමතිලක මයා

**ප්‍රසම්පාදන ඉදිකිරීම් හා පාසල් සැපයීම් අංශය**

අතිරේක ලේකම් - එච්.හේවගේ මයා

**පාසල් කටයුතු අංශය**

අතිරේක ලේකම් - ඒ.එස්.හේවගේ මයා

**අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අංශය**

අතිරේක ලේකම් - වයි.ඒ.එන්.ඩී.යාපා මයා

**පාලන අංශය**

අතිරේක ලේකම් - එල්.ඒ.අසෝක සිරිවර්ධන මයා

**මූල්‍ය අංශය**

ප්‍රධාන මූල්‍ය නිලධාරී - වයි.එම්.එස්.ගුණසේකර මයා

# පටුන

## හැඳින්වීම


දැක්ම හා මෙහෙවර
අධ්‍යාපන අමාත්‍යාංශයේ වගකීම I
අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්යභාරය I
අධ්‍යාපන අමාත්‍යාංශයට අනුබද්ධ ආයතන II
අධ්‍යාපනයේ ඉදිරි දිශානතිය III
අධ්‍යාපනයේ ගමන් මග පිළිබඳව පුළුල් දැක්මක් III
අධ්‍යාපන ආංශික සංවර්ධන සැලැස්ම (2018-2025) - ප්‍රමුඛතා ක්ෂේත්‍ර හා සංරචක IV
මූලික සංඛ්‍යා දත්ත - 2018 V


## 01. සම අධ්‍යාපන අවස්ථා සහතික කිරීම


1.1 13 වසරක අධ්‍යාපනය සහතික කිරීමේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම 3
1.2 ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනය සඳහා ප්‍රවේශය හා සහභාගීත්වය ඉහළ නැංවීම 4
1.3 නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය සහතික කිරීම 9
1.4 පාසල් පද්ධතිය තුළ සුරක්ෂිත හා ආකර්ෂණීය ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම 11
1.5 පාසල් ශිෂ්‍යයන්ගේ සෞඛ්‍ය හා පෝෂණය ඉහළ නැංවීම 15
1.6 විධිමත් වෘත්තියමාර්ගෝපදේශන හා උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම 16


## 02. අධ්‍යාපනයේ ගුණාත්මක බව ඉහළ නැංවීම


2.1 ජාතික විෂයමාලාව විවිධාංගීකරණය හා නවීකරණය කිරීම 19
2.2 කුසලතා පිරි මානව සම්පතක් නිර්මාණය කිරීම සඳහා විද්‍යා, තාක්ෂණ, ගණිත හා ඉංග්‍රීසි යන ක්ෂේත්‍රයන් හි අධ්‍යාපනය සංවර්ධනය 19
2.3 සිසුන් තුළ පරිවර්තීය කුසලතා, සාමාජ චිත්තවේග කුසලතා, ආචාර ධර්ම හා සාරධර්ම ගොඩනැංවීම 23
2.4 ගුරු සංවර්ධනය, ගුරු අධ්‍යාපනය හා ගුරු කළමනාකරණය 29
2.5 ඇගයීම් හා තක්සේරුකරණ ක්‍රමවේද වැඩිදියුණු කිරීම 32
2.6 ඩිජිටල් මාධ්‍ය භාවිතයෙන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ආකර්ශනීය ලෙස සංවර්ධනය 33
2.7 ශිෂ්‍ය ඉගෙනුම් ඵල වැඩි දියුණු කිරීම 33


## 03. අධ්‍යාපනයේ හිමිකාරීත්වය හා සේවා සැපයුම සවිබල ගැන්වීම


3.1 පාසල් නඟා සිටුවීමේ වැඩසටහන් හරහා පාසල් බලගැන්වීම 37
3.2 ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනයේ ගුණාත්මක ප්‍රමිතීන් හා ගුණාත්මකභාවය තහවුරු කිරීම 37
3.3 පාසල්,කලාප, පළාත් හා ජාතික මට්ටමේ අධ්‍යාපන පරිපාලන හා කළමනාකරණ ක්‍රියාවලිය සවිමත් කිරීම 38
3.4 දිගුකාලීන වෘත්තීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම 39


## 04. සාක්ෂි මත පදනම්ව අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනය හා සැලසුම්කරණය සවිබල ගැන්වීම


4.1 සාක්ෂි පදනම් කරගත් අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනය, සැලසුම්කරණය, පර්යේෂණ සහ ප්‍රතිඵල පාදක නියාමනය හා ඇගයීම සවිබල ගැන්වීම 43
4.2 අධ්‍යාපනයේ කාර්යසාධනය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම 44
4.3 ආංශික සබඳතා ස්ථාපිත කිරීම 44

## 05. අධ්‍යාපන සංවර්ධනය සඳහා වන අවබෝධතා ගිවිසුම් සහ ක්‍රියාත්මක වන විදේශාධාර ව්‍යාපෘති

5.1 අධ්‍යාපන අමාත්‍යාංශය විදේශීය ආයතන සමඟ ඇති කර ගෙන තිබෙන අවබෝධතා ගිවිසුම් 47
5.2 විදේශ ආධාර ව්‍යාපෘති 49

## 06. භෞතික හා මූල්‍ය ප්‍රගතිය

6.1 අධ්‍යාපන අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ පුනරාවර්තන වියදම් 55
6.2 අධ්‍යාපන අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ ප්‍රාග්ධන වියදම් 56
6.3 ප්‍රධාන කාර්යසාධන දර්ශකවලට අනුව 2018 ලබා ගත් ප්‍රගතිය 57

## 07. ශිෂ්‍ය සාධනය

7.1 පස් වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ ශිෂ්‍ය සාධනය 63
7.2 අ.පො.ස. (සා.පෙළ) විභාගයේ ශිෂ්‍ය සාධනය 63
7.3 අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ශිෂ්‍ය සාධන 64
7.4 සිසුන්ගේ ඉගෙනුම් ප්‍රාප්ති මට්ටම ඉහළ නැංවීම සඳහා ගනු ලැබූ පියවර 66

## ඇමුණුම

ඇමුණුම 1 69
ඇමුණුම 2 73

## දැක්ම

ශ්‍රී ලාංකීය අනන්‍යතාවෙහි හවුල්කරුවන් වන දක්ෂ පුරවැසි පිරිසක් මගින් විශ්ව සමාජයේ විශිෂ්ටත්වය කරා එළඹීම.

## මෙහෙවර

පාර්ශවකරුවන් තෘප්තිමත්භාවයට පත් වන අයුරින් කාර්යක්ෂමතාව හා උසස් ගුණාත්මකභාවයට යොමුවන අධ්‍යාපනයේ නවීකරණය කරන ලද නව්‍ය ප්‍රවේශයක් තුළින් ජාත්‍යන්තර ප්‍රවණතාවන්ට සරිලන පරිදි දක්ෂ පුරවැසි පිරිසක් බිහිකිරීම.

# හැඳින්වීම

## අධ්‍යාපන අමාත්‍යාංශයේ වගකීම

ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව තුළ සාමාන්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ ව ජාතික පොදු අරමුණු ඉටුකර ගැනීම උදෙසා වෙනස් වන ලෝකයට සරිලන සේ අධ්‍යාපනය ප්‍රතිනිර්මාණය කරමින් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ පුරෝගාමී වගකීම අධ්‍යාපන අමාත්‍යාංශයට පැවරී ඇත.

අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ පනත්වලින් පැනවෙන විධිවිධාන හා රෙගුලාසි ක්‍රියාත්මක කිරීම පිළිබඳ ව වගකීම මධ්‍යම අමාත්‍යාංශයට පැවරී ඇති බැවින් පළාත් අධ්‍යාපන අධිකාරීත්වයත් සමඟ සහයෝගයෙන් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම අමාත්‍යාංශයේ ප්‍රධාන භූමිකාවකි. අධ්‍යාපන ප්‍රමිති සහතික කිරීමට අත්‍යවශ්‍යයෙන් ම තිබිය යුතු මානව හා භෞතික සම්පත් ප්‍රමාණවත් ව සැපයීම හා විධිමත් සුපරීක්ෂණ ක්‍රියාවලියක් දියත් කිරීම ද අධ්‍යාපන අමාත්‍යාංශයට පැවරෙන වගකීම් අතර වේ.

අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලට පැවරී ඇති පාසල් විෂයමාලා සම්පාදනය, පෙළපොත් සම්පාදනය, ඇගයීම හා තක්සේරුකරණය වැනි වගකීම් පිළිබඳ පසු විපරම් කිරීම හා ගුණාත්මක තහවුරුව පවත්වාගෙන යාම ද අමාත්‍යාංශයේ වගකීම් භාරයට අයත් වේ.

## අධ්‍යාපනය අමාත්‍යාංශයේ කාර්යභාරය

2018.12.28 දිනැති ගැසට් නිවේදනය අනුව අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්යභාරය හා අනුබද්ධ ආයතන පහත දක්වා ඇත.

1. අධ්‍යාපන විෂයයට සහ අධ්‍යාපන අමාත්‍යාංශයට අනුබද්ධ දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
2. පූර්ව ළමාවිය, ප්‍රාථමික, ද්විතීයික හා තෘතීයික අංශ අතර මනා සම්බන්ධතාවක් ඇතිවන පරිදි අධ්‍යාපන සංවර්ධනයට අදාළ ආංශික ප්‍රතිපත්ති විශ්ලේෂණය කිරීම හා සම්පාදනය කිරීම.
3. ලෝක තරගකාරීත්වයට ආත්ම විශ්වාසයකින් හා සාර්ථකත්වය පිළිබඳ විශ්වාසයකින් යුතු ව ප්‍රවේශ වීමට හැකියාව ඇති කරවන අන්දමේ ජාතික අධ්‍යාපන ක්‍රමයක් නිර්මාණය කිරීම.
4. ජාතික පාසල් සඳහා අවශ්‍ය මානව සම්පත් සැපයීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
5. ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුකූල ව ජාත්‍යන්තර පාසල් අධීක්ෂණය.
6. පෙර පාසල් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම.
7. ඉගෙනුම් හා ඉගැන්වීමේ ක්‍රියාවලිය සඳහා පරිගණක විද්‍යාගාර ඇතුළු නූතන තාක්ෂණික පහසුකම් යොදා ගැනීම ප්‍රවර්ධනය සහ සංවර්ධනය.
8. රාජ්‍ය ප්‍රතිපත්තියට අනුකූලව පාසල් පෙළපොත්, නිල ඇඳුම්, වෙනත් ඉගෙනුම් උපකරණ සහ පහසුකම් ලබා දීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම.
9. පාසල් පුස්තකාල ප්‍රවර්ධනය හා සංවර්ධනය.
10. අධ්‍යාපනයේ ගුණාත්මකභාවය, සිසු විනය හා සදාචාරය මනා අයුරින් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය පියවර ගැනීම.
11. විශේෂ අවශ්‍යතා ඇති සිසුන් සඳහා අධ්‍යාපන අවස්ථා තහවුරු කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
12. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය, ශ්‍රී ලංකා විදුහල්පති සේවය, ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය හා ශ්‍රී ලංකා ගුරු සේවය සමග සම්බන්ධ වූ පරිපාලන සහ පිරිස් කළමනාකරණ කටයුතු ක්‍රියාත්මක කිරීම.

13. ඵලදායී ඉගෙනුම් සහ ඉගැන්වීම් ක්‍රියාවලියක් සාක්ෂාත් කිරීම සඳහා අවශ්‍ය ගුරුවරුන් බිහිකිරීම.

14. ජාතික හා සන්ධාන භාෂා අධ්‍යාපනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

15. පාසල් සංවර්ධන මණ්ඩල පරිපාලනය.

16. අධ්‍යාපන ආයතන නීතිගත කිරීම.

17. බෞද්ධ හා පාලි අධ්‍යයන කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ ආගමික අධ්‍යාපනයේ අරමුණු ඉටුවන අන්දමින් පිරිවෙන් අධ්‍යාපනය නගා සිටුවීම.

18. අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු.

**අධ්‍යාපන අමාත්‍යාංශයට අනුබද්ධ ආයතන**

- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
- අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
- ජාතික අධ්‍යාපන ආයතනය
- ශ්‍රී ලංකා ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය
- ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
- අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාල
- ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ
- ගුරු විද්‍යාල
- ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිසම
- පිරිවෙන් අධ්‍යාපන මණ්ඩලය
- රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව

## අධ්‍යාපනයේ ඉදිරි දිශානතිය

සෑම දරුවෙකුටම ඉහළ ගුණාත්මකභාවයකින් යුතු අධ්‍යාපනයක් සඳහා ප්‍රවේශය සහතික කිරීමට හැකි පරිදි සමාන අවස්ථා සැපයීම, පවතින අසමානතා අඩුකිරීම, ඩිජිටල් අධ්‍යාපන තාක්ෂණය වැනි නව මෙවලම් ඔස්සේ අධ්‍යාපනය ඉහළ නැංවීම, ගෝලීය දැනුවත්භාවය, සහයෝගීතාවය, ගැටළු විසඳීම වැනි මූලික කුසලතා සිසුන් තුළ ප්‍රවර්ධනය කිරීම ආදී අරමුණු කේන්ද්‍ර කර ගනිමින් තිරසර සංවර්ධන අභිමතාර්ථයන්ට හා රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුගතව නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හරහා අධ්‍යාපනය සඳහා සහභාගීත්වය හා අධ්‍යාපනයේ ගුණාත්මකබව ඉහළ නැංවීමට ක්‍රමෝපායික සැලසුම් සකස් කර ක්‍රියාවට නංවා ඇත.

## අධ්‍යාපනයේ ගමන් මඟ පිළිබඳව පුළුල් දැක්මක්

දැනුම පදනම් කරගත් ඉහළ තරගකාරී සමාජ වෙළඳපොළ ආර්ථිකයක් තුළින් ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ කේන්ද්‍රස්ථානය කිරීම සඳහා රජයේ V 2025 දැක්ම තුළ විශාල වැඩපිළිවෙළක් යෝජනා කොට තිබේ. ශ්‍රී ලංකාව වසර 2025 වනවිට පොහොසත් රටක් බවට පත් කිරීම සඳහා රටේ ආර්ථික, සාමාජික හා නන්විධ ක්ෂේත්‍රයන්ගේ සංවර්ධනය ඇති කරලමින් රටේ සංවර්ධනය සඳහා ඇති ගැටලු විසඳීමට පුළුල් ක්‍රමෝපායයන් මේ දැක්ම යටතේ ක්‍රියාත්මක කෙරේ. ඒ අනුව, V 2025 තුළ තිරසාර සංවර්ධනය කරා යෑමට අධ්‍යාපනය හා නිපුණතා සංවර්ධනය සඳහා වැඩි අවධානයක් යොමුකර තිබේ.

දහතුන් වසරක අඛණ්ඩ අධ්‍යාපනය තහවුරු කරමින් සිසුන්ගේ අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීමට හා අධ්‍යාපන කළමනාකරණයේ ගුණාත්මකබව ඉහළ නැංවීමේලා සුපරීක්ෂණ සේවාවක් ස්ථාපිත කිරීමට රජයේ මෙම ප්‍රතිපත්ති ප්‍රකාශය හරහා අවධානය යොමු කර ඇත.

රජයේ සංවර්ධන අපේක්ෂාවන් බලගැන්වීම උදෙසා ශ්‍රී ලාංකේය අධ්‍යාපන ක්‍රමයේ සාධාරණත්වය, සමානාත්මතාව, ගුණාත්මකබව, කාර්යක්ෂමබව හා ප්‍රමාණාත්මකබව තහවුරු කිරීමේ අරමුණු පෙරදැරිව ආංශික සංවර්ධන උපක්‍රමික සැලැස්ම (2018-2025) සකස් කර ඇත. මේ හරහා තිරසර සංවර්ධන අභිමතාර්ථයන්හි අධ්‍යාපනයට අදාළ වන්නා වූ සිව්වන අභිමතාර්ථය ඉටුකර ගැනීමෙහි ලා විශාල බලගැන්වීමක් සිදු කරයි.

ආංශික සංවර්ධන උපක්‍රමික සැලැස්ම තුළින් අපේක්ෂිත ප්‍රතිඵල පුළුල් පරාසයක් ඔස්සේ විහිද යයි. සමාන අධ්‍යාපන අවස්ථා හා අනිවාර්ය නිදහස් අධ්‍යාපනය තහවුරු කිරීමේ ලා මානව හා භෞතික සම්පත් උපරිම කාර්යක්ෂම ලෙස උපයෝජනය කිරීම, ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනයේ ගුණාත්මකබව ඉහළ නැංවීම, අධ්‍යාපනය ශාස්ත්‍රීය කාර්ය සාධනයට සීමා නොකොට ප්‍රායෝගික ක්‍රියාකාරකම් ද සහිතව ක්‍රියාවට නැංවීම මගින් සිසුන්ගේ සහභාගීත්වය ඉහළ නංවමින් 13 වසරක අනිවාර්ය අධ්‍යාපන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම යන ප්‍රතිඵල ලබා ගැනීම මෙහි දී ප්‍රමුඛ වේ.

එමෙන්ම ඉගෙනුම් අවස්ථා පුළුල් කරනු වස් ජ්‍යෙෂ්ඨ ද්විතියික මට්ටම සඳහා නව විෂය ධාරාවන් හඳුන්වාදෙමින් විෂය මාලාව ප්‍රතිසංස්කරණය කිරීම, පද්ධතියේ කාර්යක්ෂමබව හා ශිෂ්‍ය ඉගෙනුම් ඵල ඉහළ නැංවීම සඳහා තීරණ ගැනීමේ බලය හා අධිකාරීත්වය පැවරීම, පාසල් සුපරීක්ෂණ සේවාව පිහිටුවීම, ආකර්ෂණීය ඉගෙනුම් ඉගැන්වීම් පරිසරයක් සංවර්ධනය හා සංස්කෘතික වටිනාකම් මෙන්ම පුද්ගල වටිනාකම් සඳහා අවධානය යොමු කිරීම මෙහිදී අපේක්ෂිත ප්‍රතිඵල වේ.

ආංශික සංවර්ධන උපක්‍රමික සැලැස්මෙහි (2018-2025) ප්‍රධාන ප්‍රතිපත්තිමය ප්‍රමුඛතා ක්ෂේත්‍ර (Thrust Area) හා ඒ හා සබැඳි සංරචක 20 පිළිබඳව VI පිටුවේ රූපයේ දැක්වේ. මෙම සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී, මූල්‍යකරණ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම... 

අපේක්ෂිත ප්‍රතිඵල නියාමනය කිරීම සඳහා ප්‍රතිඵල පාදක නියාමන හා ඇගයීම් ආකෘතියක් ද ගොඩනංවා ඇත.ඒ සඳහා අධ්‍යාපන තොරතුරු පද්ධතිය (EMIS) තව දුරටත් සංවර්ධනය කිරීමට යොමු වී තිබේ. මීට අමතරව මේ සම්බන්ධව ඇති වන ප්‍රතිපත්තිමය ගැටලු සඳහා විසඳුම් සෙවීමට ජාතික මට්ටමින් ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්බන්ධීකරණ කමිටුව (PPCC) ස්ථාපනය කිරීමට ද නියමිතය.

## අධ්‍යාපන ආංශික සංවර්ධන සැලැස්ම (2018-2025) - ප්‍රමුඛතා ක්ෂේත්‍ර හා සංරචක

### ප්‍රමුඛතා ක්ෂේත්‍රය 01

සෑම දරුවෙකුටම සමාන ඉගෙනුම් අවස්ථා සැපයීම

1.1 13 වසරක අනිවාර්ය අධ්‍යාපන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

1.2 ප්‍රාථමික හා ද්විතීයික සම ප්‍රවේශ අවස්ථා සහ සහභාගීත්වය වැඩි කිරීම

1.3 නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය තහවුරු කිරීම

1.4 ආරක්ෂිත හා ආකර්ෂණීය ඉගෙනුම් පරිසරයක් තහවුරු කිරීම.

1.5 ශිෂ්‍යයින්ගේ සෞඛ්‍ය හා පෝෂණ තත්වය ඉහළ නැංවීම

1.6 ක්‍රමවත් වෘත්තීය මාර්ගෝපදේශ හා ශිෂ්‍ය උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

### ප්‍රමුඛතා ක්ෂේත්‍රය 02

සාමාන්‍ය අධ්‍යාපනයේ ගුණාත්මක බව වැඩි දියුණු කිරීම

2.1 විෂය මාලාව විවිධාංගිකරණය හා නවීකරණය

2.2 විද්‍යා,තාක්ෂණ, ගණිත හා ඉංග්‍රීසි අධ්‍යාපනය දියුණු කිරීම.

2.3 පරිවර්තීය කුසලතා, මනෝ සමාජීය කුසලතා සාරධර්ම හා ආචාරධර්ම කෙරෙහි නැඹුරු වූ පුළුල් අධ්‍යාපන ප්‍රවේශයක්

2.4 ගුරු සංවර්ධනය ගුරු අධ්‍යාපනය හා ගුරු කළමනාකරණය

2.5 තක්සේරුකරණ හා ඇගයුම් ක්‍රියාවලිය දියුණු කිරීම

2.6 ආකර්ෂණීය ඉගෙනුම් පරිසරයක් සඳහා තොරතුරු තාක්ෂණය පදනම් කරගත් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලීන් ප්‍රවර්ධනය

2.7 ශිෂ්‍ය ඉගෙනුම් ඵල ඉහළ නැංවීම : ජාත්‍යන්තර සබඳතා ස්ථාපිත කිරීම

### ප්‍රමුඛතා ක්ෂේත්‍රය 03

සාමාන්‍ය අධ්‍යාපනයේ හිමිකාරිත්වය සහ සේවාව ලබා දීම සවිමත් කිරීම

3.1 පාසල් සුපරීක්ෂණ සේවාව පිහිටුවීම තුලින් අධ්‍යාපනයේ ප්‍රමිතීන් තහවුරු කිරීම.

3.2 පාසල් බලගැන්වීම සඳහා පාසල් සංවර්ධන උසස් වැඩසටහන හා පාසල් පාදක කළමනාකරන වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

3.3 ජාතික,පළාත්, කලාප හා කොට්ඨාශ මට්ටමින් කළමනාකරණය හා පරිපාලනය ශක්තිමත් කිරීම.

3.4 දිගුකාලීන වෘත්තීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

### ප්‍රමුඛතා ක්ෂේත්‍රය 04

සාක්ෂි පදනම් කර ගත් ප්‍රතිපත්ති සම්පාදනය හා සැලසුම්කරණය ඉහළ නැංවීම

4.1 අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනය, සැලසුම්කරණය පර්යේෂණ, ප්‍රතිඵල පාදක නියාමනය හා ඇගයීම් ශක්තිමත් කිරීම.

4.2 අධ්‍යාපනයේ කාර්යසාධනය සම්බන්ධ මහජනතාව දැනුවත් කිරීම.

4.3 ආංශික සබඳතා ස්ථාපිත කිරීම

*මූලාශ්‍රය :- Education Sector Development Plan -General Education in Sri Lanka 2018-2025*

# මූලික සංඛ්‍යා දත්ත - 2018

රජයේ පාසල් සංඛ්‍යාව (පාසල් වර්ගය අනුව)

| | |
|---|---|
| 1AB වර්ගය | 1,044 |
| 1C වර්ගය | 1,856 |
| 2 වර්ගය | 3,217 |
| 3 වර්ගය | 4,058 |
| එකතුව | 10,175 |

රජයේ පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාව

| | |
|---|---|
| 1-5 ශ්‍රේණි | 1,672,742 |
| 6-9 ශ්‍රේණි | 1,346,305 |
| 10-11 ශ්‍රේණි | 622,620 |
| 12-13 ශ්‍රේණි | 567,032 |
| විශේෂ අධ්‍යා. ඒකක | 6,788 |
| එකතුව | 4,215,487 |

රජයේ පාසල්වල ගුරු සංඛ්‍යාව (ස්ත්‍රී පුරුෂභාවය අනුව)

| | |
|---|---|
| ස්ත්‍රී | 182,855 |
| පුරුෂ | 64,190 |
| එකතුව | 247,045 |

පෞද්ගලික පාසල් හා පිරිවෙන් සංඛ්‍යාව

| | |
|---|---|
| රජයේ අනුමත පෞද්ගලික පාසල් සංඛ්‍යාව | 80 |
| විශේෂ පාසල් සංඛ්‍යාව | 26 |
| පිරිවෙන් සංඛ්‍යාව | 761 |

රජයේ පාසල්වල ගුරු සංඛ්‍යාව (සුදුසුකම් අනුව)

| | |
|---|---|
| උපාධිධාරී | 110,676 |
| පුහුණු | 130,725 |
| වෙනත් | 5,932 |
| එකතුව | 247,333 |

පෞද්ගලික පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාව

| | |
|---|---|
| ස්ත්‍රී | 62,804 |
| පුරුෂ | 75,722 |
| එකතුව | 138,526 |

පෞද්ගලික පාසල්වල ගුරු සංඛ්‍යාව

| | |
|---|---|
| ස්ත්‍රී | 5,427 |
| පුරුෂ | 1,356 |
| එකතුව | 6,783 |

පිරිවෙන්වල ගුරු සංඛ්‍යාව

| | |
|---|---|
| පැවිදි | 3,099 |
| ගිහි | 3,384 |
| එකතුව | 6,477 |

පිරිවෙන්වල ශිෂ්‍ය සංඛ්‍යාව

| | |
|---|---|
| පැවිදි | 31,818 |
| ගිහි | 28,622 |
| එකතුව | 60,440 |

1AB - විද්‍යා විෂය ධාරාව ද ඇතුළත්ව අ.පො.ස.(උ.පෙ) දක්වා පන්ති සහිත පාසැල්
1C - විද්‍යා විෂය ධාරාව නොමැති අ.පො.ස.(උ.පෙ) දක්වා පන්ති සහිත පාසැල්
2 වර්ගය - අ.පො.ස.(සා.පෙ) දක්වා පමණක් පන්ති සහිත පාසැල්
3 වර්ගය - 1 සිට 5 හෝ 1 සිට 8 දක්වා ශ්‍රේණි පමණක් සහිත පාසැල්

මූලාශ්‍රය : පාසල් සංගණනය - 2018
තාවකාලික වාර්තාව

අධ්‍යාපන ආංශික සංවර්ධන සැලැස්මෙහි සඳහන් ප්‍රමුඛ ක්ෂේත්‍රයන්ට අනුව එක් එක් සංරචක ඔස්සේ ක්‍රියාත්මක කළ ක්‍රමෝපායයන් හා ළඟාකර ගත් ප්‍රගතිය පිළිබඳ විස්තර 1 සිට 4 දක්වා පරිච්ඡේදවල සඳහන් වේ. සමස්ත කාර්යසාධනය හා සම්බන්ධ අනෙකුත් තොරතුරු 5 සිට 7 දක්වා පරිච්ඡේදවල සඳහන් වේ.



# 01.

# සම අධ්‍යාපන අවස්ථා සහතික කිරීම

## 13 වසරක අධ්‍යාපන වැඩසටහන යටතේ ක්‍රියාකාරී අධ්‍යාපනයක යෙදෙන සිසුන්









# 1.1 13 වසරක අධ්‍යාපනය සහතික කිරීමේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

## 1.1.1 13 වසරක අධ්‍යාපන සහතික කිරීමේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා පාසල්වලට පහසුකම් සැලසීම

- සෑම ශිෂ්‍යයෙකුම පාසලට ඇතුලත් ව වසර 13ක අධ්‍යාපනය ලැබීම සහතික කිරීම සඳහා නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ 13 වසරක අධ්‍යාපන වැඩසටහන 2017 වර්ෂයේ දී ආරම්භ කරන ලදී.

- 2017 වර්ෂයේ දී නියාමක පළමු අදියර ලෙස පාසල් 42කද, 2018 වර්ෂයේ දී නියාමක දෙවන අදියර ලෙස පාසල් 154කද වැඩසටහන ආරම්භ කරන ලද අතර 2019 වර්ෂයේ දී තවත් පාසල් 112ක ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

- පළමු අදියර දෙකෙහි සමස්ත ප්‍රතිලාභී ශිෂ්‍ය සංඛ්‍යාව 9,600ක් පමණ විය.

**වැඩසටහනට භෞතික පහසුකම් සැපයීම**

- මෙම වැඩසටහන සඳහා අතිරේක පන්ති කාමර අවශ්‍ය වූ පාසල් වලට ගොඩනැගිලි ලබා දීම හා පැවති පන්ති කාමර අලුත්වැඩියාව සිදු කරන ලදී. මේ යටතේ පාසල් 195ක පන්ති කාමර සකස් කර නවීන තාක්ෂණය යොදා ගනිමින් ඉගැන්වීම සඳහා අවශ්‍ය interactive boards, පරිගණක, VR කට්ටල ලබා දෙමින් සුහුරු පන්ති කාමර (Smart Classroom) ස්ථාපිත කර ඇත. එමෙන් ම වෘත්තීය විෂය ධාරාව ඉගැන්වීම සඳහා අවශ්‍ය උපකරණ ලබා දීමට කටයුතු කර ඇත.

**මානව සම්පත් සැපයීම**

- පාසල්වල සිටි ගුරුවරුන් අතරින් පොදු විෂය මාලාව ඉගැන්වීම සඳහා ගුරුවරුන් 1,237 දෙනෙක් හා වෘත්තීය විෂය ඉගැන්වීමට ගුරුවරුන් 250 දෙනෙක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් පුහුණු කරන ලදී. එමෙන් මෙම වසරේ වෘත්තීය විෂයයන් සඳහා අලුතින් උපාධිධාරී ගුරුවරුන් 933 බඳවා ගනු ලැබූ අතර එම ගුරුවරුන් පුහුණු කිරීමට ද පියවර ගන්නා ලදී.

**පාසල් බලගැන්වීම**

- පාසල් මට්ටමින් මෙම වැඩසටහන ඵලදායිව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සම්පත් යොදවා ගැනීමට පාසල් පාදක මූල්‍ය ප්‍රදානයන් ලබා දීමට පියවර ගෙන ඇත. එමෙන්ම විදුහල්පතිවරුන් හා සම්බන්ධීකරණ නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය සඳහා වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරන ලදී.

## 1.1.2 13 වසරක අධ්‍යාපනය සහතික කිරීම සඳහා අවශ්‍ය පරිදි විෂයමාලා ප්‍රතිසංස්කරණය

- අ.පො.ස.(සා.පෙ.) ප්‍රතිඵල කුමක් වුවත් ශිෂ්‍යයෙකුට තම ලැදියා හා හැකියා අනුව අ.පො.ස.(උ.පෙ.) විෂය ධාරාවක් තෝරා ගත හැකි වන සේ නව වෘත්තීය විෂය ධාරාවක් හඳුන්වා දීම මේ යටතේ සිදු විය.

- මෙම වෘත්තීය විෂය ධාරාවට පොදු විෂය මාලාවක් හා වෘත්තීය විෂයමාලා 26 ක් ඇතුලත් වේ. ශිෂ්‍ය ලැදියාවන්, ප්‍රාදේශීය රැකියා අවස්ථා හා ප්‍රායෝගික පුහුණු අවස්ථා සැලකිල්ලට ගනිමින් වෘත්තීය විෂයයන් තෝරා ගැනීමට පාසල්වලට අවස්ථාව ලබා දී ඇත.

- පොදු විෂය මාලාවට අයත් විෂයයන් 9ක් සඳහා මොඩියුල සකස් කිරීම, වෘත්තීය විෂය 26ක් සඳහා හඳුන්වාදීමේ මොඩියුල සහ අන්තර් මාධ්‍ය මොඩියුල සකස් කිරීම ජාතික අධ්‍යාපන ආයතනය මඟින් සිදුකරන ලදී.

- වෘත්තීය විෂයයන් ක්‍රියාත්මක කිරීම සඳහා වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර එම ක්ෂේත්‍රයේ රාජ්‍ය හා පෞද්ගලික ආයතන හඳුනාගෙන එම ආයතන සමඟ නිරන්තර සම්බන්ධීකරණය පවත්වා ගනිමින් ශිෂ්‍යයින් ප්‍රායෝගික පුහුණුව සඳහා යොමු කිරීමට වැඩපිළිවෙලක් සකස් කර ඇත.

## 1.2 ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනය සඳහා ප්‍රවේශය හා සහභාගීත්වය ඉහළ නැංවීම

### 1.2.1 ජාතික පාසල් සංවර්ධනය සහ නව ජාතික පාසල් ඇති කිරීම

සම සාධාරණ අධ්‍යාපන ප්‍රවේශ අවස්ථා හා ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීම තහවුරු කරලීම සඳහා ගනු ලබන පියවර අතර ජාතික පාසල් සංවර්ධනයට ද සුවිශේෂී තැනක් හිමි වේ.

- ජාතික පාසල්වල අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලවල ධාරිතා සංවර්ධනය සඳහා මෙම වර්ෂයේ වැඩසටහන් රැසක් ක්‍රියාවට නංවන ලදී.
  - විගණන හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳව - විදුහල්පති / නි. විදුහල්පති 658 ක් පුහුණු කිරීම.
  - 01/2016 චක්‍රලේඛය අනුව අධ්‍යයන කාර්ය මණ්ඩලය ගණනය කිරීම - විදුහල්පති / නි. විදුහල්පති 557 ක් පුහුණු කිරීම.
  - ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය හා පරිපාලනය - ද්විතියික අංශ ප්‍රධානීන් 557 ක් පුහුණු කිරීම.
  - විගණන විමසුම් සකස් කිරීම - විෂයයභාර නි. විදුහල්පති 200 ක් පුහුණු කිරීම.
  - අනධ්‍යයන රාජකාරී - අනධ්‍යයන කාර්ය මණ්ඩල 5,390ක් පුහුණු කිරීම.
  - වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීම - විදුහල්පති / මූල්‍ය සහකාර 708ක් පුහුණු කිරීම.

- අධ්‍යාපන ගුණාත්මක සංවර්ධනය සඳහා "පාසල් පාදක ඉගෙනුම් ප්‍රවර්ධන ප්‍රදානය" (SBLIG) යටතේ පාසල් 194කට රු.මි.130ක මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙන ලදී.


පාසල් පාදක මානව සම්පත් ප්‍රවර්ධන ප්‍රදානය

- පාසල් පාදක ව මානව සම්පත් ප්‍රවර්ධන සැලස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීමත් එමගින් පාසලේ සමස්ත ගුණාත්මක සංවර්ධනය සඳහා පාසල සතු මානව සම්පත් කාර්යක්ෂම ව හා ඵලදායිව යොදා ගැනීම පිණිස අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය ලබාදීමත් අරමුණු කර ගෙන අධ්‍යාපන අමාත්‍යාංශය පාසල්වල මානව සම්පත් ප්‍රවර්ධන වැඩසටහන හඳුන්වා දී තිබේ. ඒ සඳහා විදුහල්පතිවරුන් සකස් කර ඉදිරිපත් කරනු ලබන ව්‍යාපෘති වාර්තාවන් පදනම් කරගෙන "පාසල් පාදක මානව සම්පත් ප්‍රවර්ධන ප්‍රදානය (HRIG) පාසල්වලට ලබා දීමට පියවර ගෙන ඇත. ඒ යටතේ ජාතික පාසල් 208ක් සඳහා රු.මි.40ක ප්‍රතිපාදන ලබාදීම මෙම වසරේ සිදුවිය.

- කුරුණෑගල දිස්ත්‍රික්කයේ පාසල් සඳහා පවතින අධික ඉල්ලුමට ප්‍රතිචාරිව සියලුම පහසුකම් සපිරි ජාතික පාසලක් ලෙස විශ්වෝදා ජාතික පාසල කුරුණෑගල මහුරුඹය ප්‍රදේශයේ ස්ථාපිත කිරීමට කටයුතු කරන ලදී.

- සියලුම ජන වර්ගවලට අයත් ශිෂ්‍යාවන් සඳහා ත්‍රෛභාෂා මාධ්‍යයන්ගෙන් යුත් නව ජාතික පාසලක් කොළඹ ප්‍රදේශයේ ආරම්භ කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය මේ වන විට ලැබී ඇත.

### 1.2.2 විශේෂ අධ්‍යාපනය, නොවිධිමත් අධ්‍යාපනය සහ අන්තර්කරණ අධ්‍යාපනය සවිබල ගැන්වීම

#### විශේෂ අධ්‍යාපනය සහ අන්තර්කරණ අධ්‍යාපනය

- ජාතික හා පළාත් මට්ටමින් පාසල්වල විශේෂ අධ්‍යාපන ඒකක 710ක් ක්‍රියාත්මක වේ. විශේෂ අවශ්‍යතා සහිත සිසු දරුවන්ගේ අධ්‍යාපන අයිතීන් තහවුරු කිරීම සඳහා විවිධ ක්‍රියාමාර්ග රාශියක් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ගෙන ඇත.

- විශේෂ අධ්‍යාපන ක්‍රීඩා පුහුණුකරුවන් සඳහා උපදෙස් සංග්‍රහයක් සකස් කිරීම හා පුහුණුකරුවන් පුහුණු කිරීම සිදු කරන ලදී.

- තාක්ෂණික උපකරණ ගැනීම පිළිබඳ විශේෂ අධ්‍යාපන ගුරුවරුන් 642ක් හා ඔටිසම් පුහුණුව යටතේ ගුරුවරුන් 70ක් පුහුණු කිරීමට කටයුතු කරන ලදී.
- විශේෂ අවශ්‍යතා සහිත ළමයින්ගේ අධ්‍යාපනය සඳහා වෙනිවැල් කොළ ඉදි කරනු ලබන ජාතික සම්පත් මධ්‍යස්ථානයේ ඉදිකිරීම් 85%ක් පමණ අවසන් කර ඇත.
- ජාතික පාසල්වල නව විශේෂ අධ්‍යාපන ඒකක 6ක් ඉදිකිරීමට හා ඒකක 19ක් නවීකරණය කිරීමට පියවර ගෙන ඇත. විශේෂ අධ්‍යාපන ඒකක සඳහා ඉගෙනුම් උපකරණ ලබාදීම ද මීට සමගාමීව සිදු විය.
- හාපිටිගම හා අඩ්ඩාලච්චේන අධ්‍යාපන විද්‍යාපීඨ වල විශේෂ අධ්‍යාපන ගුරු පුහුණුව සඳහා ඉගෙනුම් උපකරණ ලබාදීමට ප්‍රසම්පාදන කටයුතු සිදුකරමින් පවතී.
- විශේෂ අවශ්‍යතා සහිත සිසුන් වෙනුවෙන් ඇස්කන්නාඩි 2,711 ක් හා සවන්හල් 64ක් මිලදී ගෙන දීමට පියවර ගනු ලැබිණි.
- විශේෂ අධ්‍යාපනය හා බැඳී සිටින නිලධාරීන්, ගුරුවරුන් හා උපදේශකවරුන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා බ්‍රේල් හා ඔටිසම් පුහුණු වැඩසටහන් ඇතුළු පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.
- ඉන්දියාවේ පැවති ගෝලීය තොරතුරු තාක්ෂණ වැඩසටහන සඳහා විශේෂ අවශ්‍යතා සහිත ශිෂ්‍යයින් 4 දෙනෙකු සහභාගී කරවන ලදී.
- විශේෂ අධ්‍යාපනය ලැබූ දරුවන් සාමාන්‍ය පන්ති කාමර සඳහා අනුවර්තනය කර ගැනීම සඳහා අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳව ප්‍රාථමික හා විශේෂ ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහනක් ද ක්‍රියාත්මක කෙරේ.
- අ.පො.ස.(සා.පෙ) ගණිත විෂය නිර්දේශය අන්ධ සිසුන්ට ගැළපෙන පරිදි සකස් කිරීම සඳහා ගුරුවරුන් පුහුණු කිරීමට කටයුතු කරන ලදී.
- බුද්ධි ඌනතා සිසුන්ගේ අධ්‍යාපන සංවර්ධනය අදියර කිහිපයකින් ක්‍රියාත්මක කළ යුතු බැවින් ඒ සඳහා මොඩියුල කිහිපයක් සකස් කිරීමට ආරම්භ කර ඇත. පාසලක 1 ශ්‍රේණියේ ඉගෙනුම ලැබීමට සූදානම් කිරීමේ පළමුවන පුහුණු මොඩියුලය මේ වන විට සකසා ප්‍රායෝගික ව නියාමක මට්ටමේ ක්‍රියාත්මක වෙමින් පවතී.
- උපකෘත විශේෂ පාසල් සඳහා උපදෙස් සංග්‍රහයක් කෙටුම්පත් කරන ලදී.
- විශේෂ අධ්‍යාපන වෘත්තිකයන් 25 දෙනෙකු සඳහා කොරියානු පුහුණු අවස්ථා ලබා දෙන ලදී.
- රාජ්‍ය ආයතන වලට පැමිණෙන දෘශ්‍යාබාධිත සහ ශ්‍රවණාබාධිත ප්‍රජාවට සහන සැලසීම සඳහා බ්‍රේල් මාධ්‍යය මඟින් සහ සංඥා භාෂාව මගින් කටයුතු කිරීමට හැකියාව ලබාදීමේ අරමුණින් රාජ්‍ය නිලධාරීන් වෙනුවෙන් දින 21ක බ්‍රේල් මාධ්‍ය පාඨමාලාවක් සහ දින 21ක සංඥා භාෂා පාඨමාලාවක් සඳහා විෂය නිර්දේශයන් සකස් කරන ලදී.

## නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන්

- විවිධ හේතූන් මත පාසලින් බැහැර වූ පාසල් වයසේ ළමයින් පාසල්ගත කිරීම සඳහා අනිවාර්ය අධ්‍යාපන කමිටු යාවත්කාලීන කිරීමේ වැඩසටහන් 45ක් පළාත් මට්ටමින් පවත්වන ලදී.
- විකල්ප අධ්‍යාපන අවස්ථා සැලසීම යටතේ බන්ධනාගාර පාසලේ උපදේශන වැඩසටහනක් පැවැත්වීම හා මාවත්වාසී ළමුන් සඳහා සාක්ෂර පන්ති 8ක් නැණසරණ වැඩසටහන යටතේ ක්‍රියාත්මක කිරීම සිදු විය.
- සාක්ෂරතාව වැඩි කිරීම සඳහා සාක්ෂර පන්ති 38ක් පවත්වන ලද අතර එම පාඨමාලා සඳහා සහභාගීත්වය 378ක් විය.
- ප්‍රජා ඉගෙනුම් මධ්‍යස්ථාන 37ක ආදායම් ඉපයීමේ පාඨමාලා 60ක් ක්‍රියාත්මක කරන ලදී. සහභාගීත්වය 1,520කි.
- නොවිධිමත් අධ්‍යාපන පුහුණු මොඩියුලය සකස් කිරීම හා පාඨමාලා උපදේශකවරුන් 394ක ගේ ධාරිතා සංවර්ධනය සඳහා වැඩසටහන් පැවැත්වීම ද සිදු කරන ලදී.



ගුරු ධාරිතා සංවර්ධන වැඩසටහනක්

## 1.2.3 පිරිවෙන් අධ්‍යාපන සංවර්ධනය

- පිරිවෙන් යටිතල පහසුකම් සංවර්ධනය යටතේ පිරිවෙන් 62ක් සඳහා සනීපාරක්ෂක පහසුකම් සැලසීම, පිරිවෙන් කාර්යාල ගොඩනැගිලි 25ක් ඉදි කිරීම, පිරිවෙන් හා පිරිවෙන් අභ්‍යාස ආයතන සඳහා පරිගණක 44ක් ලබා දීම,දෙකඳුවල සීලමාතා අධ්‍යාපන ආයතනයට උපකරණ ලබා දීම සිදු කරන ලදී.
- නව පරිවේණාචාර්යවරු 197ක් 2018 වර්ෂයේ දී බඳවා ගන්නා ලදී.
- පිරිවෙන් අධ්‍යාපන මණ්ඩලය මඟින් අනුමැතිය ලබා දී තිබූ නව පිරිවෙන් 17ක් 2018 දී ලියාපදිංචි කරන ලදී.
- පිරිවෙන් සඳහා වාර්ෂික ශිෂ්‍යාධාර ලබාදීම යටතේ රු.මි.254ක් පිරිවෙන් සඳහා බෙදා දෙන ලදී.
- සම්භාෂා ශාස්ත්‍රීය සඟරාවේ 19 කලාපය මුද්‍රණය කිරීමේ කටයුතු මේ වන විට සිදුවෙමින් පවතින අතර එය 2019 දෙසැම්බර් මාසයේ දී එළි දැක්වීමට නියමිතය.
- 2018 අන්තර් පරිවේණික භාෂා හා සාහිත්‍ය තරඟාවලියේ දිස්ත්‍රික් මට්ටමින් තරඟ පැවැත්වීම සිදු කර ඇත.
- සීතාවක හා වේනමුල්ල පිරිවෙන් පුහුණු ආයතන සඳහා අරමුදල් ලබා දෙන ලදී.
- දිස්ත්‍රික් මට්ටමින් තෝරා ගත් පිරිවෙන් සඳහා  පුස්තකාල පොත් මිල දී ගෙන දීමට අදාළ කටයුතු සිදු කරන ලදී.
- "එළ සපිරි පිරිවෙන" වැඩසටහන තුළින් පිරිවෙන්වල ගුණාත්මකභාවය වැඩි කිරීම සඳහා විවිධ ක්‍රියාකාරකම් සිදු කරන ලදී.
- පිරිවෙන් ගුරුවරුන් ගේ හා ගුරු උපදේශකවරුන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා වැඩසටහන්ද ශිෂ්‍යයින් සඳහා භාවනා පුහුණු වැඩසටහන් ද පවත්වන ලදී.



පිරිවෙන් සඳහා ආධාර ලබා දීම



පරිවේණාචාර්ය ධාරිතා සංවර්ධන වැඩසටහනක්

## 1.2.4 වතු පාසල් සංවර්ධනය සහ දෙමළ මාධ්‍ය පාසල් සංවර්ධනය

### වතු පාසල් සංවර්ධනය

අධ්‍යාපනයේ සම සාධාරණත්ව ප්‍රවේශයක් ඇති කරලීම සඳහා ක්‍රියාත්මක වැඩපිළිවෙළ තුළ වතු පාසල් සංවර්ධනය සඳහා ලබාදෙන්නේ වැදගත් ස්ථානයකි. වතු පාසල් සංවර්ධනය කිරීම සහ සිසුන්ගේ සාධන මට්ටම වර්ධනය කිරීම සඳහා ශිෂ්‍ය පාදක වැඩසටහන් සහ  ගුරුභවතුන්ගේ ඉගෙනුම් ක්‍රමවේද දියුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාවට නංවා ඇත.

- ශිෂ්‍ය සාධන මට්ටම් ඉහළ නැංවීම සඳහා  ද්විතීයික අධ්‍යාපන ගුරුභවතුන් පුහුණු කිරීමේ වැඩසටහන් ගණිතය, විද්‍යාව, ඉංග්‍රීසි, චිත්‍ර, කෘෂිකර්මය, දෙමළ, තොරතුරු තාක්ෂණය, ඉතිහාසය, ක්‍රීඩා යන විෂයන්ට අදාළව ක්‍රියාත්මක කරන ලදී.

- ඉන්දියාවේ බ්‍රිජ් ඇකඩමියේ සම්පත් පුද්ගල දායකත්වය මත මධ්‍යම හා ඌව වතු පාසල් සෞන්දර්ය ගුරුවරුන් සඳහා වැඩමුළු පවත්වන ලදී.
- පසුගිය වසර 40 ක කාලයක් වතු පාසල් අධ්‍යාපන සංවර්ධනය කොපමණ දුරකට දියුණු වී ඇති ද යන්න සමාලෝචනය කිරීම සඳහා දේශීය සම්මේලනයක් පැවැත්වීමට අපේක්ෂිත අතර එමඟින් වතු පාසල් පද්ධතිය ප්‍රතිපෝෂණය කිරීම අරමුණ වේ.
- කෙටි කාලීන විදේශ පුහුණු වැඩ සටහනක් සඳහා වතු පාසල් විදුහල්පතිවරුන් හා පළාත් සම්බන්ධීකරණ නිලධාරීන් සහභාගී කරවන ලදී.
- වතු පාසල්වල විදුහල්පතිවරුන් සඳහා කළමණාකරන කුසලතා හා නායකත්ව ගුණාංග වැඩිදියුණු කිරීමට ධාරිතා වර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.
- ජාතික ශිෂ්‍ය තක්සේරුකරණ වැඩසටහන (NEREC) යටතේ වතු පාසල් ශිෂ්‍යයින්ගේ ඉගෙනුම් සාධනය සම්බන්ධයෙන් වතු පාසල් වල විදුහල්පතිවරුන් දැනුවත්කිරීමේ වැඩමුළු පැවත්වන ලදී.
- වතු පාසල් වැඩිදියුණු කිරීම සඳහා සමාගම් යටතේ පාලනය වන රාජ්‍ය වතු වලින් ඉඩම් ලබා ගැනීම සම්බන්ධව කැබිනට් තීරණයට අනුව අවශ්‍ය කටයුතු අදාළ පළාත් හා සම්බන්ධ වී සිදු කරමින් පවතී.
- ළඟම පාසල හොඳම පාසල යටතේ වතු පාසල් 24ක අලුත්වැඩියා සහ පාසල් 42ක නව ඉදි කිරීම් සිදු කරමින් සංවර්ධනය කිරීමටත් වතු පාසල් 100කට පමණ අවශ්‍ය උපකරණ හා ලී බඩු ලබාදීමටත් කටයුතු කර ඇත.
- ඉන්දියානු රජයේ ආධාර යටතේ මධ්‍යම, ඌව, සබරගමුව සහ දකුණ යන පළාත් වල තෝරාගත් වතු පාසල් 09 ක යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට සැලසුම් කර ඇත.

### දෙමළ පාසල් සංවර්ධනය



දෙමළ මාධ්‍ය පාසල්වල ගුරු සංවර්ධන වැඩසටහනක්

- දෙමළ පාසල් සංවර්ධනය සඳහා ශ්‍රී.ලං.අ.ප.සේ. නිලධාරීන් හා විදුහල්පතිවරුන් 40 දෙනෙක් පුහුණුකරුවන් ලෙස පුහුණු කිරීම, අභ්‍යන්තර අධීක්ෂණය සඳහා විදුහල්පතිවරුන් සහ ජ්‍යෙෂ්ඨ ගුරුවරුන් 676ක ගේ ධාරිතා සංවර්ධනය හා විදුහල්පතිවරුන්ගේ සහ නියෝජ්‍ය විදුහල්පතිවරුන් 1,063කගේ ධාරිතා සංවර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.
- දෙමළ පාසල් 43ක පාසල් පාදක සංවර්ධන වැඩසටහන් පැවැත්වීමට හා පළාත් මට්ටමින් ඉගැන්වීම් ක්‍රම සම්බන්ධ ව ගුරුවරුන් පුහුණු කිරීමට පියවර ගනු ලැබිණි.

### මුස්ලිම් පාසල් සංවර්ධනය

- මුස්ලිම් පාසල්වල සාධන මට්ටම ඉහළ දැමීම සඳහා විදුහල්පතිවරුන්ගේ හා නියෝජ්‍ය විදුහල්පතිවරුන්ගේ ධාරිතා සංවර්ධනය යටතේ 882දෙනෙකු පුහුණු කරන ලදී.
- ඉස්ලාම් ගුරු උපදේශකවරුන් හා මවුලවී ගුරුවරුන් හට පාසල් කලමනාකරණය, උපදේශනය, වෘත්තීය මගපෙන්වීම, ඉගෙනුම් ඉගැන්වීම් පිළිබඳ ක්‍රමෝපායන් දිරිගැන්වීම සඳහා කටයුතු කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ද පවත්වන ලදී ඒ සඳහා ගුරුවරුන් 50 දෙනෙක් හා ගුරු උපදේශකවරුන් 10 දෙනෙක් සහභාගී වූහ.
- නියෝජ්‍ය විදුහල්පතිවරුන් හා අංශ ප්‍රධානීන් සඳහා පාසල් කළමනාකරණය හා විෂයානුබද්ධ ක්‍රියාකාරකම් සම්බන්ධ ධාරිතා සංවර්ධන වැඩසටහන් යටතේ 110දෙනෙක් පුහුණු කරන ලදී. විදුහල්පති හා ගුරු උපදේශකවරුන්හට පාසල් කලමනාකරණය, පාසල් පරිපාලනය, සැලසුම්, විනය, නායකත්ව සංවර්ධනය වැඩිදියුණු කිරීම සඳහා වැඩසටහන් පවත්වන ලදී.



මුස්ලිම් පාසල් ගුරු ධාරිතා වර්ධන වැඩසටහන්

### පෞද්ගලික පාසල් සංවර්ධනය හා නියාමනය

- රජයේ අනුමත පෞද්ගලික පාසල්වල ගුරු ගණනය සඳහා 2018/17 චක්‍ර ලේඛය නිකුත් කරන ලදී.
- රජයේ අනුමත පෞද්ගලික පාසල් වල ශාඛා පාසල් 9ක් රෙගුලාසි ගතකිරිම සඳහා සහ ආධාර නොලබන පෞද්ගලික පාසල් 13ක් සඳහා ගුරු වැටුප් ආධාර ලබා දිම සම්බන්ධ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනිමට කටයුතු කරන ලදී.
- රජයේ අනුමත පෞද්ගලික පාසල් 20ක් මෙම වසරේ අධීක්ෂණය කරන ලදී.
- රජයේ අනුමත පෞද්ගලික පාසල්වලට අදාළව ගුරු පත්වීම් 285ක් විශ්‍රාම ගැන්වීම් 102ක් විදේශ නිවාඩු 223ක් හා සේවා අවසන් කිරීම් 64ක් අනුමත කරන ලදී.
- රජයේ අනුමත පෞද්ගලික පාසල් සඳහා තාක්ෂණික විෂය ධාරාව ආරම්භ කිරිමට අවස්ථාව සැලසීමට පියවර ගනු ලැබිණි.
- රජයේ අනුමත පෞද්ගලික පාසල් කළමනාකරුවන් හා විදුහල්පතිවරුන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පවත්වන ලදී.
- පෞද්ගලික පාසල්වල ගුරුවරුන්ට ද දේපල ණය වරප්‍රසාද ලබා දීමට කටයුතු කෙරිණි.
- සියළුම පෞද්ගලික හා ජාත්‍යන්තර පාසල් සිසුන්ට සුරක්ෂා සිසු රක්ෂණ ප්‍රතිලාභ ලබා දිමට පියවර ගෙන ඇත.
- ජාත්‍යන්තර පාසල් රෙගුලාසිගත කිරීම සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සැලසුම් හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන් ඉදිරිපත් කර ඇති අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළ තීරණ ක්‍රියාත්මක කිරීමේ කටයුතු ඉටුකරමින් පවතී.
- 2019 වසරේ දී ජාත්‍යන්තර පාසල් සඳහා රෙගුලාසි සකස් කිරිමට හා රජයේ අනුමත පෞද්ගලික පාසල් සඳහා නීති සැකසිමට අපේක්ෂා කෙරේ.

## 1.3 නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය සහතික කිරීම

### 1.3.1 ශිෂ්‍ය සුභසාධන සේවා ශක්තිමත් කිරීම

1.3.1 වගුව - පාසල් නිල ඇඳුම්,පාවහන් හා පෙළපොත් ලබාදීම

| වැඩසටහන | 2018 වර්ෂය සඳහා | | 2019 වර්ෂය සඳහා | |
|---|---|---|---|---|
| | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වියදම රු.මි. (2017) | අපේක්ෂිත ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ඇස්තමේන්තුව රු.මි. (2018) |
| පාසල් නිල ඇඳුම් ලබාදීම | ලක්ෂ 43 | 2,212 | ලක්ෂ 44 | 2,600 |
| පාසල් පෙළපොත් ලබාදීම | ලක්ෂ 42 | 4,280 | ලක්ෂ 42 | 4,800 |
| දුෂ්කර ප්‍රදේශවල පාසල් සිසුන්ට පාවහන් ලබාදීම | ලක්ෂ 6.5 | 752 | ලක්ෂ 6.9 | 640 |





නිල ඇඳුම් වවුචර්පත් ප්‍රදානය කිරීම



පාවහන් වවුචර්පත් ප්‍රදානය කිරීම



පෙළ පොත් ලබා දීම

ශිෂ්‍යාධාර වැඩසටහන්

- **සුහග ශිෂ්‍යත්ව වැඩසටහන**

පාසල් පද්ධතිය තුළ සිටින ශාස්ත්‍රීය අධ්‍යාපනයට මෙන්ම සෞන්දර්ය, ක්‍රීඩා, නව නිපැයුම් ආදී ක්ෂේත්‍ර වලින් ද සුවිශේෂී කුසලතා පෙන්වන නිර්මාණශීලී දරුවන්ට ඔවුන්ගේ හැකියාවන් තවදුරටත් වැඩි දියුණු කර ගැනීම සඳහා සවියක්වීමේ අරමුණින් සුහග ශිෂ්‍යත්ව අරමුදල 2018 වර්ෂයේ දී ආරම්භ කරන ලදී.පළමු ශිෂ්‍ය කණ්ඩායම ලෙස නිර්ණායක මත තෝරා ගත් ශිෂ්‍යයන් 1,000කට එක් ශිෂ්‍යයෙකුට රු.50,000ක් බැගින් වටිනා ශිෂ්‍යත්වයක් මාස 20ක කාලයක් තුළ පිරිනැමීමට මේ වනවිට පියවර ගෙන ඇත.

**1.3.2 වගුව : පාසල් දරුවන් සඳහා පිරිනමන ශිෂ්‍යත්ව පිළිබඳ තොරතුරු - 2018**

| ලබා දෙන ශිෂ්‍යත්වය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|
| සුහග ශිෂ්‍යත්ව - 2017 | 1,000 |
| 2017 පහ ශ්‍රේණි ශිෂ්‍යත්වධාරීන් සඳහා ශිෂ්‍යාධාර ලබා දීම | 130,000 |
| මහත්මා ගාන්ධි ශිෂ්‍යත්ව | 150 |
| තාක්ෂණවේදය ශිෂ්‍යත්ව | 1,000 |
| සුජාත දියණි ශිෂ්‍යත්ව | |

- **සුරක්ෂා සිසු රක්ෂණාවරණ වැඩසටහන**

  - ශ්‍රී ලංකාවේ රජයේ පාසල්,පෞද්ගලික හා ජාත්‍යන්තර පාසල්, පිරිවෙන් ඇතුළු පාසල් 11,242ක ශිෂ්‍යයන් ලක්ෂ 45කට සමාන ප්‍රතිලාභ හිමිවන සේ මෙම වැඩ සටහන 2017 වසරේ සිට ක්‍රියාත්මක ව ඇත.
  - මේ යටතේ සෞඛ්‍ය රක්ෂණාවරණය, හදිසි අනතුරු ආවරණය හා රෝහල්වලින් ප්‍රතිකාර ලබා ගැනීමේ දී විශේෂ ප්‍රසාද දීමනා යටතේ ගාස්තු අඩු කිරීම යන ක්ෂේත්‍ර තුන ඔස්සේ ශිෂ්‍යයින්ට ප්‍රතිලාභ හිමි වේ.
  - 2019 වර්ෂයේ සිට මෙම වැඩසටහන මඟින් ලබාදෙන ප්‍රතිලාභ තවදුරටත් පුළුල් කිරීමට අදාළ රක්ෂණ ආයතනය හා අධ්‍යාපන අමාත්‍යාංශය එක්ව පියවර ගෙන ඇත.
  - සුරක්ෂා විශේෂ අරමුදල 2018.07.30 වන දින පිහිටුවන ලද අතර ඒ යටතේ ලක්ෂ දෙකකට වැඩි වියදමක් දැරීමට සිදු වන රෝගාබාධ සැත්කම් ආදී ප්‍රතිකාර 18ක් සඳහා රු.ලක්ෂයේ සිට ලක්ෂ 10 දක්වා මූල්‍යාධාරයක් ලබාදීමට පියවර ගෙන ඇත.



සුරක්ෂා සිසු රක්ෂණ වැඩසටහනේ සමාරම්භය



සුරක්ෂා විශේෂ අරමුදල පිහිටුවීම සඳහා අත්සන් තැබීම

## 1.4 පාසල් පද්ධතිය තුළ සුරක්ෂිත හා ආකර්ෂණීය ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම

### 1.4.1 පාසල්වලට මූලික පහසුකම් හා උසස් මට්ටමේ ඉගෙනුම් පහසුකම් සැපයීම.
### ළඟම පාසල හොඳම පාසල වැඩසටහන

2016 වර්ෂයේ සිට දේශීය ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වන ළඟම පාසල හොඳම පාසල වැඩසටහන හරහා දිවයින පුරා පාසල් 9,064ක් ආවරණය වන සේ ව්‍යාපෘති 09ක් මගින් මූලික පහසුකම් සැපයීමේ හා උසස් ඉගෙනුම් අවස්ථා සඳහා පහසුකම් සැපයීමේ ක්‍රියාකාරකම් 13,087ක් පමණ ආරම්භ කර 2018 වන විට ඉන් 9,549ක් පමණ නිම කරන ලදී.

**1.4.1 වගුව - ළඟම පාසල හොඳම පාසල වැඩසටහන යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති**

| | ව්‍යාපෘතිය | 2018.12.31 දින වන විට දරණ ලද මුළු වියදම (රු.මිලි. ) |
|---|---|---|
| A | එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට අවම වශයෙන් පාසල් 2ක් වන සේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකින් ම තෝරා ගත් පාසල් 600ක් පමණ අංග සම්පූර්ණ ලෙස සංවර්ධනය කිරීම. | 23,358.75 |
| B | මෑත කාලීනව කිසිදු ව්‍යාපෘතියකට අයත් නොවූ අ.පො.ස.(උ.පෙළ.) සහිත පාසල් 1,360ක් පමණ සංවර්ධනය කිරීම. | |
| C | ද්විතියික පාසල් 1,000ක් සංවර්ධනය කිරීම වැඩසටහනට අයත් වූ පාසල් සංවර්ධනය | |
| D | ප්‍රාථමික පාසල් 3,600ක් සංවර්ධනය කිරීම. | 6,431.38 |
| E | ග්‍රාමීය හා දුෂ්කර ප්‍රදේශවලට ප්‍රමුඛත්වය දෙමින් පාසල්වලට විදුහල්පති නිල නිවාස, විවේක කාමර ආදී පහසුකම් ලබාදීම. | 1,001.60 |
| F | සියලු ම පාසල්වලට ජල හා වැඩි දියුණු කළ සනීපාරක්ෂක පහසුකම් ප්‍රමාණවත් පරිදි ලබා දීම දිවයිනේ සෑම පාසලකට ම ජලය හා සනීපාරක්ෂක පහසුකම් ලබා දීම. | 6,580.53 |
| G | සියලු ම පාසල්වලට විදුලිය ලබා දීම, සෑම පාසලකට ම ජාතික විදුලි පද්ධතිය හරහා හෝ සූර්ය බලය මගින් විදුලිය ලබා දීම. | 1,350.80 |
| H | වතුකරයේ පාසල් 25ක් ද්විතීයික මට්ටමට උසස් කර උසස් පෙළ විද්‍යා අධ්‍යාපනය සඳහා පහසුකම් වැඩි දියුණු කිරීම. | 341.376 |
| J | පාසල්වල දන්ත සෞඛ්‍ය පහසුකම් වැඩි දියුණු කිරීම. | 189.08 |
| | **එකතුව** | **39,253.52** |





ව/නික රජබිම විද්‍යාලයේ පන්ති කාමර සහිත බහුකාර්ය ගොඩනැගිල්ල විවෘත කිරීම

1.4.2 වගුව ළඟම පාසල හොඳම පාසල වැඩසටහන යටතේ පාසල්වලට ලබා දී ඇති භෞතික සම්පත්

| ලබා දී ඇති භෞතික සම්පත් පිළිබඳ විස්තර | ආරම්භ කරන ලද සංඛ්‍යාව (2016-2018) | 2018.12.31 දිනට අවසන් කර ඇති සංඛ්‍යාව |
|---|---|---|
| නව ඉදි කිරීම් | | |
| පන්ති කාමර ගොඩනැඟිලි | 281 | 159 |
| ගුරු නිවාස | 329 | 202 |
| විදුහල්පති නිවාස | 167 | 58 |
| පාසල් ආපනශාලා | 62 | 13 |
| ක්‍රීඩා සංකීර්ණ | 13 | 0 |
| කනිෂ්ඨ විද්‍යාගාර | 234 | 90 |
| සෞන්දර්ය ඒකක | 30 | 16 |
| ප්‍රාථමික ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථාන | 758 | 455 |
| තාක්ෂණ ගොඩනැගිලි | 236 | 92 |
| පාසල් දන්ත සායන | 17 | 10 |
| වතු පාසල් ගොඩනැගිලි | 07 | 04 |
| අලුත්වැඩියා හා නවීකරණයන් | | |
| ගොඩනැගිලි අලුත්වැඩියා (සුළු) | 3,794 | 3,388 |
| ගොඩනැගිලි අලුත්වැඩියා (විශාල) | 234 | 172 |
| පාසල් දන්ත සායන අලුත්වැඩියා | 99 | 69 |
| වතු පාසල් ගොඩනැගිලි | 16 | 10 |
| මූලික පහසුකම් සැපයීම්/වැඩි දියුණු කිරීම් | | |
| ජලය | 677 | 472 |
| විදුලිය | 2,573 | 1,803 |
| සනීපාරක්ෂක පහසුකම් | 3,560 | 2,941 |





කණිෂ්ඨ ද්විතියික විද්‍යාගාරය - කු / නාබිරිත්තවැව ම.ම.වි, වයඹ පළාත



සෞන්දර්ය ඒකකය - හතරලියද්ද ම.ම.වි ,මධ්‍යම පළාත



තාක්ෂණ ගොඩනැගිල්ල - කුලි/ඇතුන්ගහකොටුව ම.ම.වි,



ආපනශාලාව - ගලගෙදර ම.ම.වි,
මධ්‍යම පළාත



ප්‍රාථමික ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානය - හලා/වලහපිටිය ම.වි.
වයඹ පළාත



ගුරු නිවාසය - ර/උඩවෙල ම.වි ,
සබරගමුව පළාත



පන්ති කාමර ගොඩනැගිල්ල - පො/ නාගලකන්ද ම.වි
උතුරු මැද පළාත



ප්‍රාථමික ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානය - පුතුනගර් .ම.වි
නැගෙනහිර පළාත



දන්ත සායන ඒකකය - පො/ගිරිතලේගම .ම.වි.
උතුරු මැද පළාත

## 1.4.2 පාසල් පද්ධතිය තුළ සුරක්ෂිත හා ආකර්ෂණීය ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම

**1.4.3 වගුව : අධ්‍යාපන අමාත්‍යාංශයේ වැඩසටහන් යටතේ පාසල්වලට ගොඩනැගිලි පහසුකම් සැපයීමේ සමස්ත ප්‍රගතිය 2015 - 2018** (ළඟ ම පාසල හොඳ ම පාසල ව්‍යාපෘතියේ වැඩසටහන් ද ඇතුළුව)

| | ක්‍රියාකාරකම | ආයෝජනය 2015-2019 (රු.මි.) | 2018 වන විට සමස්ත භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|
| 1 | පාසල් 6,000ක ගොඩනැගිලි අලුත්වැඩියා | 9,970 | 90% |
| 2 | නව පන්ති කාමර 5,600 | 11,200 | 60% |
| 3 | ප්‍රාථමික ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථාන 764 | 8,515 | 85% |
| 4 | තාක්ෂණ පීඨ ගොඩනැගිලි | 10,120 | 90% |
| 5 | තාක්ෂණික විද්‍යාගාර 254 හා තාක්ෂණික උපදේශන ගොඩනැගිලි 261ක් | 14,500 | 65% |
| 6 | නව දන්ත වෛද්‍ය ඒකක 21ක් සහ අලුත්වැඩියා 110ක් | 250 | 75% |
| 7 | වතු පාසල් - ගොඩනැගිලි 46 සහ අලුත්වැඩියා 43 | 690 | 50% |
| 8 | ක්‍රීඩා පාසල් 18 - නැවත නගා සිටුවීමේ කටයුතු | 190 | 75% |
| 9 | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ත්‍රි භාෂා පාසලක් ඉදි කිරීම | 1,250 | 35% |
| 10 | කුරුණෑගල, වාරියපොල, නානුඔය,දකුණු කොළඹ ප්‍රදේශවල ජාතික පාසල් 4ක් ඉදිකිරීම | 4,500 | 20% |
| 11 | වෙනිවැල්කොල විශේෂ අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානයක් ඉදිකිරීම | 300 | 65% |
| 12 | පිරිවෙන් - කාර්යාල ගොඩනැගිලි 40ක් සහ වැසිකිළි 100ක් | 300 | 65% |
| 13 | ගුරු පුහුණු මධ්‍යස්ථාන 39 (දෙමහල්) | 1,365 | 90% |
| 14 | කලාප 13ක තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථාන | 351 | 98% |
| 15 | ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ හා ගුරු පුහුණු විද්‍යාල - නව ඉදිකිරීම් හා අලුත්වැඩියා | 3,850 | 80% |
| 16 | 13 වසරක සහතික කළ අධ්‍යාපනය සඳහා පන්ති කාමර - පාසල් 857 (අදියර l – 42, අදියර ll -153, අදියර lll -662) | 3,500 | අදියර l - 100%<br>අදියර ll - 85%<br>අදියර lll - 20% |
| 17 | ජාතික පුස්තකාලය වැඩි දියුණු කිරීම | 100 | 35% |

## 1.4.3 ආපදා කළමනාකරණය

### ආපදා තත්වයෙන් පරිහානියට පත් පාසල් ප්‍රතිසංස්කරණය

ගං වතුරින් හානියට පත්වූ පාසල් ප්‍රතිසංස්කරණය සඳහා වන වැඩසටහන 2017-2018 වර්ෂ වල ක්‍රියාත්මක කරන ලදී.2018 වර්ෂයේදී බස්නාහිර, දකුණ හා සබරගමුව පළාත් තුනෙහි වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 900ක් වෙන්ව ඇත. එම පළාත් තුනේ දිස්ත්‍රික් ලේකම් කාර්යයාල සම්බන්ධ කර ගනිමින් හානියට පත් පාසල් ප්‍රතිසංස්කරණය කිරීම මේ යටතේ සිදුකරේ.බස්නාහිර පළාතෙන් පාසල් 36ක් ද සබරගමුව පළාතෙන් පාසල් 58ක් ද දකුණු පළාතෙන් පාසල් 164ක් ද ලෙස ප්‍රතිසංස්කරණය කෙරෙන මුළු පාසල් සංඛ්‍යාව 258කි.

### පාසල් අපදා කළමනාකරණ වැඩසටහන

- පාසල් ආපදා කළමනාකරණ වැඩ සටහන යටතේ ආපදා කළමනාකරණය පිළිබඳ ව නිලධාරීන් 80ක් හා ගුරුවරු 75ක් දැනුවත් කිරීමට පියවර ගන්නා ලදී.

## 1.5 පාසල් ශිෂ්‍යයින්ගේ සෞඛ්‍ය හා පෝෂණ තත්වය ඉහළ නැංවීම

### 1.5.1 පාසල් සෞඛ්‍ය හා පෝෂණ වැඩසටහන

| වැඩසටහන | 2018 ප්‍රගතිය | | 2019 සඳහා අපේක්ෂිත ඉලක්ක |
|---|---|---|---|
| | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වියදම රු.මි. | |
| පාසල් ළමුන් සඳහා දිවා ආහාර ලබා දීම | සිසුන් 1,096,906 | 5,453 | සිසුන් 1,200,000 |
| පාසල් ළමුන් සඳහා කිරි වීදුරුවක් ලබා දීම | සිසුන් 242,251 | 486 | සිසුන් 650,000 |
| පාසල් සඳහා සනීපාරක්ෂක පහසුකම් ලබා දීම | පාසල් 1,805* | 352 | පාසල් 680 |
| පාසල් සඳහා ජල පහසුකම් ලබා දීම | පාසල් 139* | 59 | |
| පාසල් සඳහා දන්ත සායන ලබා දීම | අලුත්වැඩියා - පාසල් 75<br>නව ඉදිකිරීම් - පාසල් 8 | 68 | පාසල් 20 |
| ජාතික පාසල් සඳහා සනීපාරක්ෂණ නඩත්තු ප්‍රදාන ලබා දීම | පාසල් 354 | 100 | |

* ළඟම පාසල හොඳ ම පාසල වැඩසටහන යටතේ ක්‍රියාත්මක පාසල් සංඛ්‍යාව හැර.

| පාසල් සෞඛ්‍ය හා පෝෂණ වැඩසටහන යටතේ සිදුකළ මානව සම්පත් සංවර්ධන ක්‍රියාකාරකම් | |
|---|---|
| වැඩසටහන | 2018 වර්ෂය තුළ සිදු කළ ක්‍රියාකාරකම් |
| මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන | පුහුණුකරුවන් 60ක් , ගුරුවරුන් 947ක් හා විද්‍යාපීඨ ගුරු අභ්‍යාසලාභීන් පුහුණු කිරීම |
| ප්‍රජනන සෞඛ්‍ය වැඩසටහන | පුහුණුකරුවන් 106 ක් , ගුරුවරුන් 855ක් පුහුණු කිරීම. මහජන සෞඛ්‍ය උපදෙස් පොත් සැකසීම. |
| ප්‍රථමාධාර වැඩසටහන | පුහුණුකරුවන් 976 දෙනෙකු පුහුණු කිරීම |
| පෝෂණ වැඩසටහන | නිලධාරීන් 3,725දෙනෙක් දැනුවත් කිරීම |
| සෞඛ්‍ය ප්‍රවර්ධන හා ඩෙංගු දැනුවත් කිරීමේ වැඩසටහන | විදුහල්පතිවරුන් හා ගුරුවරුන් 6,475ක් දැනුවත් කිරීම |
| මානසික සෞඛ්‍ය වැඩසටහන | අත්පොත් සැකසීම |
| ගර්භනී ගුරුවරියන්ට නිල ඇඳුමක් හඳුන්වාදීම | |



නව පාසල් දන්ත සායන ඒකකය
පහල ගිරිබාව ම.වි. ගල්ගමුව, වයඹ පළාත



නව සනීපාරක්ෂක පහසුකම් පද්ධතිය
කොග්ගල්ල ම.වි. හම්බන්තොට, දකුණු පළාත

## 1.6 විධිමත් වෘත්තීය මාර්ගෝපදේශ හා උපදේශන වැඩසටහන් ක්‍රියාවට නැංවීම

### 1.6.1 පාසල් වෘත්තීය මාර්ගෝපදේශ හා උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

- වෘත්තීය මාර්ගෝපදේශ හා උපදේශන වැඩසටහන් සම්බන්ධයෙන් විදුහල්පතිවරුන් 770ක් දැනුවත් කිරීමට පියවර ගනු ලැබිණි.
- ළඟම පාසල හොඳ ම පාසල ව්‍යාපෘතියට අයත් පාසල්වල උපදේශන ඒකක සංවර්ධනය සඳහා ගුරු උපදේශකවරුන් හා ගුරුවරුන් පුහුණු කිරීමේ සැසි පවත්වන ලදී.
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිටු දැකීම සඳහා පාසල් සිසුන් දැනුවත් කිරීමට සඳහා මොඩියුලයක් සකස් කිරීමට පියවර ගෙන ඇත.
- මනෝ සාමාජීය නිපුනතා හා මෘදු කුසලතා සංවර්ධනය සඳහා ගුරු අත්පොතක් සකස් කරන ලදී.
- තිරසර පාසල් වැඩසටහන යටතේ “දරුවන් සුරකිමු” ළමා ආරක්ෂාව පිළිබඳ දෙදින පාසල් උපදේශන වැඩසටහන් 4ක් පවත්වන ලදී.
- මානසික ප්‍රථමාධාර පිළිබඳව ජාතික මට්ටමේ පුහුණුකරුවන් 115 දෙනෙක් ද පරිගණක ප්‍රජානන චර්යා ප්‍රතිකාර වැඩසටහන සඳහා නිලධාරීන් 15 දෙනෙක් ද පුහුණු කරන ලදී.

### 19+ අධ්‍යාපනික රැකියා වෙළඳ ප්‍රදර්ශනය

දිනෙන් දින වෙනස්වන ශ්‍රම වෙළඳපොළ නව ප්‍රවනතා හා උසස් අධ්‍යාපනික අවස්ථා පිළිබඳ පාසල් සිසුන්, තරුණ තරුණියන් හා වෘත්තිකයින් ඇතුළු ප්‍රජාව දැනුවත් කිරීමේ මෙන්ම වෘත්තීය අවස්ථා සම්පාදනය කිරීමේ ආරම්භක පියවර වශයෙන් අ.පො.ස. (උසස් පෙළ) සිසුන් ඉලක්ක කර ගනිමින් ජාතික මට්ටමේ වැඩසටහනක් ලෙස “19+ ජයග්‍රාහී මාවතක් කරා...”අධ්‍යාපනික රැකියා වෙළඳ ප්‍රදර්ශනය දීප ව්‍යාප්තව පැවත්වීමට අධ්‍යාපන අමාත්‍යාංශය කටයුතු යොදා ඇත. පළමු ප්‍රදර්ශනය 2018.10.03 දින සිට 2018.10.07 දක්වා කුලියාපිටිය මධ්‍ය මහා විද්‍යාලයේ දී පැවැත්විණි.

මෙම ප්‍රදර්ශනයේ දී විවිධ අධ්‍යාපනික මට්ටම් සපුරා ඇති ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට තම හැකියාවන්ට හා ලැදියාවන්ට අනුව එම ආයතන හා සම්බන්ධ වෙමින් වෘත්තිය මාර්ගෝපදේශකයන් වෙත යොමුවීම සහ උසස් අධ්‍යාපනික ප්‍රවේශයන් සඳහා මඟපෙන්වීම විවිධ රාජ්‍ය, අර්ධ රාජ්‍ය හා පෞද්ගලික ආයතන සම්බන්ධ කරගනිමින් සිදු කරන ලදී.






19+ ප්‍රදර්ශනයට සහභාගී වූ සිසුන් පිරිසක්



# 02.

# අධ්‍යාපනයේ ගුණාත්මක බව ඉහළ නැංවීම

## 2.1 ජාතික විෂයමාලාව විවිධාංගීකරණය හා නවීකරණය කිරීම

### 2.1.1 ජාතික විෂයමාලාව විවිධාංගීකරණය හා නවීකරණය

විෂයමාලා ප්‍රතිපත්තියට අනුව සෑම වසර 8කටම වරක් විෂයමාලා සංශෝධනයක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් සිදු කරනු ලැබේ. 2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීම ආරම්භ වූ නව විෂයමාලාව යටතේ 2018 වර්ෂයේ දී 3 ශ්‍රේණියට හා 13 ශ්‍රේණියට අදාළ නව විෂයමාලා ක්‍රියාත්මක කරන ලදී. එමෙන්ම අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යතේ 2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරන ලද අ.පො.ස.(උ.පෙ) වෘත්තීය විෂයය ධාරාව සඳහා පළමුවරට වෘත්තීය විෂයයන් 26ක් හඳුන්වා දීමට විෂයමාලා සකස් කරන ලදී. විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු හා ගණිත (STEM) අධ්‍යාපනය නැංවීම සඳහා යෝජනාමාලාවක් සකස් කර ජාතික අධ්‍යාපන කොමිසම වෙත ඉදිරිපත් කිීමට කටයුතු කර ඇත.

### 2.1.2 ජාතික අධ්‍යාපන ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීම

විෂය මාලා සැකසීම හා සංවර්ධනය කිරීම, ගුරු අධ්‍යාපනය, අධ්‍යාපන ක්ෂේත්‍රයේ වෘත්තීය සංවර්ධනය, විෂය නිර්දේශ හා ගුරු මාර්ගෝපදේශ සැකසීම ආදී අංශ වලින් ජාතික අධ්‍යාපන ආයතනයට පැවරී ඇති වගකීම් රාශිය ඉටුකිරීම සඳහා නවීකරණයන්ට ගැලපෙන ලෙස ජාතික අධ්‍යාපන ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීම මෙම අයවැය යෝජනාව යටතේ අපේක්ෂා කෙරේ. මෙම ප්‍රතිව්‍යුහගතකරණය සම්බන්ධ විස්තරාත්මක යෝජනාවලියක් ඉදිරිපත් කිරීමට විද්වතුන් 14 දෙනෙකුගෙන් යුක්ත විද්වත් කමිටුවක් පත්කරන ලදුව එම වාර්තාව මේ වනවිට අධ්‍යාපන අමාත්‍යාංශයට ලැබී ඇත.

## 2.2 කුසලතා පිරි මානව සම්පතක් නිර්මාණය කිරීම සඳහා විද්‍යා, තාක්ෂණ, ගණිත සහ ඉංග්‍රීසි යන ක්ෂේත්‍රයන් හි අධ්‍යාපනය සංවර්ධනය

### 2.2.1 ගණිත අධ්‍යාපනය සංවර්ධනය

- සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය (ලෝක බැංකු යටතේ) තෝරා ගත් පාසල් 1,000ක් පාදක කර ගනිමින් 2019 - 2022 සැලසුම් කර ඇති ගණිත ගුරු නිපුණතා සහ සිසු සාධන මට්ටම් ඉහළ නැංවීමේ වැඩසටහන පාසල් 50ක මෙම වසරේ ආරම්භ කරන ලදී.
- ක්‍රියාකාරකම් පාදකව ගණිතය ඉගැන්වීම ප්‍රවර්ධනය සඳහා 6 හා 7 ශ්‍රේණි ගණිත විෂයමාලාවට අදාළව හඳුනා ගත් උපකරණ මිල දී ගැනීමට එක් පාසලකට රු.40,000 බැගින් නිර්ණායක මත තෝරා ගත් පාසල් 215කට ප්‍රතිපාදන ලබා දී ඇත.
- තෝරා ගත් ගණිතාගාර 86ක් නව තාක්ෂණ මෙවලම් සහිත ගණිත විත්‍රාගාර (Math Learning Studio) ලෙස උසස් කිරීමට අවශ්‍ය කටයුතු සිදුවෙමින් පවතී.
- ආසියානු සංවර්ධන බැංකු තාක්ෂණ සහයෝගීතාවය යටතේ "Teacher delivery "හා "පන්ති කාමර නිරීක්ෂණ උපකරණ" පිළිබඳ ව නිලධාරීන් 108ක් පුහුණු කර තවත් 140ක් පුහුණු කිරීම අරඹා ඇත.
- ගණිත අධ්‍යාපනයේ ගුණාත්මකබව දියුණු කිරීම සඳහා මෙහෙයුම් කමිටු රැස්වීම් 4ක් හා උපදේශන කමිටු රැස්වීම් 3ක් පවත්වා අදහස් ලබා ගන්නා ලදී.
- 2018 සමස්ත ලංකා ගණිත තරගාවලිය පවත්වන ලද අතර සුහග සිසුන් සඳහා ක්‍රියාත්මක වන අන්තර්ජාතික ගණිත ඔලිම්පියාඩ් තරඟාවලිය හා අන්තර්ජාතික ගණිත හා විද්‍යා තරඟාවලිය සඳහා ලාංකීක දරුවන් සහභාගි කරවීමට කටයුතු කරන ලදී. මෙවර ඔලිම්පියාඩ් තරඟාවලියෙන් රිදී පදක්කම් 05ක් ලෝකඩ පදක්කම් 18ක් ඇතුළු ජයග්‍රහණ රැසක් ලබා ගැනීමට ලාංකික සිසුන්ට හැකි විය.
- බහුතල ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සහ පෙර ඉගෙනුම් පන්ති කාමර සඳහා විෂය අන්තර්ගත සකස් කිරීමේ වැඩසටහන කලාප දෙකක නියාමක මට්ටමින් ක්‍රියාත්මක කරන ලදී.
- වතු පාසල්වල හා උතුරු නැගෙනහිර ප්‍රතිඵල අඩු දෙමළ මාධ්‍ය පාසල් සඳහා විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී.
- ජේ.ඊ.ජයසූරිය ජන්ම දිනය නිමිති කර ගෙන ජ්‍යාමිතිය ඉගැන්වීම පිළිබඳ කථිකාවතක් පවත්වන ලදී.

- ගණිත විෂය භාර නිලධාරීන් 50ක් සඳහා සිංගප්පූරුවේ වෘත්තීය පුහුණුවක් ලබා දීම, නිලධාරීන් 40ක් විද්‍යාපති පාඨමාලාවට යොමු කිරීම, ගණිත පත්වීම් නොලැබ ගණිතය උගන්වන ගුරුවරුන් 100ක් සඳහා සහතික පත්‍ර පාඨමාලාව පැවැත්වීම ඇතුළු ධාරිතා සංවර්ධන වැඩසටහන් රැසක් ක්‍රියාවට නංවන ලදී.
- ශිෂ්‍ය සාධනය නැංවීම සඳහා ශිෂ්‍ය කඳවුරු 13ක් හා කඩිනම් ඉගෙනුම් වැඩසටහන් 6ක් පවත්වන ලදී.
- ගණිත විෂය ප්‍රායෝගික භාවිතය හා බද්ධව ඉගැන්වීම සඳහා " Flipped Classroom" වැඩසටහන සඳහා අන්තර්ගත සංවර්ධනය, Math lab සඳහා අන්තර් ක්‍රියාකාරී e-මාර්ගෝපදේශය සකස් කිරීම සිදු කරන ලදී.
- 'Working Mathematically" වැඩසටහන සඳහා විෂය අන්තර්ගතය සකස් කිරීමට වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.
- ගණිත විෂය සම්බන්ධ ක්‍රියා මූලික පර්යේෂණ ප්‍රචලිත කිරීම සඳහා වැඩසටහන් 3ක් පවත්වන ලදී.




ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරෙන් ගණිතය ඉගැන්වීම

## 2.2.2 විද්‍යා අධ්‍යාපනය වැඩි දියුණු කිරීම

- විද්‍යා අධ්‍යාපනය තවදුරටත් ප්‍රචලිත කරමින් STEM (Science, Technology Engineering and Mathematics ) අධ්‍යාපනය පුළුල් සමෝධානිත ක්‍රමවේදයක් ඔස්සේ ප්‍රායෝගික ජීවන අත්දැකීම් හා බද්ධ කර ඉගැන්වීම සහ කලා සහ සාහිත්‍ය විෂයයන් ද බද්ධ කරමින් විෂය ධාරා විවිධාංගීකරණය කිරීම අරමුණු කර ගත් ප්‍රතිපත්ති රාමුවක් විද්වත් කමිටුවකගේ සහභාගිත්වයෙන් සකස් කර ජාතික අධ්‍යාපන කොමිසම වෙත ඉදිරිපත් කර ඇත.
- STEM අධ්‍යාපනය පිළිබඳ දැනුවත් කිරීම යටතේ නිලධාරීන් හා ගුරු උපදේශකවරුන් 380ක් සඳහා වැඩමුළු පවත්වන ලදී.
- STEM සංකල්පය ප්‍රචලිත කිරීමේ හා එම විෂයයන් ඉගැන්වීමේ කුසලතා වැඩිදියුණු කිරීමේ අරමුණින් පළාත් මට්ටමින් 6 - 11 ශ්‍රේණිවල ගුරුවරු 1,000ක් පුහුණු කිරීම ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ ද සහාය ඇතිව සිදු කරන ලදී.
- දොම්පේ විද්‍යා ක්ෂේත්‍ර අධ්‍යයන මධ්‍යස්ථානය STEM අධ්‍යාපන ජාතික සම්පත් මධ්‍යස්ථානය ලෙස සංවර්ධනය කිරීමට ද ජාතික අධ්‍යාපන ආයතනයේ විද්‍යාගාර පහසුකම් රොබෝ තාක්ෂණය හා ජාන තාක්ෂණය වැනි නව ක්ෂේත්‍රයන්හි පර්යේෂණ සිදු කළ හැකි පරිදි සංවර්ධනය කිරීමට ද පියවර ගෙන ඇත.
- විද්‍යා විෂයභාර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා ගුරු උපදේශකවරුන් 100ක් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පවත්වන ලදී.
- ජංගම විද්‍යාගාර පිළිබඳ ව විදුහල්පතිවරුන්, ගුරු උපදේශකවරුන් හා ගුරුවරුන් 2,100ක් දැනුවත් කරන ලදී.
- විද්‍යා ක්ෂේත්‍ර අධ්‍යාපන මධ්‍යස්ථාන කළමනාකරුවන් 25ක් පුහුණු කරන ලදී.
- අ.පො.ස.(උ.පෙ) විද්‍යා ගුරුවරුන් සඳහා වැඩසටහන් 44ක්, අ.පො.ස.(සා.පෙ) විද්‍යා ගුරුවරුන් සඳහා වැඩසටහන් 75ක් සහ 2 වර්ගයේ විද්‍යා ගුරුවරුන් සඳහා වැඩසටහන් 103ක් පළාත් මට්ටමින් ක්‍රියාත්මක කරන ලදී.

- විද්‍යාත්මක පර්යේෂණ පිළිබඳ ගුරු සිසු දෙපිරිස දැනුවත් කිරීමේ වැඩමුළු 101ක් හා විෂය සංවර්ධන ක්‍රියාකාරකම් පිළිබඳ වැඩමුළු 121ක් ක්‍රියාවට නංවන ලදී.
- විද්‍යා ක්ෂේත්‍ර අධ්‍යාපන මධ්‍යස්ථාන 6ක් හා එක් ව පාසල් සිසුන් සඳහා පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.
- සණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ වැඩසටහන යටතේ මේ වන විට පාසල් 200ක් සම්පූර්ණයෙන්ම කසල රහිත කිරීමට අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.
- 2018 සර්බියාවේ පැවති අන්තර්ජාතික තරුණ විද්‍යාඥයා තරගාවලිය සඳහා සිසුන් දෙදෙනෙකු ඉදිරිපත් කරන ලද අතර රන් පදක්කම් 2ක් හා ලෝකඩ පදක්කම් 2ක් එම සිසුහු දිනා ගැනීමට සමත් වූහ.
- චීනයේ පැවති ජාත්‍යන්තර ගණිත හා විද්‍යා ඔලිම්පියාඩ් තරගාවලියට සිසුන් 6 දෙනෙකු ඉදිරිපත් කරන ලද අතර රිදී පදක්කම් 1ක් හා ලෝකඩ පදක්කම් 5ක් එම සිසුහු දිනා ගත්හ.



න්‍යෂ්ටික විද්‍යාව පිළිබඳ ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහනක්


පාසල් 3000කට ලබා දුන් ජංගම විද්‍යාගාර කට්ටල

## 2.2.3 ඉංග්‍රීසි හා විදේශ භාෂා අධ්‍යාපනය සංවර්ධනය

- අධ්‍යාපන අමාත්‍යාංශය හා බ්‍රිතාන්‍ය කවුන්සලය එක්ව ක්‍රියාත්මක කරන Improving Teacher Education in Sri Lanka ( iTESL) ව්‍යාපෘතිය යටතේ ගුරු උපදේශකවරුන් 403ක් ගුරු අධ්‍යාපන සේවයේ නිලධාරින් 153ක් සහ විදුහල්පතිවරුන් 825ක් පුහුණු කිරීමට මෙම වසරේ කටයුතු කරන ලදී.
- ප්‍රාථමික ඉංග්‍රීසි සඳහා ආරම්භ කෙරෙන e-පෙළපොත හඳුන්වාදීම මෙම වසරේ දී සිදු කළ අතර 2019 වසරේදී 6 ශ්‍රේණියේ සිට ඉදිරියට e-පෙළපොත් හඳුන්වා දීමේ කටයුතු සිදු කෙරේ.
- තෝරාගත් ගුරුභවතුන්, ගුරු උපදේශකවරුන් හා නිලධාරීන් 10 දෙනෙකුට දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම සම්බන්ධ පශ්චාත් උපාධිය හැදෑරිමට මූල්‍ය අනුග්‍රහය ලබා දී ඇත.
- පළමු ප්‍රධාන අවධියේ ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි සඳහා ප්‍රාථමික හා ඉංග්‍රීසි ගුරුභවතුන් වෙනුවෙන් ගුරු අත්පොත සකස් කළ අතර දෙවන ප්‍රධාන අවධියේ කථන හා ශ්‍රවන වැඩසටහන පිළිබඳ ගුරු අත්පොත 2019 වසරේ සකස් කිරීමට සැලසුම් කර ඇත.
- ගුරු භවතුන් සඳහා Task Based Language Technology සම්බන්ධ වැඩමුළු පවත්වන ලදී.
- පාසල්වල ඉංග්‍රිසි ඉගැන්වීම සඳහා ඇමරිකානු ස්වේච්ඡා නිලධාරීන්ගේ (Peace Corps) සහාය ලබා ගැනීමට එම සංවිධානය සමඟ ගිවිසුමක් අත්සන් කරන ලදී.
- ප්‍රාදේශිය ඉංග්‍රිසි උපකාරක මධ්‍යස්ථාන (RESC) 30ක් සඳහා මූල්‍ය සහාය ලබා දෙන ලද අතර මඩකලපුව හා බද්දේගම මධ්‍යස්ථාන සඳහා නව ගොඩනැගිලි ඉදි කිරීම සිදු වේ.
- සිසුන් 300ක සහභාගිත්වයෙන් ඉංග්‍රිසි කඳවුරු පැවැත්වීමට කටයුතු කරන ලද අතර සමස්ත


Peace Corps සංවිධානය සමග ගිවිසුම් අත්සන් තැබීම

ලංකා ඉංග්‍රීසි භාෂා හා නාට්‍ය තරඟ පවත්වා සිසුන්ගේ ඉංග්‍රීසි කුසලතා වැඩි දියුණු කිරීමට පියවර ගෙන ඇත.

- ඉංග්‍රීසි භාෂාවේ නිපුණතාවය ඉහළ නැංවීම සඳහා ක්‍රියාකාරකම් සංවිධානයට අදාළව (English Language Learning Enhancement - ELLE ) අත්පොත මුද්‍රණය කරන ලදී.

- විදේශ භාෂා ඉගැන්වීම සවිමත් කිරීම යටතේ ප්‍රංශ භාෂාව ඉගැන්වීමට ගුරුවරුන් 70ක් පුහුණු කරන ලදී.


- 2019 වසරේදී ඉංග්‍රීසි භාෂාව සම්බන්ධව අග්‍රගණ්‍ය මධ්‍යස්ථානයක් පිහිටුවීමට කටයුතු කරන අතර සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ (GEM) ව්‍යාපෘතිය යටතේ පාසල් 150ක ඉංග්‍රීසි භාෂාව සම්බන්ධ විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

## 2.2.4 තාක්ෂණ අධ්‍යාපන සංවර්ධනය

### අ.පො.ස.(උ.පෙළ) තාක්ෂණවේදය සහ අ.පො.ස.(සා.පෙළ) තාක්ෂණ විෂයයන්

- අ.පො.ස.(උ.පෙළ) තාක්ෂණවේදය විෂය ධාරාව හා තාක්ෂණ අධ්‍යාපනය පිළිබඳ දැනුවත් කිරීම සඳහා නිකවැරටිය යොවුන් පුරයේ දී හා මොණරාගල Enterprise Sri Lanka ප්‍රදර්ශනයේ දි වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.
- රොබෝ තාක්ෂණය පිළිබඳ පාසල් සිසුන් දැනුවත් කිරීම සඳහා මොඩියුල සකස්කර ප්‍රායෝගික පුහුණු වැඩමුළු 17ක් පවත්වන ලදී. ගුරු භවතුන් 107ක්, සිසුන් 238ක් හා සම්පත් පුද්ගලයින් 152ක් මේ සඳහා සහභාගී වූහ.

- අ.පො.ස. (උ.පෙළ) තාක්ෂණ විෂය ධාරාව ඇගයීම සඳහා නිර්ණායක සැකසීම සම්පත් පුද්ගලයින් හා ගුරු භවතුන් 176ක ගේ සහභාගීත්වයෙන් සිදු කරන ලදී.




රොබෝ තාක්ෂණය පිළිබඳ ව ශිෂ්‍යයින් සඳහා පැවති වැඩමුළු

### ගෘහ ආර්ථික විද්‍යාව

- ගෘහ ආර්ථික විද්‍යාව විෂයය සංවර්ධන වැඩමුළු 18ක් ගුරුභවතුන් 330ක ගේ ගුරු උපදේශකවරුන් 98ක ගේ, සිසුන් 2,073ක ගේ හා සම්පත් පුද්ගලයින් 166ක ගේ සහභාගීත්වයෙන් පැවැත්විණි.

- Marina Master Chef සමස්ත ලංකා ඉවුම් පිහුම් තරඟාවලිය පළාත් මට්ටමේ සිට ළමුන් 2,160ක ගේ සහභාගීත්වයෙන් අවසන් මහා තරඟාවලිය දක්වා පවත්වා ත්‍යාග ප්‍රදානය සිදු කළ අතර ගෘහ විද්‍යා දැනුම මිනුම තරගයක් ද පැවැත්වීමට කටයුතු කරන ලදී.
- ගෘහ ආර්ථික විද්‍යා ගුරුවරුන්ට තොරතුරු තාක්ෂණ පුහුණුව ලබාදීම සඳහා මොඩියුලයක් සකස් කර ගුරුවරුන් 293ක් පුහුණු කරන ලදී.

- පාසල් 50ක් සඳහා ගෘහ විද්‍යුත් උපකරණ ලබා දීමට කටයුතු කරන ලදී.

- 2019 වර්ෂය සඳහා පාසල් 200කට ගෘහ ආර්ථික විද්‍යා විෂය උපකරණ බෙදා හැරීම, පාසල් 2,000ක ගෘහ විද්‍යා ඒකක වලට පරිගණක යන්ත්‍රය බැගින් ලබාදීම සහ පාසල් 300ක ගෘහ විද්‍යාගාර අලුත්වැඩියාව සැලසුම් කර ඇත.




මාස්ටර් චෙෆ් තරඟාවලියේ අවසන් වටය

## 2.3 සිසුන් තුළ පරිවර්තීය කුසලතා, සමාජ චිත්තවේගකුසලතා, ආචාරධර්ම හා සාරධර්ම ගොඩනැංවීම

### 2.3.1 සිසුන් තුළ පරිවර්තීය කුසලතා, සමාජ චිත්තවේග කුසලතා, ආචාරධර්ම හා සාරධර්ම ගොඩනැංවීම සඳහා විෂයමාලා සංශෝධනය

විෂයමාලා ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව වසර අටකට වරක් විෂයමාලාවේ පූර්ණ සංවර්ධනයක් හෝ සංශෝධනයක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් සිදු කරනු ලබයි.එහි දී විෂයමාලා ක්‍රියාත්මක කිරීම පිළිබඳ අධ්‍යයන, විවිධ කණ්ඩායම් ඉදිරිපත් කරන ධනාත්මක අදහස්, ලෝකයේ වෙනත් රටවල අත්දැකීම් හා නව දැනුම් හා ක්‍රමවේද භාවිතා කෙරේ. එලෙස සංශෝධනය කරන ලද වත්මන් විෂයමාලාව 2015 වසරේ දී 6, 10 ශ්‍රේණිවලට ද 2016 වසරේ දී 1,7,11 ශ්‍රේණිවලට ද 2017 වසරේ දී 2, 8, 12 ශ්‍රේණිවලට ද 2018 වසරේ දී 3, 9, 13 ශ්‍රේණිවලට ද හඳුන්වා දී ක්‍රියාත්මක කෙරේ.

### 2.3.2 ප්‍රාථමික අධ්‍යාපනය සංවර්ධනය

- ප්‍රාථමික ගණිත විෂය ඉගැන්වීම සඳහා ඉගෙනුම් උපකරණ සකස් කිරීම පිළිබඳ ව ප්‍රාථමික අධ්‍යාපන නිලධාරීන් හා ගුරු උපදේශකවරුන් 191කගේ සහභාගිත්වයෙන් වැඩසටහන් පවත්වන ලදී.
- ඉගෙනුම් දුෂ්කරතා සහිත ශිෂ්‍යයින් සඳහා සහාය වන ඉගෙනුම් සහායක ගුරුවරුන් ලෙස ප්‍රාථමික ගුරුවරුන් 135ක් සවිබල ගන්වන ලදී.
- ක්‍රියාකාරකම් කාමරය භාවිතය පිළිබඳ ව ගුරුවරුන් 262කගේ ධාරිතා සංවර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.
- ප්‍රාථමික ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානවල කියවීම් කාමරය භාවිතය පිළිබඳ උපදෙස් සංග්‍රහයක් කෙටුම්පත් කර ඇත.
- ප්‍රාථමික ශ්‍රේණිවල බහුතල ඉගෙනුම් ක්‍රමවේදය පිළිබඳව ගුරුවරුන් 118 දෙනෙකු පුහුණු කරන ලදී.
- පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ අයිතම විශ්ලේෂණය පිළිබඳ ව පළාත් නිලධාරීන් හා ගුරු උපදේශකවරුන් 301ක් දැනුවත් කරන ලදී.
- ප්‍රාථමික අංශයේ උගන්වන ප්‍රාථමික අධ්‍යාපන පුහුණුවක් නොමැති ගුරුවරුන් 3,107ක් පුහුණු කරන ලදී.
- ප්‍රාථමික ගුරුවරුන් 1084කගේ පරිගණක භාවිතා හැකියා වර්ධනය සඳහා වැඩසටහන් පවත්වන ලදී.
- ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට බඳවා ගත් ප්‍රාථමික අධ්‍යාපන නවක නිලධාරීන් 47 දෙනෙකු පුහුණු කරන ලදී.
- ජාතික පාසල් 113ක ප්‍රාථමික අංශ සඳහා ගුණාත්මක යෙදවුම් ලෙස රු.මි.6ක් බෙදා දෙන ලදී.
- 2019 වර්ෂයේ දී ඉහත වැඩසටහන් මෙන්ම ළඟ ම පාසල හොඳ ම පාසල යටතේ ප්‍රාථමික ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථාන ඉදි කළ පාසල්වල ප්‍රාථමික අධ්‍යාපන ගුරුවරුන් සම්පත් පුද්ගලයින් ලෙස සවිබල ගැන්වීමට සැලසුම් කර ඇත.




ප්‍රාථමික ගුරුවරුන් හා ගුරු උපදේශකවරුන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන්

## 2.3.3 ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර අධ්‍යාපනය සංවර්ධනය

- සමස්ත ලංකා සිංහල භාෂා, දෙමළ භාෂා, දෙවන ජාතික භාෂා හා සමාජ විද්‍යා වාර්ෂික තරගාවලීන් පවත්වා නිම කොට ජයග්‍රාහී සිසුන්ට සහතිකපත් හා පදක්කම් ලබාදීමට පියවර ගෙන ඇත.
- සිංහල භාෂාව, දෙමළ භාෂාව, දෙවන ජාතික භාෂාව හා සමාජ විද්‍යා යන සියලුම විෂයයන් ආවරණය වන පරිදි වැඩසටහන් 35ක් පවත්වා විෂයය භාර ගුරුවරුන්, ගුරු උපදේශකවරුන් හා විෂය භාර නිලධාරීන් 1,551 දෙනෙක් පුහුණු කරන ලදී.
- නුවණ සහරාව සහ කුර්මතී සහරාව සකස් කර පිටපත් 3,000 ක් මුද්‍රණය කර බෙදා හැරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී.
- 2019 වර්ෂය සඳහා ඉහත පරිදි වාර්ෂිකව සිදුකෙරෙන ප්‍රධාන වැඩසටහන්වලට අමතරව විෂය සංවර්ධනයට අදාල තීරණ ගැනීම සඳහා දත්ත විශ්ලේෂණයන් සිදු කිරීමට අපේක්ෂා කෙරේ.

## 2.3.4 ද්වි භාෂා අධ්‍යාපන පහසුකම් ඉහළ නැංවීම

- ද්විභාෂා අධ්‍යාපනය පිළිබඳ ධාරිතා සංවර්ධනය යටතේ නිලධාරීන් හා ගුරුවරුන් 40 දෙනෙකු විවෘත විශ්වවිද්‍යාලයේ ද්විභාෂා පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සඳහා යොමු කරන ලදී.
- ඉංග්‍රීසි මාධ්‍යයෙන් උගන්වනු ලබන විෂයයන් සඳහා භාෂාව, ශ්‍රවණය, කථනය හා පන්ති කාමර කළමනාකරණය ඇතුළත් විෂයානුබද්ධ මොඩියුල 8ක් හා පොදු මොඩියුලයක් සකස් කර ලබා දීමට කටයුතු කරන ලදී.
- ද්විභාෂා අධ්‍යාපනයේ නව ඉගෙනුම් ක්‍රමවේද පිළිබඳ ව ද්විභාෂා ගුරුවරුන් 60 දෙනෙකු සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පවත්වන ලදී.
- බ්‍රිතාන්‍ය කවුන්සිලයේ සහයෝගය මත ගුරුවරුන් හා ගුරු උපදේශකවරුන් 30ක ගේ කණ්ඩායමක් 21වන සියවසේ හර කුසලතා පිළිබඳව පුහුණු කරන ලදී.
- ගණිතය, ශාරීරික අධ්‍යාපනය, භූගෝල විද්‍යාව යන විෂයයන් සඳහා අතිරේක ඉගෙනුම් ද්‍රව්‍ය ලෙස අත්පොත්, වීඩියෝ, ආදර්ශ පාඩම් සකස් කර මුද්‍රණය කිරීමට කටයුතු කරන ලදී.
- ද්විභාෂා ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා පුහුණුකරුවන් ලෙස 50 දෙනෙකු පුහුණු කරන ලදී.
- පුරවැසි අධ්‍යයනය, ගණිතය යන විෂයයන් හී ද්විභාෂා අධ්‍යාපනය ආශ්‍රිත ඉගෙනුම් ඵල හඳුනා ගැනීමට කටයුතු කරන ලදී.
- පාසල තුළ සිසුන්ගේ ත්‍රෛභාෂා කුසලතා නැංවීම සඳහා ඉගෙනුම් ද්‍රව්‍ය සකස් කිරීමට හා සම්පත් පුද්ගලයින් 30 දෙනෙකු පුහුණු කිරීමට පියවර ගන්නා ලදී.

## 2.3.5 ආගමික හා සාරධර්ම අධ්‍යාපනය වැඩිදියුණු කිරීම

- අ.පො.ස. (සා.පෙ.) ආගම් විෂයයන් හි ප්‍රතිඵල ඉහළ නැංවීම සඳහා බුද්ධ ධර්මය, හින්දු, ඉස්ලාම්, කතෝලික, ක්‍රිස්තියානි විෂය උගන්වන ගුරුවරුන් 911ක් ධාරිතා සංවර්ධන වැඩසටහන් හරහා පුහුණු කරන ලදී.
- අ.පො.ස. (සා.පෙ.) ශිෂ්‍ය උපකාරක සම්මන්ත්‍රණ විෂය අනුව පවත්වන ලද අතර ඒ සඳහා ශිෂ්‍යයින් 5,820ක් සහභාගී වූහ.
- අ.පො.ස. (උ.පෙ.) විෂය ප්‍රතිඵල ඉහළ නැංවීම සඳහා බුද්ධ ධර්මය, බෞද්ධ ශිෂ්ටාචාරය, හින්දු ධර්මය, හින්දු ශිෂ්ටාචාරය, ඉස්ලාම් ධර්මය, ඉස්ලාම් ශිෂ්ටාචාරය, ක්‍රිස්තියානි ධර්මය, ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය උගන්වන ගුරුවරුන් 493ක් ධාරිතා සංවර්ධන වැඩසටහන් හරහා පුහුණු කරන ලදී.



සාරධර්ම අධ්‍යාපන වැඩසටහනක්

- අ.පො.ස. (උ.පෙ.) ශිෂ්‍ය උපකාරක සම්මන්ත්‍රණ විෂය අනුව පවත්වන ලද අතර ඒ සඳහා ශිෂ්‍යයින් 2328ක් සහභාගී වූහ.
- බුද්ධ ධර්මය උගන්වන ගුරුවරුන් 50ක් සඳහා තොරතුරු තාක්ෂණ පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.
- ගුරු සිසු සාරධර්ම ප්‍රවර්ධන වැඩසටහන් 5ක් පවත්වන ලදී.
- මාපිය සම්භාවනා පාසල් සාරධර්ම ප්‍රවර්ධන වැඩසටහන් සිසුන් 4,000ක ගේ සහභාගීත්වයෙන් පැවැත්විණි.
- බුද්ධ ධර්මය ගුරුවරුන් 204ක් සඳහාත් විදුහල්පතිවරුන් හා නියෝජ්‍ය විදුහල්පතිවරුන් 270ක් සඳහාත් සාරධර්ම ප්‍රවර්ධන වැඩමුළු පවත්වන ලදී.
- "සති පාසල්" වැඩ සටහන යටතේ වැඩමුළු 3ක් මෙම වසරේ පැවැත්විණි.
- අ.පො.ස. (සා.පෙ.) බුද්ධ ධර්මය අත්පත්‍රිකා සැකසීම, සම්පත්දායකයින් පුහුණු කිරීම, ඉස්ලාම් ගුරු අත්පොත් සකස් කිරීම, අ.පො.ස. (උ.පෙ.) ක්‍රිස්තියානි ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය හඳුන්වා දීම, සර්ව ආගමික ධාරිතා සංවර්ධන වැඩමුළුව පැවැත්වීම 2018 වසරේ ඉටු කළ අනෙකුත් ප්‍රධාන කාර්යයන් වේ.

## 2.3.6 කෘෂිකර්ම හා පරිසර අධ්‍යයනය සහ ජෛව පද්ධති තාක්ෂණවේදය විෂයය සංවර්ධනය

- අ.පො.ස (උ/පෙළ) කෘෂි විද්‍යා හා ජෛව පද්ධති තාක්ෂණවේදය හදාරන සිසුන් සඳහා අධ්‍යාපන හා වෘත්තීය පුහුණු අවස්ථා පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහය මුද්‍රණය කර බෙදාහැරීමට කටයුතු කරන ලදී.
- අ.පො.ස (උ/පෙළ) ජෛව පද්ධති තාක්ෂණය හා කෘෂි විද්‍යා විෂයය සඳහා බඳවා ගත් නවක ගුරුවරුන් 281දෙනෙකුට ප්‍රායෝගික පුහුණුව ලබා දෙන ලදී.
- ජෛව පද්ධති තාක්ෂණවේදය ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධනය යටතේ ගුරුවරුන් 175දෙනෙක් 2018 වර්ෂයේ පුහුණු කරන ලදී.
- අ.පො.ස (උ/පෙළ) ජෛව පද්ධති තාක්ෂණවේදය යටතේ ඉලෙක්ට්‍රොනික තාක්ෂණය පිළිබඳ ගුරුවරුන් දැනුවත් කිරීම සඳහා අත්පොතක් සකස්කර ගුරුවරුන් 240ක් වයඹ විශ්ව විද්‍යාලයේදී පුහුණු කරන ලදී.
- නව විෂය නිර්දේශයට අනුකූලව ජෛව පද්ධති තාක්ෂණවේදය ප්‍රායෝගික පුහුණු අත්පොතක් සකස් කිරීමට පියවර ගන්නා ලදී.
- තිරසර පාසල් සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක පාසල් 6,409ක ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන යටතේ පාසල් ගොවිපළ ක්‍රියාත්මක කිරීම හා පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන යටතේ අත්පත්‍රිකා මඟින් සිසුන් දැනුවත් කිරීම සිදු කරන ලදී.
- පරිසර අධ්‍යයන වැඩසටහන යටතේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් පිළිබඳව ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ගුරුවරුන් හා නිලධාරීන් 113 දෙනෙකු පුහුණු කරන ලදී.
- ළඟ ම පාසල හොඳ ම පාසල වැඩසටහන යටතේ ස්ථාපිත කළ කෘෂි තාක්ෂණ ඒකක භාවිතය පිළිබඳ මාර්ගොපදේශ සංග්‍රහයක් සකස්කර පාසල් 193ක කෘෂි විද්‍යා ගුරුවරුන් පුහුණු කර ඇත.
- පාසල් ගොවිපළ පිළිබඳ පුහුණුකරුවන් ලෙස කෘෂිකර්ම අධ්‍යාපන නිලධාරීන් 150 දෙනෙක් පුහුණු කර ගුරු පුහුණුව ආරම්භ කර ඇත.
- සමස්ත ලංකා කෘෂි විද්‍යා දැනුම මිනුම තරගයේ අවසන් තරගය පවත්වා නිම කරන ලදී.
- 2019 වසරේ දී පාසල් සිසුන්ගේ කුසලතා ඉහළ නැංවීම සඳහා "සිසු සවියෙන් රන් අස්වනු" සමස්ත ලංකා පාසල් ගොවිපොළ තරඟය පැවැත්වීමට ද සැලසුම්කර ඇත.



පාසල් ගොවිපළක්

## 2.3.7 වාණිජ, ව්‍යාපාර අධ්‍යයනය හා ගිණුම්කරණය



වාණිජ ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහනක්

- කලාප මට්ටමින් ශිෂ්‍යයින් 9,800 කගේ සහාගිත්වයෙන් වාණිජ ශිෂ්‍ය කඳවුරු පවත්වන ලදී.
- වාණිජ සිසුන් හා ගුරුවරුන්ගේ සහභාගීත්වයෙන් ඉගෙනුම් උපකරණ සකස් කිරීම සිදු කර ප්‍රදර්ශනයක් පවත්වන ලදී.
- පාසල් සංවර්ධන සමිති ගිණුම් තැබීම පිළිබඳව එම සමිතිවල නිලධාරීන් 97ක් පුහුණු කරන ලදී.
- අ.පො.ස (උ.පෙළ) වාණිජ විෂය ධාරාවට අදාළ ව පාසල් පාදක ඇගයීම සඳහා අත්පොත් සකස් කිරීමට සහ අ.පො.ස (උ.පෙළ) ඉගෙනුම් උපකරණ සකස් කිරීමට පියවර ගන්නා ලදී.
- අ.පො.ස.(සා.පෙළ) ගුරුවරුන් 398ක ගේ සහ අ.පො.ස.(උ.පෙළ) ගුරුවරුන් 1,935ක ගේ ධාරිතා සංවර්ධනය සඳහා වැඩසටහන් පවත්වා ඇත.
- ගුරු උපදේශකවරුන් 58දෙනෙක් පුහුණුකරුවන් ලෙස පුහුණු කිරීමට පියවර ගනු ලැබිණි.
- 2019 වර්ෂයේ දී ඉහත වැඩසටහන් අඛන්ඩ ව සිදු කිරීමත් විද්‍යුත් වාණිජ පද්ධතියක් තුළින් රජයේ, පෞද්ගලික අංශයේ හා වෘත්තීය අධ්‍යාපන ආයතන සම්බන්ධ කරගෙන රැකියා බැංකුවක් ඇති කිරීමට ජාතික මට්ටමේ වාණිජ තරඟාවලියක් සංවිධානය කිරීමට හා වාණිජ විෂය ධාරාවේ සියලු විෂයන් සඳහා ඉගෙනුම් උපකරණ නිර්මාණය කිරීමට ද අපේක්ෂා කෙරේ.

## 2.3.8 පෙළපොත්වල ගුණාත්මක බව ඉහළ නැංවීම

පෙළපොත්වල ගුණාත්මක බව ඉහළ නැංවීම සඳහා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව පියවර රැසක් ගෙන ඇත. පෙළ පොත් රචනය හෝ සංස්කාරක මණ්ඩලයට සහභාගී නොවූ විෂය ප්‍රවීන බාහිර සමීක්ෂකයන් යොදවා ගෙන පොත්වල විෂය නිර්දේශ ආවරණය, භාෂා නිරවද්‍යතාව, විෂය කරුණු නිවැරදි බව පරීක්ෂා කරනු ලැබේ. භෞතික වශයෙන් උසස් නිමාව සහතික කිරීම සඳහා කඩදාසිවල යෝග්‍යතාව හා ගුණාත්මක බව නිර්නායක මත ඇගයීමක් විද්‍යාගාරයක් මගින් සිදු කෙරේ.

## 2.3.9 පාසල් පුස්තකාල සංවර්ධනය සහ e-පුස්තකාල සංවර්ධනය

- ප්‍රාථමික පාසල් පුස්තකාල 202කට 2018 වසරේ ප්‍රතිපාදනවලින් රු.මි. 20ක වටිනාකමින් යුත් පොත් මිලදී ගෙන ලබා දෙන ලදී.
- 'කලණ මිතුරු පොත් සුමිතුරු' කියවීම් ප්‍රවර්ධන වැඩ සටහන දිවයිනේ පාසල් වල 6 වන ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා ඉගෙනුම ලබන සිසුන්ට හඳුන්වා දී ඇත. එමඟින් පොත් කියවන දරු දැරියන් දිරිමත් කිරීම සඳහා රන්, රිදී හා ප්ලැටිනම් පදක්කම් පිරිනැමීමට කටයුතු කෙරේ.
- තොරතුරු සාක්ෂරතාව හා මාධ්‍ය සාක්ෂරතාව නව ප්‍රවණතා පිළිබඳව පුස්තකාල සම්බන්ධීකරණ නිලධාරීන් දැනුවත් කිරීමේ සැසි 14ක් පවත්වන ලදී.






කලණ මිතුරු පොත් සුමිතුරු වැඩසටහන දියත් කිරීම

- ළමා සාහිත්‍ය පිළිබඳව අධ්‍යයනයක් කර එහි වාර්තාව පිටපත් 500ක් මුද්‍රණයට පියවර ගෙන ඇත.
- පාසල් පුස්තකාල ක්ෂේත්‍රයේ සුදුසුකම් සහිත නිලධාරීන් වැඩි කිරීම සඳහා පුහුණු පැසි පවත්වන ලදී.

## 2.3.10 විෂය සමගාමී ක්‍රියාකාරකම් සහ විෂයය බාහිර ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම

- විෂය සමගාමී කටයුතු භාර නියෝජ්‍ය විදුහල්පතිවරුන් පුහුණු කිරීම සඳහා මොඩියුලයක් සකස් කර 458 දෙනෙකු පුහුණු කරන ලදී.
- පළාත් හා කලාපවල විෂය සමගාමී සම්බන්ධීකරණ නිලධාරීන් සඳහා පුහුණු මොඩියුලයක් සකස් කරන ලදී.
- ශිෂ්‍ය නායක නායකත්ව සංවර්ධන වැඩසටහන යටතේ පාසල් ශිෂ්‍ය නායකයින් 100ක් පුහුණු කරන ලදී.
- ජාතික ශිෂ්‍ය පාර්ලිමේන්තුව සඳහා අවම සහභාගීත්වයක් සහිත අධ්‍යාපන කලාපවල විදුහල්පතිවරුන් හා ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලද අතර සිසුන් 1365 දෙනෙක් ඒ සඳහා සහභාගී වූහ.
- ජාතික ශිෂ්‍ය පාර්ලිමේන්තු චක්‍රලේඛය සංශෝධනයට හා ඒ සඳහා ක්‍රියාකාරී අත්පොතක් පිළියෙල කිරීමට පියවර ගනු ලැබිණි.
- ශිෂ්‍ය පාර්ලිමේන්තු අමාත්‍යවරුන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පවත්වන ලදී.

## 2.3.11 ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපනය ප්‍රවර්ධනය

- ක්‍රීඩා හැකියාවන්ගෙන් පරිපූර්ණ දරුවන්ගේ දක්ෂතා එළිදැක්වීම උදෙසා 34 වන සමස්ත ලංකා පාසල් ක්‍රීඩා උළෙල පවත්වා අවසන් කර ත්‍යාග සහ සම්මාන ප්‍රදානය සිදු කරන ලදී.





2018 සමස්ත ලංකා පාසල් ක්‍රීඩා උළෙල

- සමස්ත ලංකා පාසල් සහාය දිවීමේ තරගාවලිය (Relay Carnival- 2018) මෙවර බදුල්ල වින්සන්ට් ඩයස් ක්‍රීඩාංගණයේ දී පවත්වන ලදී.



පාසල් ක්‍රිකට් සංවර්ධන සැලැස්ම පිළිබඳව ප්‍රවීන ක්‍රිකට් ක්‍රීඩකයින් සහ නිලධාරීන් සමග පැවති සාකච්ඡාවක්

- ප්‍රාථමික ශ්‍රේණිවල දරුවන්ගේ ක්‍රීඩා කුසලතා ඔප් නංවන සමස්ත ලංකා ළමා මලල ක්‍රීඩා උළෙල මහනුවර දී මෙවර ද පවත්වන ලදී.
- ශාරීරික යෝග්‍යතාවය පිළිබඳ ගුරු පුහුණුව, ප්‍රාථමික ක්‍රීඩා සම්බන්ධීකාරකවරුන් පුහුණුව, ජාතික මට්ටමේ පුහුණු සංචිත පැවැත්වීම ඇතුළුව ක්‍රීඩා ක්ෂේත්‍රයේ ධාරිතා සංවර්ධන වැඩසටහන් රැසක් පවත්වන ලදී.
- ක්‍රීඩා පාසල් 25ක් සඳහා 2018 වසරේ ප්‍රතිපාදන ලබා දීමට පියවර ගන්නා ලදී.
- පාසල් ක්‍රිකට් නැංවීම සඳහා ප්‍රවීණ ක්‍රිකට් ක්‍රීඩකයින්, ක්‍රිකට් පුහුණුකරුවන් සහ උපදේශකවරුන්, ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමයේ නිලධාරීන් සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන්ගෙන් සමන්විතව පිහිටුවන ලද කමිටුව විසින් සකස් කරන ලද පාසල් ක්‍රිකට් ජාතික මෙහෙයුම් සැලැස්ම 2018 - 2020 මගින් ඉදිරිපත් කර තිබූ යෝජනා ක්‍රියාත්මක කිරීම අරඹා ඇත.

- මෙරට සියලු ක්‍රීඩාවන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශය සහ පළාත් සභා, පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශය එක් ව වසර තුනක ඒකාබද්ධ වැඩපිළිවෙළක් සකස් කිරීමට පියවර ගෙන ඇත. ක්‍රීඩා සංගම් අතර ඇතිවන පරිපාලනමය ගැටළු මගහරවා ගනිමින් ක්‍රීඩා තරග පැවැත්වීම, ක්‍රීඩකයින් පුහුණු කිරීම, ක්‍රීඩා පුහුණුකරුවන්ගේ ගුණාත්මක සංවර්ධනය ඇති කිරීම මෙන්ම පාසල් ක්‍රීඩා සංගම් සහ ක්‍රීඩා මව් සංගම් අතර අන්‍යොන්‍ය සහයෝගිතාව වර්ධනය කිරීමට මෙම ඒකාබද්ධ වැඩපිළිවෙළ ඉවහල්වනු ඇත.

## 2.3.12 සෞන්දර්ය අධ්‍යාපන සංවර්ධනය

- සෞන්දර්ය ප්‍රායෝගික විෂයය දක්ෂතා ඉහළ නැංවීම සඳහා ගුරු උපදේශකවරුන් 130ක්, ගුරුවරුන් 1,142ක් හා පාසල් සිසුන් 1,942ක් සඳහා වැඩමුළු හා පුහුණු සැසි පවත්වන ලදී.
- චිත්‍ර, පෙරදිග සංගීතය,බටහිර සංගීතය, නර්තනය හා නාට්‍ය හා රංග කලාව යන විෂයයන් යටතේ සමස්ත ලංකා පාසල් සෞන්දර්ය තරඟ පවත්වන ලදී.
- ජාතික පාසල් 100ක් සඳහා සෞන්දර්ය උපකරණ මිලදී ගෙන බෙදාහැරීමට කටයුතු කරන ලදී.



සමස්ත ලංකා චිත්‍ර තරඟයට සහභාගී වූ ශිෂ්‍යයෙක්

- සෞන්දර්ය විෂයන්වල ගුණාත්මක වර්ධනයක් සිදුකිරීම සඳහා පර්යේෂණ වැඩසටහන්, ශාස්ත්‍රීය වැඩසටහන්, කර්නාටක සංගීතය ඇතුළු වැඩසටහන් 31ක් පැවැත්වීමට හා සංගීත් සඟරාව හා පබෝදා සිතුවම් පොත් මුද්‍රණය කිරීමට පියවර ගන්නා ලදී.
- ශාස්ත්‍රිය පොත්පත් එළිදැක්වීම සහ සංගීත විෂය නිර්දේශයේ ප්‍රායෝගික කොටස් වීඩියෝගත කිරීමට ද පියවර ගෙන ඇත.
- ශනි දින සෞන්දර්ය පාසල් ව්‍යාපෘතිය පාසල් 2ක ක්‍රියාත්මක කරන ලදී.
- 2019 වර්ෂයේ අපේක්ෂිත නව වැඩසටහන් අතර ශිෂ්‍යයින්, ගුරුවරුන් හා නිලධාරීන්ගේ මෘදුකාංග භාවිතය පිළිබඳ හැකියාවන් වර්ධනය කිරිම තුළින් සිය දක්ෂතාවන් අන්තර්ජාලය තුළින් ප්‍රදර්ශනය කිරීමට සහාය ලබාදීම, නවීන ලෝකයට ගැලපෙන පරිදි Video Recording පහසුකම් සහිත සෞන්දර්ය ඒකක පිහිටුවීම සහ සමස්ත ලංකා තරඟ සහ විෂය ප්‍රයෝගික කොටස් විඩියෝ ගත කර Video Library සකස් කිරීම ඇතුළත්ය.

## 2.3.13 නවෝත්පාදන දිරිගැන්වීම සහ සුභග සිසුන්ට අත්වැලක් සැපයීම

### සුභග ශිෂ්‍යත්ව වැඩසටහන

පාසල් පද්ධතිය තුළ සිටින ශාස්ත්‍රීය අධ්‍යාපනයට මෙන්ම සෞන්දර්ය, ක්‍රීඩා, නව නිපැයුම් ආදී ක්ෂේත්‍ර වලින් ද සුවිශේෂී කුසලතා පෙන්වන නිර්මාණශිලී දරුවන්ට ඔවුන්ගේ හැකියාවන් තවදුරටත් වැඩි දියුණු කර ගැනීම සඳහා සවියක්වීමේ අරමුණින් සුභග ශිෂ්‍යත්ව අරමුදල 2018 වර්ෂයේ දී ආරම්භ කරන ලදී.පළමු ශිෂ්‍ය කණ්ඩායම ලෙස නිර්ණායක මත තෝරා ගත් ශිෂ්‍යයන් 1,000කට එක් ශිෂ්‍යයෙකුට රු.50,000ක් බැගින් වටිනා ශිෂ්‍යත්වයක් මාස 20ක කාලයක් තුළ පිරිනැමීමට මේ වනවිට පියවර ගෙන ඇත.

## 2.3.14 සමාජ සංහිඳියාව, සාමය, ජාතික ඒකාග්‍රතාව සහ පුරවැසි අධ්‍යාපනය ප්‍රවර්ධනය

- භාෂා අවබෝධය හා මෘදු කුසලතා ලබා දීම තුළින් සංහිඳියාව ඇතිකිරීමේ වැඩසටහන යටතේ ගුරු භවතුන් හා ගුරු උපදේශකවරුන් 1,950ක් පුහුණු කරන ලදී.
- සාමය හා සංහිඳියාව සඳහා වන පාසල් වැඩසටහන් පිළිබඳ ව පළාත් හා කළාප නිලධාරීන් දැනුවත් කිරීමට පියවර ගනු ලැබිණි.
- සංහිඳියාවට අදාල කෘති නැවත මුද්‍රණය කිරීම යටතේ යාපනයේ සීයා කෘතිය පිටපත් 1,000ක් මුද්‍රණය කර බෙදා හරින ලදී.





සාමය හා සංහිඳියාව පිළිබඳ අධ්‍යාපනික වැඩසටහන්

## 2.4 ගුරු සංවර්ධනය, ගුරු අධ්‍යාපනය හා ගුරු කළමනාකරණය

### 2.4.1 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල තත්වය ඉහළ නැංවීම හා ගුරු අධ්‍යාපනඥයින්ගේ ධාරිතාව ඉහළ නැංවීම

#### ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල තත්වය ඉහළ නැංවීම

- පූර්ව සේවා ගුරු පුහුණුව සඳහා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ 19ක පාඨමාලා 27ක් සඳහා ගුරු සිසුන් 4,745ක් 2018 වර්ෂය සඳහා බඳවා ගන්නා ලදී.
- ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට බඳවා ගනු ලබන සංඛ්‍යාව දෙගුණයක් කරමින් ගුරු සිසුන් 8,000ක් පමණ 2019 වර්ෂයේ දී බඳවා ගැනීමට සැලසුම් කර ඇත. එහි දී ප්‍රාථමික විද්‍යාව, ගණිතය යන විෂයයන් සඳහා වැඩි ගුරු සිසුන් සංඛ්‍යාවක් බඳවා ගැනීමට සැලසුම් කර ඇත.
- හාපිටිගම හා අඩ්ඩාලච්චේන යන විද්‍යාපීඨ දෙකෙහි විශේෂ අධ්‍යාපන ගුරු පුහුණු පහසුකම් වැඩි දියුණු කිරීමේ අරමුණින් විශේෂ අධ්‍යාපන උපකරණ ලබාදීමේ ප්‍රසම්පාදන කාර්යයන් ක්‍රියාවට නංවා ඇත.
- ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ වල ශික්ෂණලාභීන් වෙනුවෙන් මෙතෙක් රජය මගින් ලබාදුන් රු.3500ක මාසික දීමනාව ප්‍රමාණවත් නොවූ බැවින් එම දීමනාව රු.5,000 දක්වා ඉහළ නැංවීමට කටයුතු කරන ලදී.

#### ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධාරීන්ගේ ධාරිතාව ඉහළ නැංවීම

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ දීර්ඝ කාලීනව පැවති පුරප්පාඩු පිරවීම සඳහා නව බඳවා ගැනීම් 2018 වසරේ සිදුකරන ලදී.

**2.4.1 වගුව : 2018 වර්ෂයේ බඳවා ගැනීම් හා උසස් කිරීම්**

| සේවය හා ශ්‍රේණිය | බඳවාගත් /උසස් කළ සංඛ්‍යාව |
|---|---|
| ශ්‍රී ලං.ගු.අධ්‍ය. සේ. iii ශ්‍රේණියට බඳවා ගැනීම (විවෘත හා සීමිත) | 340 |
| ශ්‍රී ලං.ගු.අධ්‍ය. සේ. i ශ්‍රේණියට උසස් කිරීම. | 139 |
| ශ්‍රී ලං.ගු.අධ්‍ය. සේ. ii ශ්‍රේණියට උසස් කිරීම. | 02 |

**2.4.2 වගුව : ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ ධාරිතා සංවර්ධනය**

| පුහුණු වැඩසටහන | පුහුණු කළ සංඛ්‍යාව |
|---|---|
| ශ්‍රී ලං.ගු.අධ්‍ය.සේ. III පන්තියේ නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය | 148 |
| ශ්‍රී ලං.ගු.අධ්‍ය.සේ. නවක නිලධාරීන්ගේ සේවාරම්භක පුහුණු වැඩසටහන. | 340 |




ගුරු අධ්‍යාපනඥ සේවයේ පත්වීම් ලබා දීම

## 2.4.2 ගුරු මධ්‍යස්ථානවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම

- ගුරු මධ්‍යස්ථාන ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ ඉදි කෙරෙන නව ගුරු මධ්‍යස්ථාන 39න් මධ්‍යස්ථාන 35ක ඉදිකිරීම් නිමකර විවෘත කිරීමට අදාළ කටයුතු සිදු කරමින් පවතී.
- ගුරු මධ්‍යස්ථාන කළමනාකරණය සඳහා අත්පොත කෙටුම්පත් කිරීමට කටයුතු කර ඇත.

## 2.4.3 පාසල් පාදක වෘත්තීය ගුරු සංවර්ධන වැඩසටහන (SBPTD) වැඩිදියුණු කිරීම

- පාසල් පාදක ගුරු සංවර්ධන වැඩසටහන යටතේ ගුරු පුහුණු අවශ්‍යතා හඳුනාගෙන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරිමට පියවර ගෙන ඇති අතර පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන අත්පොත සැකසීම සිදුකර ඇත. මෙම වැඩසටහන පිළිබඳ යහපත් ව්‍යවහාර හා දැනුම හුවමාරු කර ගැනීම සඳහා වැඩමුළු පවත්වන ලදී.

## 2.4.4 ගුරු සංවර්ධනය, ගුරු අධ්‍යාපනය සහ ගුරු කළමනාකරණය

### ගුරු අධ්‍යාපන වැඩසටහන්

- ගුරුවරුන්ගේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා මොඩියුල 20ක පුහුණුව ලබාදීම යටතේ පුහුණුකරුවන් පුහුණු කර ගුරු වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථාන හරහා වැඩසටහන් 1,900ක් ක්‍රියාත්මක කරන ලදී.
- වෘත්තීය දැනුමෙන් පරිපූර්ණ ගුරුවරුන් පාසල් පද්ධතියට ලබාදීම සඳහා සිදුකරන අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන යටතේ ගුරු සිසුන් 629ක් ගුරු විද්‍යාල හරහා පුහුණු කිරීම ක්‍රියාත්මක කෙරේ. එමෙන්ම ඉංග්‍රීසි, ප්‍රාථමික හා බටහිර සංගීත ගුරුවරුන් 700ක් පමණ සති අන්ත ගුරු පුහුණු පාඨමාලා යටතේ පුහුණු කිරීමට ජාතික අධ්‍යාපන ආයතනය විසින් ආරම්භ කර ඇත.
- නුපුහුණු උපාධිධාරීන් 88 දෙනෙකු පුහුණු කිරීමට කටයුතු කරන ලදී.
- පොදු රාජ්‍ය මණ්ඩලීය සහයෝගීතාවය යටතේ දැනුම හුවමාරු කර ගැනීමේ සමුළුවක් හා සංවාද මණ්ඩපයක් පවත්වන ලදී.

### ජාතික අධ්‍යාපන ආයතනය මඟින් සිදු කළ ගුරු පුහුණු වැඩසටහන්

- ගණිත පත්වීම් නොලැබ ගණිතය උගන්වන ගුරුවරුන් 100ක් උසස් සහතික පත්‍ර පාඨමාලාව සඳහා බඳවා ගනු ලැබ ඇත.

- අන්තර්කරණ අධ්‍යාපනය සවිබල ගැන්වීම සඳහා ගුරු උපදේශකවරුන් හා ගුරුවරුන් 291ක් පුහුණු කිරීමට පියවර ගනු ලැබිණි.
- 13 වසරක අනිවාර්ය අධ්‍යාපන වැඩසටහන යටතේ පළමු නියාමක අදියරට ඇතුළත් වූ පාසල් 42 හි වෘත්තීය විෂයන් ඉගැන්වීම සඳහා ගුරුවරුන් 250ක් ද, දෙවන අදියරට අයත් පාසල් 153 හි ගුරුවරුන් 1,237ක් ද වෘත්තීය විෂයයන් සඳහා අලුතින්ම බඳවා ගත් ගුරුවරුන් 898ක් ද පුහුණු කර අවසන්ය.
- 12 හා 13 ශ්‍රේණිවලට අදාළ විෂය නිර්දේශ ආශ්‍රිතව ධාරිතා සංවර්ධන වැඩසටහන් රාශියක් විවිධ විෂයන් පදනම් කරගනිමින් පැවැත්විණි. ගුරුවරුන් 12,851ක් මේ යටතේ පුහුණු කරන ලදී.
- 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා විෂය නිර්දේශයට අදාළ ව සම්පත් පුද්ගලයින් 1,723ක් පුහුණු කරන ලදී.
- ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ පුහුණුකරුවන් 600ක් පුහුණු කරන ලදී.

### ගුරු පුහුණු හා ධාරිතා සංවර්ධන වැඩසටහන් - 2018 අයවැය යෝජනා

- 2018 වර්ෂයේ අයවැය යෝජනා යටතේ ධාරිතා සංවර්ධන වැඩසටහන් සඳහා වෙන්ව තිබූ ප්‍රතිපාදන වලින් ප්‍රධාන විෂය ක්ෂේත්‍ර 33ක් යටතේ ගුරුවරුන්, ගුරු උපදේශකවරුන්, විදුහල්පතිවරුන්, ගුරු අධ්‍යාපනඥයින්, නිළධාරීන් ආදී සියලු වෘත්තීන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරන ලදී.
- විදුහල්පතිවරුන් 200ක් සඳහා විදේශ පුහුණුව, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් 96ක් සඳහා විදේශ පුහුණුව ඇතුළුව විෂය ක්ෂේත්‍ර රැසක් ඔස්සේ ගුරුවරුන්, ගුරු උපදේශකවරුන්, විදුහල්පතිවරුන්, ගුරු අධ්‍යාපනඥයින්, නිලධාරීන් සඳහා විදේශීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

### ජාතික පාසල් ගුරුමාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

ප්‍රශස්ත ගුරු උපයෝජනය, ජනප්‍රිය පාසල් වල සේවය කළ ගුරු භවතුන්ගේ අත්දැකීම් අනෙකුත් පාසල්වලට ලබා දීම හා දුෂ්කර පාසල්වල ගුරු භවතුන්ට ජනප්‍රිය පාසල්වල සේවය කිරීමට අවස්ථාව ලබා දීම යන ප්‍රධාන අරමුණු පාදක කරගනිමින් වසර 10කට වැඩි කාලයක් එකම ජාතික පාසලේ සේවය කළ ගුරුවරුන් මාරු කිරීම 2017 හා 2018 වර්ෂවල සිදු කරන ලදී. ඒ අනුව අ.පො.ස.(උ.පෙ.) ගුරුවරුන් 2,590ක් ද ප්‍රාථමික ගුරුවරුන් 843ක් ද අ.පො.ස. (සා.පෙළ) ගුරුවරුන් 3,766ක් ද ස්ථාන මාරු කරන ලදී.

### ගුරු කාර්ය මණ්ඩල නිර්ණය කිරීම

ගුරු උපයෝජනය ප්‍රශස්ත අයුරින් සිදු කිරීම සහ පාසල්වලට අවශ්‍ය ගුරුවරු අඩුපාඩුවකින් තොරව ලබා දීම යන අරමුණු මුල්කර ගනිමින් පාසල් පාදක ව විෂය අනුව ගුරු කාර්ය මණ්ඩල නිර්ණය කිරීම සඳහා සකස් කර ඇති 2016/1 චක්‍රලේඛයට අනුව එක් එක් ජාතික පාසලට අදාළ ව ගුරු කාර්ය මණ්ඩලය ගණනය කිරීම මේ වන විට අවසන් කර ඇත. ඒ අනුව සියලුම ජාතික පාසල්වල ඌන අතිරික්ත ගණනය කර ජාතික පාසල් හා පළාත් පාසල් අතර ගුරු තුලනය සිදු කිරීමට සහ අවශ්‍ය පරිදි නව බඳවා ගැනීම් සිදු කිරීමට පියවර ගෙන ඇත.

### ගුරු ප්‍රතිභා ප්‍රභා ගුරු හා විදුහල්පති ඇගයීම් ප්‍රණාම උළෙල

අධ්‍යාපන අමාත්‍යාංශය විසින් වාර්ෂිකව ගුරුවරුන් හා විදුහල්පතිවරුන් ඇගයීම සඳහා පවත්වනු ලබන ගුරු ප්‍රතිභා ප්‍රභා ගුරු හා විදුහල්පති ඇගයීම් උත්සවය මෙවර ද ජාතික ගුරු දිනයට සමගාමීව " ජාතියක ආයෝජනය ගුරුවරුන්ය" යන තේමාව යටතේ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්විණි.



වතු පාසල් ගුරු සහායක පත්වීම් ලබා දීම



ගුරු ප්‍රතිභා ප්‍රභා ප්‍රණාම උළෙල - 2018

2.4.3 වගුව : ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීම - 2018

| ගුරු වර්ගය | ජාතික පාසල් | | | පළාත් පාසල් | | එකතුව |
|---|---|---|---|---|---|---|
| | සිංහල | දෙමළ | ඉංග්‍රීසි | සිංහල | දෙමළ | |
| අධ්‍යාපන විද්‍යාපීඨ ඩිප්ලෝමාධාරීන් (ඌණ සාමාර්ථලාභී ) | 43 | 3 | 27 | - | 1 | **74** |
| ජාතික පාසල්වල ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් | 39 | 14 | 26 | - | - | **79** |
| 13 වසරක අධ්‍යාපන වැඩසටහන යටතේ වෘත්තීය විෂය ධාරාව ඉගැන්වීමට උපාධිධාරීන් | 463 | 94 | - | 310 | 59 | **926** |
| වතු ආශ්‍රිත දෙමළ මාධ්‍ය පාසල් සඳහා ගුරු සහායකයින් -7වන වටය | - | - | - | - | 92 | **92** |
| උතුරු පළාතේ ස්වේච්ඡා පදනමින් සේවයේ නිරතවී සිටි ගුරුවරුන්, ගුරු සේවයට බඳවාගැනීම | - | 7 | - | - | 632 | **639** |
| උතුරු පළාතේ කොන්ත්‍රාත් පදනමින් සේවයේ නිරතවී සිටි ගුරුවරුන්, ගුරු සේවයට බඳවාගැනීම | 10 | - | - | 11 | 121 | **142** |
| **එකතුව** | **655** | **118** | **53** | **321** | **905** | **1,952** |

## 2.5 ඇගයීම් සහ තක්සේරුකරණ ක්‍රමවේද වැඩිදියුණු කිරීම්

### 2.5.1 ඇගයීම් සහ තක්සේරුකරණ ක්‍රමවේද වැඩිදියුණු කිරීම්

**ජාතික මට්ටමේ විභාග පැවැත්වීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම**

- විභාග දෙපාර්තමේන්තුවේ විභාග පැවැත්වීමේ හා ඇගයීමේ ක්‍රියාවලීන් කඩිනම් කිරීම සඳහා දත්ත පද්ධති සංවර්ධනය කිරීමට හා ඒ සම්බන්ධ සියලු අංශයන් හි පරිගණක පහසුකම් වැඩිදියුණු කිරීමට පියවර ගෙන ඇත. දෙපාර්තමේන්තු පරිගණක ජාලය සවිමත් කිරීමට ද, ආරක්ෂිත ක්‍රමවේද වැඩිදියුණු කිරීමට ද පියවර ගෙන ඇත. මාර්ගගත ක්‍රමය ඔස්සේ (Online) විභාග පැවැත්වීමට, සහතික පත්‍ර නිකුත්කිරීමට අවශ්‍ය පහසුකම් නවීකරණය කිරීමේ කාර්යයන් ආරම්භ කර ඇත. විභාග කාර්ය මණ්ඩල හා ඇගයීම් කාර්ය මණ්ඩල පිළිබඳ දත්ත පාදකයන් පවත්වා ගැනීමට ද කටයුතු කර ඇත.

**ජාතික මට්ටමේ විභාග ඇගයීම් ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම**

- පිළිතුරු පත්‍ර ඇගයීම කාර්යක්ෂම කිරීම සඳහා OCR/ICR යන්ත්‍ර මිලදී ගැනීමට පියවර ගෙන ඇත. නවීන මුද්‍රණ යන්ත්‍ර මිලදී ගැනීමට හා මුද්‍රණ හා ගබඩා පරිශ්‍රයන් හි පහසුකම් වැඩිදියුණු කිරීමට ද පියවර ගෙන ඇත.
- විභාග ප්‍රශ්නපත්‍රවල ගුණාත්මක බව වැඩිදියුණු කිරීම සඳහා අයිතම සංචිතයක් හා අයිතම බැංකුවක් පිහිටුවීමට කටයුතු කරමින් පවතී.

**පාසල් පාදක නව තක්සේරුකරණ වැඩසටහන**

- පාසල් පාදක නව තක්සේරුකරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා නිලධාරීන් පුහුණු කිරීම හා ඊට අදාළ මාර්ගෝපදේශ සකස් කර මුද්‍රණය කර ලබාදීම සිදු කරන ලදී.
- පළමු වාරය සඳහා අදාළ වන පාසල් පාදක තක්සේරුකරණ උපකරණ 26ක පළමු අදියර සකස් කර අවසන් කරන ලදී.

## 2.6 ඩිජිටල් මාධ්‍ය භාවිතයෙන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ආකර්ෂණීය ලෙස සංවර්ධනය

### 2.6.1 ඩිජිටල් මාධ්‍ය භාවිතයෙන් ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනයේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ආකර්ෂණීය ලෙස සංවර්ධනය

- තොරතුරු තාක්ෂණ විෂය ඉගැන්වීමේ ධාරිතා වර්ධනය යටතේ ගුරුවරුන් 1,728 දෙනෙක් මෙම වසරේ පුහුණු කරන ලදී.
- e-ඉගෙනුම හා දුරස්ථ අධ්‍යාපනය සවිමත් කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ගුරුවරු 2,415 දෙනෙකු පුහුණු කරන ලදී.
- දකුණු කොරියාවේ ග්වැන්ග්-ජු ආයතනය හා ශ්‍රී ලංකාව අතර මිත්‍රත්ව ගුරු පුහුණු වාර්ෂික වැඩසටහන යටතේ පුහුණුව සඳහා 2018 වසරේ තොරතුරු තාක්ෂණ ගුරුවරුන් 20ක් හා නිලධාරීන් 4 දෙනෙක් සහභාගී කරවන ලදී.



සුහුරු පන්තිකාමරයක ඉගෙනුම ලබන සිසුන්



තොරතුරු තාක්ෂණ ගුරුවරුන් සඳහා විදේශ පුහුණුව


- තොරතුරු තාක්ෂණයෙන් සන්නද්ධ පාසල් පරිසරයක් බිහිකිරීම සඳහා ශිෂ්‍යයන් අතර පවත්වන වාර්ෂික තොරතුරු තාක්ෂණ තරඟ පවත්වා අවසන් කර ඇති අතර තොරතුරු තාක්ෂණ පාසල් සමාජ පිහිටුවීමට පියවර ගෙන ඇත.
- පාසල්වලට අන්තර්ජාල පහසුකම් ලබාදීමට හා අධ්‍යාපන අමාත්‍යාංශය ඇතුළු ව ආයතන අතර සම්බන්ධීකරණ ජාලය සවිමත් කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ කාර්යයන් ක්‍රියාවට නංවා ඇත.
- පාසල් පරිගණක නඩත්තුව ඉහළ නැංවීම සඳහා පිහිටුවන ලද කලාප මට්ටමේ දෘඩාංග සංචිත සවිබල ගැන්වීම සඳහා එම සංචිතවල ගුරුභවතුන් වෙනුවෙන් ධාරිතා වර්ධන වැඩසටහන් පවත්වන ලදී.
- සුහුරු පන්ති කාමර (Smart Class Rooms) වැඩසටහන යටතේ පාසල් 200කට එම පන්ති කාමර සඳහා අවශ්‍ය නව තාක්ෂණික උපකරණ ලබාදීමේ කාර්යයන් සිදු කරමින් පවතී.

## 2.7 ශිෂ්‍ය ඉගෙනුම් ඵල වැඩිදියුණු කිරීම

### 2.7.1 නවීන තක්සේරුකරණ ක්‍රමවේද භාවිතයෙන් ශිෂ්‍ය ඉගෙනුම් ඵල ඇගයීම

කොළඹ විශ්ව විද්‍යාලයේ ජාතික අධ්‍යාපන හා පර්යේෂණ හා ඇගයීම් ආයතනය (NEREC) හා එක්ව 4 වන ශ්‍රේණියේ සහ 8 වන ශ්‍රේණියේ ශිෂ්‍යයින්ගේ ඉගෙනුම් ඵල තක්සේරුකරණය සඳහා ජාතික මට්ටමේ ඇගයීම් වැඩසටහනක් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පසුගිය වර්ෂ ගණනාවක සිට ක්‍රියාත්මක කර ඇත. එම තක්සේරුකරණ වැඩසටහනේ ප්‍රතිඵල සහ නිර්දේශයන් පිළිබඳව පාසල් , කලාප, පළාත් හා ජාතික මට්ටමේ සැලසුම්කරුවන් සහ අදාළ සියලු පාර්ශවයන් දැනුවත් කර ශිෂ්‍ය ඉගෙනුම් ඵල වැඩිදියුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාවට නංවා ඇත.

සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය යටතේ ගණිතය හා ඉංග්‍රීසි භාෂාවේ ශිෂ්‍ය ඉගෙනුම් ඵල වැඩි දියුණු කිරීම සඳහා සංරචක දෙකක් ක්‍රියාත්මක වේ. 2018 වර්ෂයේ සිට ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය යටතේ ඉලක්ක ගත පාසල්වල ශිෂ්‍යයන්ගෙන් 100% කම ගණිතය හා ඉංග්‍රීසි ඉගෙනුම් ඵල 2024 වන විට අපේක්ෂිත මට්ටමට රැගෙන ඒමට සැලසුම් කර ඇත.



# 03.

# අධ්‍යාපනයේ හිමිකාරිත්වය හා සේවා සැපයුම සවිබල ගැන්වීම

## 3.1 පාසල් නගා සිටුවීමේ වැඩසටහන හරහා පාසල් බල ගැන්වීම

### 3.1.1 පාසල් නගා සිටුවීමේ වැඩසටහන සවිබල ගැන්වීම

- පාසල් කළමනාකරණය ශක්තිමත් කරමින් පාසල බලගැන්වීම සඳහා ක්‍රියාත්මක කරන පාසල් නගාසිටුවීමේ වැඩසටහන සඳහා නිලධාරීන් පුහුණු කරන ලදී.
- පාසල් පාදක ගුණාත්මක, ප්‍රමාණාත්මක හා ව්‍යුහාත්මක සංවර්ධනය සඳහා සැලසුම්කරණය හා ප්‍රසම්පාදනය පිළිබඳ චක්‍රලේඛය සහ මාර්ගෝපදේශ අත්පොත 2018.06.22 දින නිකුත් කරන ලදී.

### 3.1.2 පාසල් මූල්‍යකරණය විමධ්‍යගතකරණය

- පාසලේ මූල්‍ය කළමනාකරණය විධිමත්ව හා නිත්‍යානුකූලව සිදු කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ඉහත චක්‍රලේඛය මගින් ලබා දී ඇත.
- පාසල් පාදක මූල්‍ය ප්‍රදානයන් (SBLIG, HRIG ආදී) ලබා දීම තුළින් පාසල ශක්තිමත් කිරීමට පියවර ගෙන ඇත.

## 3.2 ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනයේ ගුණාත්මක ප්‍රමිතීන් හා ගුණාත්මකභාවය තහවුරු කිරීම

### 3.2.1 පාසල් හා අධ්‍යාපන ආයතන ඇගයීම් තුළින් ප්‍රමිතීන් හා ගුණාත්මකභාවය තහවුරු කිරීම

- අධ්‍යාපන ගුණාත්මක දර්ශකය 50%ට අඩු පාසල් වල නියෝජ්‍ය විදුහල්පතිවරුන් සඳහා ඇගයීම සම්බන්ධයෙන් ද පාසල් බාහිර ඇගයීම් කාර්යයට සම්බන්ධ වන නිලධාරීන් සඳහා ඇගයීම් වාර්තාකරණය සම්බන්ධයෙන් ද ධාරිතා සංවර්ධන වැඩසටහන් පවත්වන ලදී.
- පාසල් විශිෂ්ඨ ව්‍යවහාර හඳුනා ගෙන, ඇගයීමට ලක්කර පාසල් පද්ධතියට හඳුන්වා දීමට පියවර ගන්නා ලදී.
- අධ්‍යාපන ගුණාත්මකබව පිළිබඳ පර්යේෂණ සිදු කිරීම සඳහා වැඩමුළු 10ක් පවත්වන ලදී.
- ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ, කලාප අධ්‍යාපන කාර්යාල සඳහා ඇගයීම් මාර්ගෝපදේශ සකස්කර ඇත.
- විදුහල්පතිවරුන් සඳහා අත්පොතක් හඳුන්වා දීමට සහ ගුරුවරුන් සඳහා නිපුණතා රාමුවක් සකස් කිරීමට පියවර ගෙන ඇත.
- පාසල් ඇගයීම්කරුවන් 35ක ට හා ගුරු ප්‍රතිභා වැඩ සටහනෙන් තෝරාගත් විදුහල්පතිවරුන් හා ගුරුවරුන්ගෙන් සමන්විත 20 දෙනෙකුට විදේශ පුහුණු අවස්ථා ලබා දෙන ලදී.
- 2019 වර්ෂයේ දී ඉගෙනුම ඉගැන්වීම හා ඇගයීම ක්ෂේත්‍රයට අදාළ ව ආදර්ශ ගුරු ඇගයීම් වීඩියෝ දර්ශන සකස් කර පාසල් පද්ධතියට හඳුන්වා දීම, ගුරු අධ්‍යාපන සේවයේ නිලධාරීන් සඳහා නිපුණතා සකස් කිරීම, පළාත් අධ්‍යාපන කාර්යාල සඳහා ප්‍රමිතීන් සකස් කිරීම, අධ්‍යාපන සුපරීක්ෂණ සේවාව ක්‍රියාත්මක කිරීම යන නව කාර්යයන් ද ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතයි.

**පාසල් සුපරීක්ෂණ සේවාව**

- අධ්‍යාපන ආයතනයන්ගේ ගුණාත්මකබව තහවුරු කිරීම හා එම ආයතනවල කාර්යක්ෂමතාව හා අඛණ්ඩ වර්ධනය ඇති කිරීම පාසල් සුපරීක්ෂණ සේවාව ආරම්භ කිරීමේ අපේක්ෂිත අරමුණ වේ.
- අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූලික කාර්යයන් ඉටු කර ඇත.

## 3.3 පාසල්, කලාප, පළාත් හා ජාතික මට්ටමේ අධ්‍යාපන පරිපාලන හා කළමනාකරණ ක්‍රියාවලිය සවිබල ගැන්වීම

### 3.3.1 පාසල්, කලාප, පළාත් හා ජාතික මට්ටමේ අධ්‍යාපන පරිපාලන හා කළමනාකරණ ක්‍රියාවලිය සවිබල ගැන්වීම

**3.3.1 වගුව : ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට බඳවා ගැනීම් - 2017/2018**

| සේවය හා ශ්‍රේණිය | බඳවා ගත් / උසස් කළ සංඛ්‍යාව |
|---|---|
| ශ්‍රී.ලං.අ.ප.සේ. III ශ්‍රේණියට බඳවා ගැනීම (විවෘත/සීමිත /කුසලතා පදනම මත) | 718 |
| ශ්‍රී.ලං.අ.ප.සේ. II ශ්‍රේණියට උසස් කිරීම | 213 |
| ශ්‍රී.ලං.අ.ප.සේ. I ශ්‍රේණියට උසස් කිරීම | 79 |
| ශ්‍රී.ලං.අ.ප.සේ. විශේෂ ශ්‍රේණියට උසස් කිරීම | අයදුම් පත් කැඳවා අත |

**3.3.2 වගුව : ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය**

| පුහුණු වැඩසටහන | පුහුණු කළ සංඛ්‍යාව |
|---|---|
| ශ්‍රී ලං.අ.ප.සේ. III පන්තියට කුසලතා පදනම මත බඳවා ගත් නිලධාරීන් සඳහා දිශාභිමුඛ පුහුණු වැඩසටහන | 107 |
| ශ්‍රී ලං.අ.ප.සේ. III පන්තියට (සීමිත) දෙවන වටයෙන් බඳවා ගනු ලැබූ නිලධාරීන්ගේ සේවාරම්භක පුහුණු වැඩසටහන | 105 |
| කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ විදේශ පුහුණුව (තායිලන්තය) | 96 |



ධාරිතා සංවර්ධන වැඩසටහනක්



ශ්‍රී ලං.අ.ප.සේ. III නව පත්වීම් ප්‍රදානය


**3.3.3 වගුව : ශ්‍රී ලංකා විදුහල්පති සේවයට බඳවා ගැනීම හා උසස් කිරීම - 2018**

| සේවය හා ශ්‍රේණිය | බඳවා ගත් / උසස් කළ සංඛ්‍යාව |
|---|---|
| ශ්‍රී.ලං.වි.සේ. II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම | 672 |
| ශ්‍රී.ලං.වි.සේ. III ශ්‍රේණියේ සිට IIශ්‍රේණියට උසස් කිරීම | 333 |




ශ්‍රී ලංකා විදුහල්පති ශ්‍රේණිධාරීන් සඳහා උසස්වීම් ලබා දීම

## පාසල් නායකත්ව සහ කළමණාකරණය සඳහා වූ ජාතික නිපුණතා රාමුව (NCFSLM)




ශ්‍රී ලංකාවේ සියලුම පාසල් තුළ ගුණාත්මක සංවර්ධනය සඳහා පාසල් නායකත්වයේ අඛණ්ඩ වැඩි දියුණු කිරීම සහතික කිරීමට සහය දෙන ප්‍රබල උපාය මාර්ගයක් ලෙස පාසල් නායකත්ව සහ කළමණාකරණය සඳහා වූ ජාතික නිපුණතා රාමුව සකස්කර ඇත. මෙම නිපුණතා රාමුව ගුණාත්මක පාසල් පාලනය, ධනාත්මක පාසල් කළමණාකරණය, සඵලදායී පාසල් කළමණාකරණය සහ ගුණාත්මක ඉගෙනුම් ඵල යන ප්‍රධාන නායකත්ව සහ කළමනාකරණ ක්ෂේත්‍ර හතරින් සමන්විත සමෝධානිත ආකෘතියක් ලෙස සකස්කර ඇත. මෙම නිපුණතා රාමුව තුළ ගුණාත්මක පාසල් නායකත්ව සහ කළමණාකරණ ප්‍රමිති 64ක් අන්තර්ගත වේ.මෙම නිපුණතා රාමුව ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් මට්ටමින් නිලධාරීන් 1,068ක් මේ වන විට පුහුණු කර ඇත.

## විදුහල්පතිවරුන්ගේ ධාරිතා වර්ධනය - විදේශීය හා දේශීය වැඩසටහන්

- විදුහල්පතිවරුන් අභිප්‍රේරණය සඳහා සහ විදේශීය අත්දැකීම් තුළින් කුසලතා වර්ධනය කිරීම සඳහා විදේශ පුහුණුවට විදුහල්පතිවරුන් යොමු කිරීමේ වැඩසටහන යටතේ විදුහල්පතිවරුන් 200දෙනෙකුට විදේශ පුහුණුව මෙම වසරේ ලබා දී ඇත.
- ඉහත නිපුණතා රාමුව යටතේ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් 500ක් පුහුණු කරන ලදී.

## 3.4 දිගුකාලීන වෘත්තීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

- සියලුම විෂය ක්ෂේත්‍රයන් යටතේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කිරීම සඳහා ගුරුවරුන්, ගුරු උපදේශකවරුන්, විෂය සම්බන්ධීකරණ නිලධාරීන් වෙනුවෙන් කෙටිකාලීන ධාරිතා සංවර්ධන වැඩසටහන් රැසක් ද අධ්‍යාපන අමාත්‍යාංශය අනෙකුත් ආයතන හා ඒකාබද්ධව ක්‍රියාත්මක කරන ලදී. එමෙන්ම උපාධි සහ පශ්චාත් උපාධි පාඨමාලා සඳහා ගුරුවරුන් හා නිලධාරීන් විශ්ව විද්‍යාල වලට යොමුකිරීම ද විදේශ පුහුණුව සඳහා අවස්ථා ලබා දීම ද සිදුකරන ලද අතර ඒ පිළිබඳ විස්තර ඒ ඒ විෂය යටතේ දැක්වේ.
- විශේෂ වශයෙන් සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්, ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධාරීන් හා ජාතික අධ්‍යාපන ආයතනයේ විෂයමාලා සම්පාදකයන් සඳහා පශ්චාත් උපාධි 300ක් ඉදිරි දෙවසරක කාලය තුළ ලබා දීමට සැලසුම්කර අයදුම්පත් කැඳවා ඇත.



# 04.

# සාක්ෂි මත පදනම්ව අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනය හා සැලසුම්කරණය සවිබල ගැන්වීම

## 4.1 සාක්ෂි පදනම් කරගත් අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනය, සැලසුම්කරණය, පර්යේෂණ සහ ප්‍රතිඵල පාදක නියාමනය හා ඇගයීම සවිබල ගැන්වීම

### 4.1.1 සාක්ෂි පදනම් කරගත් අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනය, සැලසුම්කරණය, පර්යේෂණ සහ ප්‍රතිඵල පාදක නියාමනය හා ඇගයීම සවිබල ගැන්වීම

#### සැලසුම්කරණය ක්‍රියාවලිය ශක්තිමත් කිරීම

- "මධ්‍යකාලීන ක්‍රමෝපායික සංවර්ධන සැලැස්ම 2018-2025 "පිළියෙල කර මුද්‍රණය කරන ලද අතර මධ්‍යකාලීන අයවැය රාමුව සහිත මධ්‍යකාලීන සැලැස්ම (2019-2025) සහ වාර්ෂික සැලැස්ම පිළියෙල කර එහි පිටපත් පළාත් හා කලාප කාර්යාල වෙත ලබා දෙන ලදී.
- සාමාන්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා ලෝක බැංකු සහනදායි ණය යටතේ 2012 -2018 ක්‍රියාත්මක වූ දැනුම් කේන්ද්‍රයීය පදනම ලෙස පාසල් අධ්‍යාපනය පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතියේ (TSEP) සමාප්ති වාර්තාව පිළියෙල කිරීම සිදු කරමින් පවතී.
- ලෝක බැංකු ආධාර යටතේ සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය [GEMP-(2018/19-2024)] පිළිබඳ ව සියලු ආයතනවල නිලධාරීන් දැනුවත් කර සැලසුම් සකස් කරන ලද අතර ව්‍යාපෘතිය නිල වශයෙන් ආරම්භ කිරීම ද සිදු විය.
- අධ්‍යාපන අමාත්‍යාංශයේ, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු හා කලාප අධ්‍යාපන කාර්යාලවල සියලුම නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සැලසුම්) භාර නිලධාරීන් 120 දෙනෙකු සඳහා නායකත්ව හා අභිප්‍රේරණ වැඩමුළුවක් පවත්වන ලදී.
- ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා විශාල පරිමාණයේ තක්සේරුකරණය (Large Scale Assessment) භාවිතය පිළිබඳ ව දකුණු ආසියාතික සමුළුව සඳහා නිලධාරීන් සහභාගි කරවන ලදී.
- 2019 වර්ෂය සඳහා සැලසුම් කර ඇති ව්‍යාපෘති සහ වැඩසටහන් අතර පාසල් සැලසුම් මාර්ගෝපදේශ සංග්‍රහය යාවත්කාලීන කිරීම,පාසල් ව්‍යුහ කටයුතු පිළිබඳ චක්‍රලේඛය හා මාර්ගෝපදේශ අත්පොත යාවත්කාලීන කිරීම, සියළුම පළාත් හා කලාප සැලසුම් නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය ප්‍රධාන වේ.
- සාමාන්‍ය අධ්‍යයන ක්ෂේත්‍ර සඳහා අන්තර්ජාතික ආධාර ලබා ගැනීම සඳහා ලෝක බැංකුව (WB) ආසියානු සංවර්ධන බැංකුව (ADB), යුනිසෙෆ්, ජර්මන් රජය (GIZ), කොරියානු ආධාර (KOICA), ජපන් ආධාර (JICA), යුනෙස්කෝ, පොදු රාජ්‍ය මණ්ඩලය (COL) ආදී ආයතන සමග සාකච්ඡා පැවැත්වීම සිදු කරන ලදී.
- තෙවසරක අධ්‍යාපන ප්‍රගතිය හා අනාගත දිශානතිය විදහා දක්වන "ඉගෙනුම - අධ්‍යාපන පොරොන්දු යථාර්තයක් බවට" ග්‍රන්ථය හා අධ්‍යාපන සංවර්ධන කාර්යය ඇතුළත් "පෙරළියක ඇරඹුම - අධ්‍යාපන පොරොන්දු යථාර්තයක් බවට" යන ග්‍රන්ථ මුද්‍රණය කර බෙදාහරින ලදී.

#### අධ්‍යාපන දත්ත පද්ධති වැඩිදියුණු කිරීම

- ජාතික අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය (NEMIS) පලාත් අධ්‍යාපන කාර්යාල 09 හි හා කලාප කාර්යාලයන්හි ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත. ප්‍රථමයෙන් දිවයිනේ සියළුම ගුරුවරුන්ගේ තොරතුරු කලාප හරහා ඇතුළත් කිරීමට පියවර ගෙන ඇති අතර එය අවසන් අදියරේ පවතී.
- 01/2016 චක්‍රලේඛයට අනුව ජාතික පාසල් 353ක් සඳහා අනුමත ගුරු සංඛ්‍යාව නිර්ණය කිරීම හා ගුරු පුරප්පාඩු පවතින විෂයයන් පාසල් පාදක ව හඳුනාගෙන නව ගුරුභවතුන් බඳවා ගැනීමට අවශ්‍ය තොරතුරු සැපයීම සිදු කර ඇති අතර චක්‍රලේඛය සංශෝධනය සඳහා අදහස් ලබා ගැනීමට ද කටයුතු කරන ලදී.
- GPS තාක්ෂණය භාවිතයෙන් රජයේ පාසල් භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) තුළ ස්ථානගත කර දිස්ත්‍රික් වශයෙන් සිතියම් යාවත්කාලීන කිරීමට පියවර ගෙන ඇත.
- ජාත්‍යන්තර දත්ත පාදක සඳහා සහ තිරසර සංවර්ධන අරමුණු නියාමනය සඳහා ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය පිළිබඳ දත්ත යුනෙස්කෝ, UIS ආයතන වෙත ඉදිරිපත් කිරීමට පියවර ගෙන ඇති අතර අධ්‍යාපන අමාත්‍යාංශයේ වෙබ් අඩවියට ද ඇතුළත් කිරීමට පියවර ගෙන ඇත.

- ඉහත වැඩසටහන් සමඟ 2019 දී මාර්ගගත (on-line) අධ්‍යාපන දත්ත පද්ධතියක් සැකසීමට සැලසුම් කර ඇත.

අධ්‍යාපන පර්යේෂණ තුළින් අධ්‍යාපන සංවර්ධනය

- පළාත් පර්යේෂණ ජාලය සවිමත් කිරීම සඳහා නිලධාරීන් දැනුවත් කිරීම් සිදු කරන ලද අතර මධ්‍යම හා වයඹ පළාත්වල පර්යේෂණ එළි දැක්වීම් සිදු කරන ලදී.
- උසස් පෙළ ව්‍යාපෘති පිළිබඳව ගුරුවරුන් 91 දෙනෙකු දැනුවත් කරන ලදී.
- ක්‍රියා මූලික පර්යේෂණ පිළිබඳ ව ගුරුවරුන් 100ක් දැනුවත් කර පර්යේෂණ සාර්ථකව නිම කරන ලද ගුරුවරුන් 8 දෙනෙකු සඳහා රු.5,000 බැගින් පර්යේෂණ දීමනාවක් ලබා දෙන ලදී.
- අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිද්ධි අධ්‍යයනයට අදාළව නිලධාරීන් 12 දෙනෙකු සඳහා පාඨමාලාව අවසන් කරන ලදී.
- පර්යේෂණ ප්‍රදානයන් ලබා දීම සඳහා ලැබුණු යෝජනා 48 අතරින් තෝරා ගත් 9 දෙනෙකුට පර්යේෂණ පිරිවැයෙන් 10%ක් බැගින් ලබා දෙන ලදී.
- අධ්‍යාපන පර්යාවලෝක සඟරාව සකස් කර එහි පිටපත් 1500ක් මුද්‍රණය කරන ලදී.
- පර්යේෂණ ක්‍රමවේද පිළිබඳ විශ්ව විද්‍යාල පාඨමාලා සඳහා අධ්‍යාපන ක්ෂේත්‍රයේ පර්යේෂකයින් 105 දෙනෙකු යොමු කරන ලදී.
- අන්තර් ජාතික පර්යේෂණ සමුළුවක් පස්දුන් රට අධ්‍යාපන විද්‍යාපීඨයේ දී 2018.11.30වන දින පවත්වන ලදී.
- පාසල් ක්ෂේත්‍රයේ පර්යේෂණ ප්‍රවර්ධනය සඳහා පාසල් පර්යේෂණ දිනය පැවැත්වීමට පියවර ගන්නා ලදී.

## 4.2 අධ්‍යාපනයේ කාර්යසාධනය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම

### 4.2.1 අධ්‍යාපනයේ කාර්යසාධනය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

අධ්‍යාපනයේ කාර්ය සාධනය පිළිබඳව සකස් කරනු ලබන වාර්තා අධ්‍යාපන අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය යටතේ ප්‍රකාශයට පත් කිරීම තුළින් මහජනතාවට දැනගැනීම සඳහා අවස්ථාව සලසා ඇත. එමෙන් ම විභාග දෙපාර්තමේන්තුව විසින් විභාග කාර්යසාධනය පිළිබඳ වාර්තා ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ. ඒ සමග ම වරින් වර පවත්වනු ලබන මාධ්‍ය සාකච්ඡා මගින් හා මාධ්‍ය දැනුවත් කිරීම් තුළින් මහජනතාවට තොරතුරු සපයනු ලැබේ.

## 4.3 ආංශික සබඳතා ස්ථාපිත කිරීම

### 4.3.1 ආංශික සබඳතා ස්ථාපිත කිරීම

පාසල් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක වන අවස්ථාවල ඊට සමගාමීව වෘත්තීය අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයන් හි සිදු විය යුතු වෙනස්කම් පිළිබඳ ව අදාළ ආයතන සමග සාක්ච්ඡා කර තීරණ ගැනීමට කටයුතු කර ඇත. විශේෂයෙන් මෑත කාලීන ව ක්‍රියාත්මක කළ 13 වසරක අධ්‍යාපන වැඩසටහන යටතේ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිසම හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය සමග නිරන්තර සබඳතා පවත්වා ගනිමින් ශිෂ්‍යයන් වෘත්තීය අධ්‍යාපනය කරා යොමු කිරීමට හා NVQ 4 සහතිකය ලබා දීමට අවශ්‍ය කටයුතු කර ඇත.



# 05.

## අධ්‍යාපන සංවර්ධනය සඳහා වන අවබෝධතා ගිවිසුම් සහ ක්‍රියාත්මක වන විදේශාධාර ව්‍යාපෘති

## 5.1 අධ්‍යාපන සංවර්ධනය සඳහා වන අවබෝධතා ගිවිසුම්

**I උතුරු පළාතේ පාසල් 27ක් ගොඩනැංවීම - 2015**

මෙම ව්‍යාපෘතිය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ ඉන්දියානු රජය අවබෝධතා ගිවිසුමක් ඇතිකර ගන්නා ලදී. 2015 සැප්තැම්බර් 15 දින ඇතිකර ගන්නා ලද මෙම ගිවිසුමේ අරමුණ වූයේ, උතුරු පළාතේ පාසල් 27ක අලුත්වැඩියාවන් හා ප්‍රතිසංස්කරණ කටයුතු සම්පූර්ණ කිරීමයි. මේ වනවිට පාසල් 08ක කටයුතු අවසන් කරඇති අතර ඉතිරි පාසල් 19 ප්‍රතිසංස්කරණ කටයුතු සිදුවෙමින් පවතී.

**II පොළොන්නරුව බහු ජාතික ත්‍රෛභාෂා ද්විතියික පාසල ඉදිකිරීම - 2017**

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සිංහල,දෙමළ හා මුස්ලිම් සිසුන්ට බහු ජාතික, බහු සංස්කෘතික පරිසරයක් යටතේ ඉගෙනුම් අවස්ථා තහවුරු කිරීමේ අරමුණින් ත්‍රෛභාෂා ද්විතීයික පාසලක් ඉදිකිරීම සඳහා මෙම අවබෝධතා ගිවිසුම, ඉන්දියානු රජය සමඟ ඇතිකරගෙන තිබෙන අතර ඉදිකිරීම් මේ වන විට ක්‍රියාත්මක වේ.

**III පුස්සැල්ලාව සරස්වතී මධ්‍ය විද්‍යාලය දියුණු කිරීම - 2017**

ප්‍රමාණවත් පහසුකම් සපයමින් වතුකරයේ පාසල් දරුවන්ගේ අධ්‍යාපනයේ ගුණාත්මකබව ඉහළ නැංවීමේ අරමුණින් මෙම අවබෝධතා ගිවිසුම ඉන්දියානු රජය සමඟ අත්සන් කරන ලදී.මේ වනවිට ඉදිකිරීම් සඳහා කොන්ත්‍රාත් කටයුතු භාර දී තිබේ.

**IV තාක්ෂණ විෂය සඳහා වන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය ඉදිකිරීම - 2017**

මෑතකදී උසස්පෙළ විෂය ධාරාව සඳහා හඳුන්වාදුන් තාක්ෂණ විෂය ධාරාව තව දුරටත් බලගැන්වීම උදෙසා තාක්ෂණ විෂය ධාරාව සඳහා වෙන් වූ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක් කුලියාපිටියේ ගොඩ නැංවීම, මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කෙරේ.

කොරියානු ජනරජයට අනුබද්ධිත අන්තර්ජාතික කොරියානු සහායෝගීතා ඒජන්සිය (KOICA) සමඟ අධ්‍යාපන අමාත්‍යාංශය මෙම ව්‍යාපෘතිය සඳහා අවබෝධතා ගිවිසුමට පැමිණ ඇත.විද්‍යාපීඨය ඉදිකිරීමට අපේක්ෂිත ඉඩමේ මැනුම් කටයුතු මේ වනවිට අවසන්වී ඇති අතර සැලසුම් නිර්මාණ කටයුතු මේ වනවිට ආරම්භ වී ඇත.

**V අන්තර්කරණ අධ්‍යාපනය හරහා විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන්ගේ අධ්‍යාපනය බලගැන්වීම - 2017**

විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන්ගේ පාසල් පැමිණීම ඉහළ නැංවීම හා විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන්ට ඉගැන්වීම් කටයුතු සිදුකරන ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධනය කිරීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ.අන්තර්ජාතික ජපන් සහයෝගීතා ඒජන්සිය (JICA) සමඟ අධ්‍යාපන අමාත්‍යාංශය අවබෝධතා ගිවිසුමකට පැමිණ ඇත.මේ යටතේ ගුරු පුහුණු වැඩසටහන් හා දැනුවත් කිරීමේ වැඩසටහන් 2019 දී පැවැත්වීමට අපේක්ෂා කෙරේ.

**VI හැටන් ප්‍රදේශයේ වතු ආශ්‍රිත ළමුන්ගේ අධ්‍යාපනය බලගැන්වීම - 2017**

වතු ආශ්‍රිත දරුවන්ගේ ස්වාධීන ඉගෙනුම් අවස්ථා ඉහළ නැංවීමේ අරමුණින් ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය තුළ, පාසල් කාලයෙන් පසුව ඉගෙනුම් සහය සපයන වැඩසටහන් පැවැත්වීම සිදුවේ. ඒ අනුව නුවර එළිය දිස්ත්‍රික්කයේ හැටන් ප්‍රදේශයේ තිල්ලාරි, දරවැල්ල, ඉන්ජෙස්ට්‍රි යන වතු 03 පදනම් කරගෙන මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

2017වසරේ සිට වසර 03ක් තුළ ක්‍රියාත්මක කෙරෙන මෙම ව්‍යාපෘතියේ මූල්‍යමය වටිනාකම රු.මිලියන 6.5කි. අන්තර්ජාතික ජපන් සහයෝගීතා ඒජන්සිය සමඟ ඇතිකර ගෙන ඇති මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී උට්සුනොමියා ජපන් විශ්ව විද්‍යාලය (Utsunomiya University) හා ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සම්බන්ධ වේ.මෙම වැඩසටහන යටතේ ඉගෙනුම් ආධාරක, ලිපි ද්‍රව්‍ය හා ටැබ්ලට් පරිගණක යන්ත්‍ර සිසුන්ට ලබාදීම සිදුවේ.

**VII වෘත්තීය අධ්‍යාපනය හා පුහුණුව සඳහා ෆින්ලන්ත ආධාර වැඩසටහන - 2018**

නවීන අධ්‍යාපන ක්‍රමවේද ඔස්සේ මෙරට සිසුන්ගේ අධ්‍යාපනයේ ගුණාත්මක බව උසස් කිරීමට අදාළ නව ප්‍රතිපත්තීන් සහ සැලසුම් පිළිබඳව අදහස් සහ යෝජනා අධ්‍යාපන අමාත්‍යාංශය ෆින්ලන්ත රජය සමඟ සාකච්ඡා කරන ලද අතර එහිදී, මෙරට තාක්ෂණික සහ වෘත්තීය අධ්‍යාපනය දියුණු කිරීමට අවශ්‍ය සහයෝගය ලබාදීමට කැමැත්ත පළ කරන ලදී. මේ වන විට ක්‍රියාත්මක කර ඇති 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන සඳහා ෆින්ලන්ත රජයේ සහය ලබා දීමටත් ඒ අනුව, තාක්ෂණික, වෘත්තීය සහ

තොරතුරු තාක්ෂණය ඇතුළු විවිධ විෂය පථයන් දියුණු කිරීම සඳහා ෆින්ලන්ත රජයේ මැදිහත් වීම ඉදිරියේ දී ලබා දීමටත් නියමිතය.

### VIII කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පාසල් අධ්‍යාපනය නගා සිටුවීම - 2018

ගැටුම් පැවතීම හේතුවෙන් පසුබෑමට ලක් වූ කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පාසල්වල අධ්‍යාපන කටයුතු නගා සිටුවීම සඳහා දකුණු කොරියාවේ කොයිකා (KOICA) ආයතනය රුපියල් මිලියන 1,200කට ආසන්න මුදලක් පරිත්‍යාගයක් ලෙස ලබාදීමට තීරණය කර තිබේ.

මේ යටතේ කිලිනොච්චි දිස්ත්‍රික්කයේ තෝරාගත් පාසල්වල ගොඩනැගිලි හා විශේෂ පන්ති කාමර ඉදිකර ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපන පරිසරය දියුණු කිරීමට සැලසුම් කර ඇති අතර විදුහල්පතිවරුන්, ගුරු උපදේශකවරුන් සහ අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සඳහා දේශිය හා විදේශීය පුහුණු අවස්ථා ලබාදීමටත් මීට අමතරව මාපියන් සහ ජනතාව දැනුවත් කිරීමේ කටයුතු සිදු කිරීමටත් සැලසුම් කර තිබේ.

### IX OFID ආයතන ණය ආධාර යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත තාක්ෂණික අධ්‍යාපන සංවර්ධන වැඩසටහන් – 2018

අන්තර්ජාතික සංවර්ධනය සඳහා OPEC අරමුදල (OFID) හා අධ්‍යාපන අමාත්‍යාංශය මෙම අවබෝධතා ගිවිසුමට අත්සන්කොට ඇත. මෙම වැඩසටහන යටතේ ශ්‍රී ලංකාවේ තාක්ෂණික අධ්‍යාපන සංවර්ධනය අපේක්ෂා කෙරේ.

අ.පො.ස උසස් පෙළ සඳහා හඳුන්වා දුන් තාක්ෂණවේදය විෂය ධාරාව හා 13 වසරක අනිවාර්ය අධ්‍යාපන ප්‍රතිපත්ති යටතේ හඳුන්වාදෙනු ලැබූ වෘත්තීය විෂයන් සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීම සඳහා තාක්ෂණ අධ්‍යාපන සංවර්ධන වැඩසටහන් ලෙස මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ.ඒ සඳහා OPEC ණය ආධාර යටතේ ඇමරිකානු ඩොලර් මිලියන 50ක ණය මුදලක් OFID ආයතනයෙන් ලබාදීම සිදු වේ.

### X සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය (GEMP) - 2018

ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහල නැංවීම හා හිමිකාරීත්වය සවිමත් කිරිම ප්‍රධාන අරමුණ කර ගනිමින් මෙම ව්‍යාපෘතිය ලෝක බැංකු ණය ආධාර යටතේ ක්‍රියාත්මක වේ.ව්‍යාපෘති කාලසීමාව 2018.10.09 සිට 2024 දක්වා වන අතර ඇමරිකානු ඩොලර් මිලියන 100ක ආයෝජනයක් මේ යටතේ සිදු කෙරේ. විෂය මාලා නවීකරණය හා විවිධාංගීකරණය, ගුරු සංවර්ධනය, පාසල් පද්ධතියේ හා ශිෂ්‍ය සාධනයේ ගුණාත්මකබව තහවුරුව, අධ්‍යාපන නායකත්වය හා කලමනාකරණය ශක්තිමත් කිරීම, සමාජ සමානත්වය හා අන්තර්කරණය ප්‍රවර්ධනය,මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන සංරචක වේ.

### XI පාසල්වල ඉංග්‍රීසි ඉගැන්වීම සඳහා ඇමෙරිකානු ස්වෙච්ඡා නිලධාරීන්ගේ (US Peace Corps) සහාය ලබා ගැනීම - 2018

මේ පිළිබඳව වන අවබෝධතා ගිවිසුම අත්සන් තැබීම Peace Corps ශ්‍රී ලංකා අධ්‍යක්ෂ හා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් අතර සිදු වූ අතර 2019 වර්ෂයේ සිට එම නිලධාරීන් ශ්‍රී ලංකාවට පැමිණීමට නියමිතය.

### XII තොරතුරු තාක්ෂණ ගුරු පුහුණුව සඳහා කොරියානු ජනරජයේ ග්වැන්ජු මෙට්‍රොපොලිටන් ආයතනයේ සමයෝගීතාව - 2018

කොරියාවේ ග්වැන්ජු මෙට්‍රොපොලිටන් ආයතනයේ දී සෑම වසරකම ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණ ගුරුවරුන්ට හා නිලධාරීන්ට පුහුණුව ලබා දීම සඳහා වන ගිවිසුම 2020 දක්වා වන පරිදි නැවත අලුත් කර අත්සන් තැබීමට කටයුතු කරන ලදී.



ෆින්ලන්ත රජය සමග ගිවිසුමක් අත්සන් කිරීම




KOICA ආයතනය සමග අවබෝධතා ගිවිසුම අත්සන් තැබීම

## 5.2 විදේශ ආධාර ව්‍යාපෘති

**I යුනිසෙෆ් ආධාර යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති**

යුනිසෙෆ් ආයතනය හා අධ්‍යාපන අමාත්‍යාංශය එක්ව සකස්කර ඇති වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව අධ්‍යාපන අමාත්‍යාංශය රු.මි.6.0ක හා ජාතික අධ්‍යාපන ආයතනය රු.මි.16ක ලෙස රු.මි.22ක වැඩසටහන් ක්‍රියාත්මක වේ.පෙර පාසල් අධ්‍යාපන ප්‍රතිපත්තිය සමාලෝචනය,ප්‍රාථමික අධ්‍යාපනයේ බහුවිධ මට්ටම් ඉගැන්වීම බලගැන්වීම,මෘදු කුසලතා සංවර්ධනය සඳහා ක්‍රියාකාරකම්,කුඩා ක්‍රීඩා (Mini Games) ක්‍රියාත්මක කිරිමට ජාතික රාමුවක් සංවර්ධනය කිරිම හා පරිවර්තීය කුසලතා (Transversal Skills) ප්‍රචලිත කිරීම සඳහා පර්යේෂණ සම්මන්ත්‍රණයක් පැවැත්වීම යන ක්‍රියාකාරකම් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ද විනෝද ක්‍රීඩා මඟින් සමාජ සංහිඳියාව ප්‍රචලිත කිරීම, 3 හා 4 ශ්‍රේණි සඳහා අත්‍යාවශ්‍ය ඉගෙනුම් නිපුණතා සංවර්ධනය,සංගීතය ඇසුරින් සමාජ සංහිඳියාව, ගැටලු විසඳීම, දේශගුණික විපර්යාස, පාසල් සිසු ආරක්ෂාව යන කරුණු ප්‍රාථමික අධ්‍යාපන විෂය මාලාවට ඇතුළත් කිරීම ජාතික අධ්‍යාපන ආයතන යටතේ ද ක්‍රියාත්මක වේ.

**II යුනෙස්කෝ ආධාර යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති**

අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව හරහා 2018 වසරට අදාළව රු.මිලියන 14.8ක වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

2017 වසරේ ගං වතුරින් හානියට පත් වූ පාසල් 17ක් සඳහා අවශ්‍ය වන විද්‍යාගාර උපකරණ හා අවශ්‍ය රසායනික ද්‍රව්‍ය ලබාදීම සඳහා මෙම වසරේදී කටයුතු කරන ලදී.

ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල උපාධිධාරීන් පිළිබඳ අධ්‍යයනයක් සඳහා යුනෙස්කෝ ආධාර සපයන ලද අතර ඒ හරහා උපාධිධාරීන්ගේ සේවා නියුක්ති අවස්ථා පිළිබඳ තොරතුරු රැස්කර ගැනීමට කටයුතු කරන ලදී.

කඩොලාන ශාඛ දේශගුණික විපර්යාස සඳහා ඔරොත්තු දියහැකි පරිදි වර්ධනය කිරීම සඳහා පර්යේෂණ හා පුහුණු කිරීම් කටයුතු සඳහා ආධාර ලබාදීම, ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සම සාධාරණත්වය දිරිගැන්වීම සඳහා හා විශ්ව විද්‍යාල පද්ධතිය තුළ ස්ත්‍රී පුරුෂබව පදනම් කරගත් හිංසනය අවම කිරීම සඳහා රුහුණු හා නැගෙනහිර විශ්වවිද්‍යාල වලට ආධාර සැපයීම මෙම වසරේදී සිදුවිය. "ඉනික්කි ෆෙස්ටා" (Enikki Festa) නැමැති චිත්‍ර තරඟය පාසල් සිසුන් සඳහා පවත්වා ත්‍යාග ලබාදෙන ලදී.

**III දැනුම් කේන්ද්‍රීය පදනම ලෙස පාසල් අධ්‍යාපන පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය (TSEP)**

***ව්‍යාපෘති කාල සීමාව : 2012-2018***
***සමස්ත ආයෝජනය :***
***ඇ.ඩො.මි.100 (ලෝක බැංකු සහන ණය)***
***ඇ.ඩො.මි. 39 (ඔස්ට්‍රේලියා රජය/DFAT)***

ශ්‍රී ලංකාව තුළ දැනුම පදනම් කරගත් ආර්ථික හා සාමාජයීය සංවර්ධනයක් උදෙසා ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනයේ ගුණාත්මකබව හා අධ්‍යාපන ප්‍රවේශය ඉහළ නැංවීම පිණිස (1) ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනය සඳහා ප්‍රවේශය වර්ධනය කිරීම, (11) අධ්‍යාපනයේ ගුණාත්මකබව ඉහළ නැංවීම හා (111) අධ්‍යාපන සේවා සැපයීම හා පාලනය ශක්තිමත් කිරීම යන තේමා 03 යටතේ අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික අධ්‍යාපන ආයතනය, විභාග දෙපාර්තමේන්තුව, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව හා පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ මඟින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

**ව්‍යාපෘතිය මඟින් අත්පත් කරගත් ප්‍රගතිය**

- පාසල් පළමු ශ්‍රේණියට ඇතුළත්වන සිසුන් 11 ශ්‍රේණිය දක්වා රැඳී සිටීමේ අනුපාතය 2012 වර්ෂයේ 82% සිට 2017 වර්ෂයේ 88% දක්වා වැඩි විය. පිරිමි ළමුන්ගේ රැඳී සිටීම 79% සිට 87% දක්වා ද ගැහැණු ළමුන්ගේ රැඳී සිටීම 85% සිට 90% ද වශයෙන් තව දුරටත් මෙම වැඩිවීම දැක්විය හැකිය. සෑම කලාපයක්ම ශිෂ්‍ය සහභාගීත්වය සහ රැඳී සිටීම වැඩි කිරීම සඳහා ගනු ලැබූ පියවර මේ සඳහා දායක විය.
- පාසල් ඉගෙනුම් ප්‍රවර්ධන වැඩසටහන ද්විතියික පාසල් 1000ක සහ ප්‍රාථමික පාසල් 4800ක ක්‍රියාත්මක කරන ලදී.
- විශේෂ අධ්‍යාපන හා නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන් 2013 වර්ෂයේ දී ප්‍රතිසංවිධානය කර 2014 වර්ෂයේ සිට පළාත්වල ක්‍රියාත්මක කිරීමට පියවර ගනු ලැබ ඇත.



TSEP ව්‍යාපෘතිය යටතේ ඉදිකළ හාරිස්පත්තුව කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලය



TSEP ව්‍යාපෘතිය යටතේ ඉදිකළ ගා/බද්දේගම ශා. අන්තෝනි විද්‍යාලයේ ගොඩනැගිල්ලක්

- පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන හා පෝෂණ වැඩසටහන් සෑම කලාපයකම ක්‍රියාත්මක කරන ලදී.
- විධිමත් වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් සකස්කර පාසල්වල 9වන ශ්‍රේණියේ සිට ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත.
- 8වන ශ්‍රේණියේ සිසුන්ගේ ගණිතය,විද්‍යා හා ඉංග්‍රීසි සාධනය පිළිබඳ ජාතික තක්සේරුකරණ වැඩසටහන 2012, 2014 හා 2016 වර්ෂවල ද 4 වන ශ්‍රේණිය සිසුන්ගේ පළමු බස, ඉංග්‍රීසි හා ගණිත සාධනය තක්සේරුකරණ වැඩසටහන 2013 හා 2015 වර්ෂවල ද ක්‍රියාත්මක කරන ලද අතර ඉන් හඳුනා ගන්නා ලද කරුණු ජාතික හා පලාත් මට්ටමේ අධ්‍යාපන සංවර්ධනය සඳහා යොදාගනු ලැබිණි.
- පාසල් පාදක ගුරු සංවර්ධනය සමස්ත ගුරු සංවර්ධන වැඩසටහන්වල ප්‍රධාන අංශයක් ලෙස සාර්ථකව පාසල් පද්ධතිය තුළ ක්‍රියාවට නැංවීමට පියවර ගෙන ඇත.
- 6-13 ශ්‍රේණිවල ද්විභාෂා අධ්‍යාපනය සඳහා විෂය භාෂා සමෝධානික ඉගෙනුම් රාමුවක් ( CLIL) සකස් කර ක්‍රියාත්මක කිරිමට පියවර ගන්නා ලදී.
- ප්‍රාථමික අධ්‍යාපන විෂය මාලාවේ 1 සිට 3 ශ්‍රේණිය දක්වා විෂය මාලාව නවීකරණය කිරීම හා ගුරු මාර්ගෝපදේශ හා ඉගෙනුම් ද්‍රව්‍ය සකස් කිරිම ව්‍යාපෘති අරමුදල් යටතේ සිදුවිය.
- ද්විතියික විෂය මාලාවේ ගණිතය හා විද්‍යා විෂය මාලා නවීන ලෝකයේ ප්‍රවණතා වලට අනුව තාර්කීකරණය, විවිධාංගීකරණය හා උත්ශ්‍රේණිගත කිරීම හා 6 සිට 11 ශ්‍රේණි දක්වා ක්‍රියාත්මත කිරිම සඳහා ව්‍යාපෘතිය දායක විය.
- පාසල් පෙළපොත්වල ගුණාත්මකබව වැඩි කිරිම සඳහා විධිමත් සමාලෝචන ක්‍රියාවලියක් සිදු කිරිමට පියවර ගන්නා ලදී.
- අ.පො.ස.(සා/පෙළ) හා අ.පො.ස.(උ/පෙළ) විෂයන්හි පිළිතුරු ලියා ඇති ආකාරය පිළිබඳව අයිතම විශ්ලේෂණය සිදුකර බෙදාහැරීමට කටයුතු කරන ලදී.
- පාසල් නඟා සිටුවීමේ වැඩසටහන සියලුම පාසල්වල ක්‍රියාත්මක කර පාසල් කලමනාකරණය බලගැන්වීම තුලින් පාසලේ සාධනය ඉහළ නැංවීමට දායකත්වය සපයන ලදී.
- පාසල් නඟා සිටුවීමේ වැඩසටහන හා බද්ධ වන සේ පාසල් තක්සේරුකරණ වැඩසටහන සංවර්ධනය කර සියලුම පාසල්වල ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නා ලදී.
- පාසල් නායකත්වය හා කලමනාකරණ සංවර්ධනය යටතේ සියලුම කලාප වල විදුහල්පතිවරුන් 10,100ක් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පවත්වන ලදී.
- එමෙන් ම පාසල් සංවර්ධන මණ්ඩල, පාසල් සංවර්ධන කමිටු, පාසල් කලමනාකරණ කමිටුවල නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා සෑම කලාපයකම වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

## IV අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන (ESDP)

### අරමුණු

අධ්‍යාපන අමාත්‍යාංශයේ සමස්ත සංවර්ධන සැලැස්ම වන අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව සහ වැඩසටහන (ESDFP) සමග අනුගතව පාසල් දරුවන් වර්තමාන සහ අනාගත රැකියා වෙළඳපොල අවශ්‍යතාව සඳහා උචිත වන අයුරින් බල ගන්වනු වස් ද්විතීයික අධ්‍යාපනය සඳහා අවශ්‍ය නවීකරණය සිදුකිරීම තුළින් ලංකාවේ තරුණ කාන්තා, පුරුෂ රැකියා නියුක්තිය වැඩි කිරීම ESDP වැඩසටහනෙහි මූලික අරමුණ වේ. ප්‍රතිඵල පාදක ණය (Results Based Lending - RBL) ක්‍රමය යටතේ මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ.

***වැඩසටහන් කාලය - 2013-2018***
***ණය මුදල - ඇ.ඩො.මි. 200***
***සංශෝධිත ණය මුදල - ඇ.ඩො.මි. 180***

සමස්ත අධ්‍යාපනයේ ගුණාත්මකබව ඉහළ දැමීම ඉලක්ක කරගනිමින් මූල්‍ය ප්‍රේෂණය හා බැඳි ප්‍රතිඵල ඉලක්ක (DLR) 09ක් හා ප්‍රතිඵල පාදක දර්ශක 32ක් පිහිටුවා ඇති අතර ඒ සඳහා සකස් කරනු ලබන සැලසුම් හා ඉලක්ක ඇතිකර ගනිමින් පාසල්, කලාප, පළාත්, අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික අධ්‍යාපන ආයතනය, විභාග දෙපාර්තමේන්තුව යනා දී ප්‍රධාන පාර්ශවකරුවන් සියලු දෙනා සම්බන්ධ කරගනිමින් වැඩසටහන ක්‍රියාත්මක වේ.

### මේ දක්වා ප්‍රගතිය

- පාසැල්වල අ.පො.ස.(උ/පෙළ) තාක්ෂණික විෂය ධාරාව ආරම්භ කිරීමට අවශ්‍ය තාක්ෂණ පීඨ 285ක් ඉදිකිරීම සහ අවශ්‍ය ලී බඩු, විද්‍යාගාර උපකරණ ලබාදීම මෙම වැඩසටහන යටතේ සිදුවිය.
- තාක්ෂණික පීඨවල අසමාන ව්‍යාප්තිය අවම කිරීම සඳහා නව තාක්ෂණික පීඨ 35ක් 2016 වර්ෂයේ දී ඉදිකිරීම ආරම්භ කළ අතර මේ වනවිට 90% පමණ වැඩ අවසන් කර ඇත. 2017 වර්ෂයේ තාක්ෂණික විෂය ධාරාව සඳහා ගුණාත්මක සංවර්ධන සැලැස්මක් සකස් කරන ලද අතර ඒ අනුව වාර්ෂික මූල්‍ය ප්‍රතිපාදන වෙන්කර ඇත.
- මෙම පීඨවල නඩත්තු කටයුතු සඳහා සෑම වර්ෂයකම ගොඩනැගිලි,උපකරණ නඩත්තු අරමුදලක් මූල්‍ය ප්‍රදානයක් ලෙස 2016 වර්ෂයේ සිට සෑම පාසලකටම ලබාදීම සිදුවිය. එම අරමුදල 2018 වර්ෂයේ සිට උපකරණ නඩත්තු අරමුදලක් ලෙස ප්‍රගතිය පදනම් කරගෙන ලබා දේ.
- IC වර්ගයේ එනම් අ.පො.ස.(උ/පෙළ) පන්ති සහිත එහෙත් විද්‍යා ධාරාව නොමැතිව පැවති පාසල් 255ක අලුතින් අ.පො.ස.(උ.පෙළ) විද්‍යා විෂය ධාරාව ආරම්භ කිරීමට අවශ්‍ය පහසුකම් සලසාදෙන ලදී.
- විදුහල්පතිවරුන් 692ක් හා නියෝජ්‍ය විදුහල්පතිවරුන් 783ක් සඳහා දින 10ක පුහුණු වැඩසටහනක් අදියර 2ක් යටතේ ක්‍රියාත්මක කිරීමට පියවර ගනු ලැබිණි.
- පාසල් නායකත්වය හා කලමනාකරණය සඳහා ජාතික නිපුණතා රාමුව (National Competency Framework for School Leadership & Management) (NCFSLM) සකස්කර ක්‍රියාත්මක කිරීම සඳහා තාක්ෂණික හා මූල්‍ය සහාය ලබා දෙන ලදී.
- අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන් සහ පළාත් නිලධාරීන් 600ක් සඳහා ප්‍රසම්පාදන කාර්යක්ෂමතාව හා විනිවිදභාවය වැඩිදියුණු කිරීම



ESDP යටතේ උසස් පෙළ තාක්ෂණ විෂය ධාරාව සඳහා පහසුකම් සැලසීම



ESDP යටතේ පැවැත් වූ විදුහල්පති ධාරිතා සංවර්ධන වැඩසටහන් කිහිපයක්

සඳහා ඉලක්කගත පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට පියවර ගනු ලැබිණි.

- තාක්ෂණික විෂය ධාරාව වැඩිදියුණු කිරීම සඳහා පුළුල් තාක්ෂණික පර්යේෂණ අධ්‍යයනයක් කොළඹ විශ්ව විද්‍යාලයේ ජාතික අධ්‍යාපන පර්යේෂණ හා ඇගයීම් මධ්‍යස්ථානය මඟින් ක්‍රියාත්මක කරවාලීමට කටයුතු කරන ලදී.
- අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස. (උ.පෙළ) විභාග ප්‍රතිඵල වැඩිදියුණු කිරීම සඳහා සියලු පාර්ශවකරුවන් අතර දැනුවත්භාවය ඇතිකරමින් ඊට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නා ලදී.
- ප්‍රාථමික හා ද්විතියික සිසුන්ගේ ඉගෙනුම් ප්‍රතිඵල වැඩි දියුණු කිරීම අරමුණු කර ගනිමින් ගණිතය ඉගැන්වීම් හා ඉගෙනීමේ දුර්වලතා හඳුනාගෙන එම දුර්වලතා මගහැරවීම සඳහා ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධනය කිරීම සඳහා තාක්ෂණික සහාය ලබාදීමට පියවර ගෙනඇත.
- ඒ අනුව සමස්ත ආයෝජනයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 179ක මුදලක් මේ වනවිට අත්පත් කර ගෙන ඇත.එය රුපියල් මිලියන 27,745ක් වන අතර 99%ක ප්‍රගතියකි.

## V. සමාජ සංහිඳියාව සඳහා අධ්‍යාපනය (GIZ-ජර්මන් රජයේ ආධාර)

සමාජ සංහිඳියාව සඳහා අධ්‍යාපනය වර්තමාන ව්‍යාපෘතිය 2016-2019 කාල සීමාව තුල ක්‍රියාත්මක කෙරේ.තෝරාගත් නියාමක පාසල් 200ක සමාජ සංහිඳියාව සඳහා අධ්‍යාපන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ධාරිතාව වර්ධනය කර අනෙක් පාසල් සමඟ සම්බන්ධීකරණය කර වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සහාය ලබාදේ. ජාතික අධ්‍යාපන ආයතනයේ කථිකාචාර්යවරුන් පුහුණු කිරීම හා 6-10 ශ්‍රේණිවල විෂය මාලාවේ හා පෙළ පොත්වල සාම හා සාරධර්ම අධ්‍යයනය අන්තර්ගත කිරීමට සහාය ලබාදී ඇත.සිංහල, දෙමළ, මුස්ලිම් ළමුන් සිටින පාසල් අතර ශිෂ්‍ය හුවමාරු වැඩසටහන් පැවැත්වීම, දෙවන ජාතික භාෂා, ගුරු පුහුණුව, පාසල්වල මනෝ සාමාජීය උපදේශනය සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීම ආදී කාර්යයන් සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයට හා ජාතික අධ්‍යාපන ආයතනයට මෙම ව්‍යාපෘතිය මඟින් සහාය ලබාදේ.



# 06.

# භෞතික හා මූල්‍ය ප්‍රගතිය

## 6.1 පුනරාවර්තන වියදම් සාරාංශය

6.1.1 වගුව : **අධ්‍යාපන අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ පුනරාවර්තන වියදම් (රු.මිලියන)**

| ශීර්ෂය | වැඩසටහන | 2018 සංශෝධිත ඇස්තමේන්තුව | 2018.12.31 දිනට වියදම |
|---|---|---|---|
| 126 - 1- 1 | අමාත්‍ය කාර්යාලය | 27.60 | 27.43 |
| 126 - 1- 2 | **පරිපාලන හා ආයතනික සේවා** | 990.18 | 1,097.54 |
| | පාසල් පෝෂණ වැඩසටහන | 6,300.00 | 5,325.31 |
| | පාසල් නිල ඇඳුම් | 2,600.00 | 1,072.58 |
| | දුෂ්කර පාසල් සිසුන්ට සපත්තු | 640.00 | 219.71 |
| | පෙළපොත් | 4,800.00 | 4,160.88 |
| | කිරි වීදුරුවක් ලබා දීම | 525.00 | 482.23 |
| | 5 ශ්‍රේණිය ශිෂ්‍යාධාර | | 310.27 |
| | සුහග ශිෂ්‍යත්ව වැඩසටහන | | 25.47 |
| | පාසල් සිසු රක්ෂණාවරණය | 2,700.00 | 33.47 |
| | සුජාත දියණි හා තාක්ෂණවේදය ශිෂ්‍යත්ව | | 13.28 |
| | ජාතික අධ්‍යාපන ආයතනය | 430.00 | 416.00 |
| | ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය | 140.00 | 141.41 |
| | UNESCO වැඩසටහන් | 20.00 | 17.61 |
| 126 - 1 - 11 | ආයතනික කාර්යයන් | 27.90 | 25.43 |
| 126 - 2 - 3 | ප්‍රාථමික අධ්‍යාපනය | 4,480.50 | 4,153.94 |
| 126 - 2 - 4 | ද්විතීයික අධ්‍යාපනය | 27,458.00 | 21,711.39 |
| 126 - 2 - 5 | විශේෂ අධ්‍යාපනය | 5,273.80 | 5,293.29 |
| 126 - 2 - 6 - 1 | ගුරු විද්‍යාල සහ ගුරු මධ්‍යස්ථාන | 305.60 | 314.57 |
| 126 - 2 - 6 - 2 | ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ | 1,819.29 | 1,761.48 |
| 126 - 2 - 8 | ජාතික උරුමයන් පිළිබඳ ආයතන | 142.5 | 108.60 |
| | **මුළු එකතුව** | **58,680.37** | **46,711.98** |

**මූලාශ්‍රය : මුදල් ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය**

## 6.2 ප්‍රාග්ධන වියදම් සාරාංශය

**6.2.1 වගුව : අධ්‍යාපන අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ ප්‍රාග්ධන වියදම් (රු.මිලියන)**

| වැඩසටහන | 2018 ඇස්තමේන්තුව (රු.මි.) | 2018.12.31 දිනට වියදම (රු.මි.) |
|---|---|---|
| **ආයතන හා පරිපාලන කටයුතු** | | |
| අධ්‍යාපන අමාත්‍යාංශය | 314.70 | 282.60 |
| ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය | 20.00 | 18.00 |
| ජාතික පුස්තකාලය නවීකරණය | 85.20 | 81.81 |
| ජාතික අධ්‍යාපන ආයතනය | 200.00 | 108.00 |
| **ප්‍රාථමික අධ්‍යාපනය** | | |
| ජාතික පාසල්වල ප්‍රාථමික අංශ සංවර්ධනය | 175.00 | 73.41 |
| ආරක්ෂක සේවා විද්‍යාල | 369.00 | 93.07 |
| **ද්විතීයික අධ්‍යාපනය** | | |
| ජාතික පාසල්වල ද්විතීයික අංශ සංවර්ධනය | 2,081.21 | 1,893.36 |
| ක්‍රීඩා පාසල් සංවර්ධනය | 80.00 | 27.10 |
| උසස් පෙළ සිසුන්ට ටැබ් පරිගණක ලබා දීම | 4,000.00 | - |
| මානව සම්පත් සංවර්ධනය | 80.00 | 54.88 |
| **විශේෂ අධ්‍යාපනය** | | |
| විශේෂ අධ්‍යාපන ඒකක සංවර්ධනය | 185.00 | 78.65 |
| ආබාධිත සිසුන්ගේ අධ්‍යාපනය බලගැන්වීම | 30.00 | 6.33 |
| විශේෂ අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය | 225.00 | 102.42 |
| විශේෂ අධ්‍යාපන ගුරු පුහුණු පහසුකම් දියුණු කිරීම | 25.00 | - |
| පිරිවෙන් අධ්‍යාපනය බලගැන්වීම | 185.00 | 73.24 |
| **ගුරු සංවර්ධන රාමුව** | | |
| ගුරු විද්‍යාල හා ගුරු මධ්‍යස්ථාන සංවර්ධනය | 446.33 | 368.05 |
| ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සංවර්ධනය | 1,336.00 | 704.37 |
| අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන | 1,185.27 | 748.19 |
| ඉංග්‍රීසි ගුරු පුහුණු මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම | 50.00 | 0.04 |
| **සාමාන්‍ය අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘති - විදේශ ආධාර** | | |
| යුනෙස්කෝ ක්‍රියාකාරකම් | 14.80 | 13.78 |
| TESP ව්‍යාපෘතිය (GoSL/WB) | 259.00 | 250.99 |
| යුනිසෙෆ් වැඩසටහන් (GOSL/UNICEF) | 22.00 | 22.00 |
| සමාජ ඒකාබද්ධතාව සඳහා අධ්‍යාපනය (GoSL/GIZ) | 1.00 | 0.88 |
| උතුරු පළාතේ පාසල් 27ක් ප්‍රතිසංස්කරණය (GoSL/India) | 170.00 | 150.00 |
| පොළොන්නරුව බහුජාතික ත්‍රිභාෂා පාසල ගොඩනැංවීම (GoSL/India) | 230.00 | 118.47 |
| පුස්සැල්ලාව සරස්වතී ම.වි.දියුණු කිරීම (GoSL/India) | 69.00 | 18.58 |
| තාක්ෂණ විද්‍යාපීඨයක් ඉදිකිරීම (GoSL/KOICA) | 439.60 | - |
| UNFPA පුහුණු වැඩසටහන | 6.00 | 2.08 |
| FAO පුහුණු වැඩසටහන | 6.50 | 4.28 |
| **සාමාන්‍ය අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘති - දේශීය අරමුදල්** | | |
| පළාත් හා කලාප තොරතුරු තාක්ෂණ සම්පත් මධ්‍යස්ථාන | 110.00 | 43.31 |
| අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන | 3,276.50 | 1,983.65 |
| ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා | 300.00 | 99.08 |
| අයහපත් කාලගුණයෙන් විනාශ වූ පාසල් ප්‍රතිසංස්කරණය | 1,000.00 | 602.91 |
| නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ | 3,841.23 | 2,140.94 |
| ගුණාත්මක ඉගෙනීමක් සඳහා ඉගෙනුම් උපකරණ සැපයීම | 500.00 | 6.50 |
| තොරතුරු තාක්ෂණ අධ්‍යාපනය | 23.00 | 18.35 |
| සුහුරු පන්ති කාමර ඉදිකිරීම | 507.00 | 0.29 |
| ඩිජිටල් අධ්‍යාපනය | 225.00 | 51.11 |
| **ළඟම පාසල හොඳම පාසල වැඩසටහන** | | |
| පාසල්වලට විදුලිය සැපයීම | 100.00 | 99.38 |
| දන්ත සෞඛ්‍ය පහසුකම් දියුණු කිරීම | 120.00 | 94.51 |
| පාසල්වලට ජල හා සනීපාරක්ෂක පහසුකම් සැපයීම | 1500.00 | 1,443.51 |
| ප්‍රාථමික පාසල් 3577ක පහසුකම් සංවර්ධනය | 4,517.41 | 2,567.95 |
| ග්‍රාමීය පාසල්වලට ගුරු නිවාස සැපයීම | 1,000.00 | 882.59 |
| ද්විතීයික පාසල් 1000ක් සංවර්ධනය | 4,846.00 | 4,492.36 |
| මෑතකාලීනව සංවර්ධනය නොවූ පාසල් 1360ක් සංවර්ධනය | 6,950.00 | 5,458.05 |
| වතු අංශයේ පාසල් 25ක ද්විතියික අංශය සංවර්ධනය | 500.00 | 207.66 |
| **සංස්කෘතික අංශය** | 253.09 | 157.43 |
| **එකතුව** | **41,879.95** | **25,644.36** |

මූලාශ්‍රය : විවිධ ගිණුම් ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

## 6.3 ප්‍රධාන කාර්යසාධන දර්ශකවලට අනුව 2018 වර්ෂයේ දී ලබා ගත් ප්‍රගතිය

| ප්‍රධාන කාර්ය සාධන දර්ශකය | 2018 ඉලක්කය | 2018 වර්ෂයේ ළඟා කර ගත් ප්‍රගතිය |
|---|---|---|
| **ප්‍රමුඛ ක්ෂේත්‍රය 1: සියළුම දරුවන්ට සමාන ඉගෙනුම් අවස්ථා ලබා දීම තුලින් අධ්‍යාපනය තුළ සමසාධාරණත්වය ශක්තිමත් කිරීම** | | |
| සිසුන් 11 වන ශ්‍රේණිය දක්වා රැඳී සිටීමේ අනුපාතය ඉහළ නැංවීම. | රැදී සිටීමේ අනුපාතය:<br>පිරිමි : 88%<br>ගැහැණු : 90 %<br>මුළු : 89% | ♦ 2018 පාසල් සංගණන දත්ත මෙතෙක් එළි දක්වා නොමැත.<br>2017 දත්ත අනුව පිරිමි : 87%<br>ගැහැණු : 90%<br>මුළු : 88% |
| වසර 13 ක අනිවාර්ය අධ්‍යාපන වැඩසටහන ක්‍රියාත්මක කරන පාසල් සංඛ්‍යාව වැඩි කිරීම. | අවම වශයෙන් පාසල් 190 ක් තුළ වසර 13 ක අනිවාර්ය අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | ♦ 2018 වසර අවසන් වන විට පාසල් 196 ක මෙම වැඩසටහන ක්‍රියාත්මක විය. |
| පාසැල් සෞඛ්‍ය හා පෝෂණ වැඩසටහන් පුළුල් මට්ටමින් ක්‍රියාත්මක කිරීම. | පාසැල් සෞඛ්‍ය හා පෝෂණ වැඩසටහන සිසුන්ගේ මනෝ සමාජීය යහපැවැත්ම ඇතුළත් කරමින් පුළුල් කිරීම. | ♦ පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන සහතිකකරණය පිළිබඳ නව වැඩසටහන හඳුන්වා දීම, ගුරුවරුන්ගේ හා ළමයින්ගේ මානසික අවපීඩනය හඳුනා ගැනීම,මානසික යහපැවැත්මට අදාළ ක්‍රියාකාරකම් සඳහා ගුරු පුහුණුව, පාසල් කාල සටහන වෙනස් කිරීම, ශිෂ්‍ය සෞඛ්‍ය සමාජ සවිබල ගැන්වීම ආදී ප්‍රධාන ක්ෂේත්‍රයන් ඔස්සේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. |
| අන්තර්කරණ අධ්‍යාපන වැඩසටහන් සංවර්ධනය කර ක්‍රියාත්මක කිරීම. | අන්තර්කරණ අධ්‍යාපන වැඩසටහන් සඳහා මාර්ගෝපදේශ සැපයීම. | බුද්ධිමය ඌනතා සහිත දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කිරීම සහ එය ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ සියලුම පාර්ශව දැනුවත් කිරීමට ද, විශේෂ අධ්‍යාපන ගුරුවරුන් ඒ සඳහා පුහුණු කිරීමට ද සැලසුම් කර ඇත. |
| **ප්‍රමුඛ ක්ෂේත්‍රය 2: සාමාන්‍ය අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම** | | |
| ජාතික විභාගවල පාසල් අයදුම්කරුවන්ගේ සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම. | අ.පො.ස. (සා.පෙ.) : 72%<br>අ.පො.ස. (උ.පෙ.) : 67% | අ.පො.ස. (සා.පෙ.) : 75.09%<br>අ.පො.ස. (උ.පෙ.) : 64.7% |
| විද්‍යා හා තාක්ෂණ විෂය ධාරාවන්ට ඇතුළත් වන සිසුන්ගේ ප්‍රතිශතය ඉහළ නැංවීම. | ඇතුලත් වන ප්‍රතිශතය 34% දක්වා ඉහළ නැංවීම. | ♦ 2018 පාසල් සංගණන දත්ත මෙතෙක් එළි දක්වා නොමැත.<br>2017 දත්ත අනුව ප්‍රතිශතය 33%කි. |
| ඉංග්‍රීසි භාෂා ඉගෙනුම් වැඩි දියුණු කිරීම. | ඉංග්‍රීසි භාෂා ඉගෙනුම් ඵල වැඩිදියුණු කිරීමේ (ELLE) වැඩසටහන සැලසුම් කිරීම. | ♦ ELLE වැඩසටහන යටතේ ඉංග්‍රීසි පොත් කියවීම දිරිගැන්වීම, ඉංග්‍රීසි ඉගෙනීම දිරිගන්වන පාසල් පරිසරයක් නිර්මාණය, එදිනෙදා ඉංග්‍රීසි භාවිතය ප්‍රවර්ධනය, ඉංග්‍රීසි ඉගෙනීම සඳහා නව්‍ය අත්දැකීම් ලබා දීම, නිවසේ පරිසරය ඒ සඳහා සකස් කිරීම පිළිබඳව දෙමාපියන් දැනුවත් කිරීම යන ක්ෂේත්‍ර ඔස්සේ වැඩසටහන් සැලසුම් කරන ලදී. |
| ගණිතය ඉගෙනුම් වැඩි දියුණු කිරීම. | ගණිතය ඉගෙනීම වැඩි දියුණු කිරීමේ වැඩසටහන සැලසුම් කිරීම. | ♦ ගණිතය ඉගැන්වීම වැඩිදියුණු කිරීම සඳහා මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කිරීම.<br>♦ තෝරා ගත් පාසල් 500ක ප්‍රාථමික හා ද්විතියික ගණිත ගුරුවරුන් පුහුණු කිරීම, ගණිත සම්පත් මධ්‍යස්ථාන පළාත් මට්ටමින් පිහිටුවීම, ගණිත උපකරණ හා e ඉගෙනුම් ද්‍රව්‍ය සැපයීම යන ක්‍රියාකාරකම් සඳහා සැලසුම් සකස් කරන ලදී. |

| ප්‍රධාන කාර්ය සාධන දර්ශකය | 2018 ඉලක්කය | 2018 වර්ෂයේ ළඟා කර ගත් ප්‍රගතිය |
|---|---|---|
| ***ප්‍රමුඛ ක්ෂේත්‍රය 2:* සාමාන්‍ය අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම** | | |
| පාසල් පදනම් කරගත් වෘත්තීය ගුරු සංවර්ධන (SBPTD) වැඩසටහන් සියලුම පාසල් විසින් ක්‍රියාත්මක කිරීම. | SBPTD වැඩසටහන සැලසුම් කර ක්‍රියාත්මක කිරීම. | ♦ SBPTD වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිළිබඳ උපදෙස් ඇතුලත් ලිපියක් සියලුම විදුහල්පතිවරුන් වෙත 2018 දෙසැම්බර් මස නිකුත් කරන ලදි.<br>♦ SBPTD අත්පොත් පිලියෙල කිරීම 80% නිම කර ඇත.<br>♦ අදාළ පාර්ශ්වකරුවන් දැනුවත් කිරීම, පාසල්වල් SBPTD ඒකක පිහිටුවීම. මොඩියුල සකස් කිරීම, නියාමන ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා සැලසුම් සකස් කර ඇත. |
| වෘත්තිමය සුදුසුකම් ලත් ගුරු ප්‍රතිශතය වැඩිවීම. | වෘත්තීය සුදුසුකම් ලත් ගුරුවරු ප්‍රතිශතය 87% දක්වා වැඩි කිරීම. | ♦ 2018 පාසල් සංගණන දත්ත මෙතෙක් එළි දක්වා නොමැත.<br>2017 දත්ත අනුව ප්‍රතිශතය 86%කි. |
| වෘත්තීය සුදුසුකම් ලත් නවක ගුරුවරු සංඛ්‍යාව වැඩි කිරීම. | වෘත්තිමය සුදුසුකම් ලත් ගුරුවරු 3,500ක් පද්ධතියට එකතු කිරීම. (අවම වශයෙන් 50 % ක් කාන්තාවන්) | ♦ 2018 වර්ෂයේ දී උපාධිධාරී ගුරුවරුන් 1005ක් සහ විද්‍යාපීඨ ඩිප්ලෝමාධාරීන් 74න් අලුතින් බඳවා ගන්නා ලදී. |
| ඉංග්‍රිසි භාෂාව හා ගණිතය සඳහා ඩිජිටල් මාධ්‍ය සුහුරු පොත් ප්‍රවර්ධනය කිරීම. | ඉංග්‍රිසි භාෂාව හා ගණිත ඉගැන්වීම සඳහා ඩිජිටල් මාධ්‍ය සුහුරු පොත් නිෂ්පාදනය කිරීම. | ♦ 2019 වර්ෂයේ දී 6 හා 10 ශ්‍රේණිවල ගණිතයේ පෙළපොත හා 6 ශ්‍රේණියේ ඉංග්‍රිසි පෙළපොත සුහුරු පොත් ලෙස එළි දැක්වීම සඳහා අවශ්‍ය මූලික කටයුතු කර ඇත.<br>♦ 2020 සිට අනෙකුත් ශ්‍රේණි සඳහා ද පියවරයෙන් පියවර සුහුරු පෙළපොත හඳුන්වා දීමට සැලසුම් කර ඇත. |
| ඉගෙනුම් ඵල ඇගයීම සඳහා නවීන ජාත්‍යන්තර ඇගයීම් පද්ධති භාවිතය. | | ♦ විභාග දෙපාර්තමේන්තුව විසින් ඩිජිටල්කරණ කාර්යයන් ආරම්භ කරන ලදී.<br>♦ නව මුද්‍රණ යන්ත්‍ර මිල දී ගැනීම හා OCR/ ICR යන්ත්‍ර මිලට ගැනීමට කටයුතු කර ඇත. |
| යහපත් පුරවැසිභාවය ප්‍රවර්ධනය පිළිබඳ වැඩසටහන්. | යහපත් පුරවැසිභාවය පිළිබඳ සඳහා මාර්ගෝපදේශ සැකසීම. | ♦ පුරවැසි අධ්‍යාපනය, ඉතිහාසය, පළමු බස, දෙවන බස ආදී විෂයයන් සම්බන්ධ සම්පත් පුද්ගලයින් සමඟ එක්ව යහපත් පුරවැසිභාවය පිළිබඳ ක්‍රියාකාරකම් පාසල තුළ ක්‍රියාත්මක කරන්නේ කේසේද යන්න පිළිබඳ මාර්ගෝපදේශ සකස් කිරීමට පියවර ගෙන ඇත. |
| ***ප්‍රමුඛ ක්ෂේත්‍රය 3:* සාමාන්‍ය අධ්‍යාපනයේ භාරකාරත්වය සහ සේවා සැපයීම ශක්තිමත් කිරීම** | | |
| පාසැල් වැඩිදියුණු කිරීමේ උසස් වැඩසටහනේ ප්‍රතිඵල ලඟා කර ගැනීම. | EPSI නිර්වචනය කිරීම හා අදාළ ප්‍රතිපත්ති චක්‍රලේඛය සකස් කිරීම.<br><br>චක්‍රලේඛ -අංක 7/2013 සංශෝධනය කිරීම. | ♦ පාසල් පාදක කළමනාකරණය තුළින් පාසල බලගැන්වීම සඳහා වන පාසල් පාදක ගුණාත්මක, ප්‍රමාණාත්මක හා ව්‍යුහාත්මක සංවර්ධනය සඳහා සැලසුම්කරණය හා ප්‍රමිතිකරණය ලිළිබඳ චක්‍රලේඛ නිකුත් කරන ලදී. |
| අධ්‍යයන හා පරිපාලන සේවා කාර්ය මණ්ඩලයේ මානව සම්පත් සංවර්ධනය (HRD) ක්‍රියාත්මක කිරීම. | මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීම. | ♦ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ සහ විෂය මාලා සංවර්ධනය නිලධාරීන් වෙත පශ්චාත් උපාධි හැදෑරීමට අවස්ථා ලබා දීම සඳහා අවශ්‍ය සැලසුම් සකස් කර ඒ සඳහා අනුමැතිය ලබා ගෙන ඇත. |

| ප්‍රධාන කාර්ය සාධන දර්ශකය | 2018 ඉලක්කය | 2018 වර්ෂයේ ළඟා කර ගත් ප්‍රගතිය |
|---|---|---|
| ***ප්‍රමුඛ ක්ෂේත්‍රය 3:* සාමාන්‍ය අධ්‍යාපනයේ භාරකාරත්වය සහ සේවා සැපයීම ශක්තිමත් කිරීම** | | |
| පාසල්වල ගුණාත්මක තත්ත්වය සහතික කිරීම සඳහා ජාතික මට්ටමින් ක්‍රමවේදයක් ස්ථාපනය කිරීම. | ♦ පාසල් ප්‍රජාවට වගකියන ගුණාත්මක සහතිකරණය රාමුවක් හා පාසල් සුපරීක්ෂණය පද්ධතිය ස්ථාපිත කිරීමට අදාළ මාර්ගෝපදේශ සැකසීම.<br>♦ ප්‍රතිපත්ති චක්‍රලේඛය නිකුත් කිරීම හා සුපරීක්ෂණය ඒකකය ස්ථාපිත කිරීම. | ♦ අධ්‍යාපන ගුණාත්මකභාවය තහවුරු කිරීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ගෝපදේශ හා උපදෙස් සංග්‍රහ සකස් කිරීම, වෙබ් පාදක තොරතුරු පද්ධති සකස් කිරීම, ඇගයීම්කරුවන් පුහුණු කිරීම, ප්‍රජාව දැනුවත් කිරීම, යහපත් ව්‍යවහාරයක් ප්‍රචලිත කිරීම ඇතුළු ක්ෂේත්‍ර ගණනවක් ඔස්සේ සැලසුම් කර ඇත.<br>♦ සුපරීක්ෂණ ඒකකය පිහිටුවීම සඳහා කැබිනට් අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කරුණු ඉදිරිපත් කර ඇත. |
| ***ප්‍රමුඛ ක්ෂේත්‍රය 4:* සාක්ෂි මත පදනම් කරගත් ප්‍රතිපත්ති සම්පාදනය සහ සැලසුම් ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම** | | |
| මධ්‍ය කාලීන අධ්‍යාපන ආංශික සංවර්ධන සැලැස්ම සකස් කිරීම (පෙරළුම් සැලසුම් ප්‍රවේශය සහිත). | 2019 - 2023 සඳහා මධ්‍ය කාලීන ආංශික සංවර්ධන සැලැස්ම යාවත්කාලීන කිරීම. | ♦ මධ්‍යකාලීන ආංශික සංවර්ධන සැලැස්ම යාවත්කාලීන කිරීමට පියවර ගෙන ඇත. |
| මධ්‍ය කාලීන අධ්‍යාපන ආංශික සංවර්ධන සැලැස්මට අනුව අදාළ මූල්‍ය වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලසුම් සකස් කිරීම. | මධ්‍ය කාලීන අධ්‍යාපන ක්ෂේත්‍රයේ සංවර්ධන සැලැස්මට අනුව 2019 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම සකස් කිරීම. | ♦ 2019 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම සකස් කර ඇත. 2019 වර්ෂයේ අයවැය සම්මත වූ පසු නැවත නැවත සංශෝධනය කිරීමට අපේක්ෂිතය. |



# 07.

# ශිෂ්‍ය සාධනය


## 7.1 පස් වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ ශිෂ්‍ය සාධනය

**7.1.1 වගුව : පස්වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයේ ශිෂ්‍ය සාධනය**

| | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|---|
| පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 322,455 | 327,648 | 333,672 | 343,757 | 350,462 | 350,191 |
| ලකුණු 70ට වඩා ලැබූ ශිෂ්‍ය ප්‍රතිශතය (%) | 69.44 | 78.96 | 76.33 | 75.67 | 69.40 | 79.09 |
| මධ්‍යන්‍ය අගය | 110.71 | 113.89 | 109.50 | 107.86 | 106.43 | 117.98 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ඇගයීම් වාර්තාවන්

**7.1.1 ප්‍රස්ථාරය : පස්වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයේ ශිෂ්‍ය සාධනය**




මූලාශ්‍රය : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ඇගයීම් වාර්තාවන්

2014 වසරේ සිට 2018 දක්වා වන කාලසීමාව තුළ පස්වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සඳහා පෙනී සිටි සිසුන්ගෙන් ලකුණු 70ට වඩා ලබාගැනීමට සමත්ව ඇති ශිෂ්‍ය ප්‍රතිශතය සැලකීමේ දී එය 2018 වර්ශයේ දී 79% කට වඩා ඉහළ ගොස් ඇති බව පෙනේ. සමස්ත ශිෂ්‍යයින් ගේ මධ්‍යයන ලකුණ 2018 වර්ෂයේ දී 117.98ක් දක්වා ඉහළ යාමක් ද නිරීක්ෂණය කළ හැකිය.


## 7.2 අ.පො.ස. (සා.පෙළ) විභාගයේ ශිෂ්‍ය සාධනය

**7. 2. 1 වගුව: අ.පො.ස. (උ/පෙළ) සඳහා සුදුසුකම්ලත් ශිෂ්‍ය සංඛ්‍යාව සහ ප්‍රතිශතය**

| පළාත | 2015 | | 2016 | | 2017 | | 2018 | |
|---|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| බස්නාහිර | 53,062 | 72.6 | 54,994 | 72.9 | 58,704 | 74.5 | 59,858 | 76.1 |
| උතුර | 10,719 | 60.3 | 10,562 | 60.6 | 11,901 | 66.1 | 11,660 | 69.9 |
| දකුණ | 26,173 | 75.2 | 26,828 | 76.6 | 28,768 | 79.4 | 29,532 | 80.4 |
| මධ්‍යම | 23,209 | 66.9 | 25,932 | 68.8 | 27,838 | 71.4 | 28,880 | 72.3 |
| සබරගමුව | 17,342 | 69.9 | 18,117 | 70.8 | 20,028 | 74.3 | 20,784 | 76.1 |
| වයඹ | 22,104 | 69.6 | 23,896 | 70.6 | 25,926 | 74.6 | 26,599 | 76.9 |
| ඌව | 12,005 | 65.8 | 12,630 | 68.0 | 13,573 | 69.7 | 14,245 | 72.3 |
| නැගෙනහිර | 13,784 | 63.5 | 14,617 | 61.5 | 16,452 | 67.7 | 16,807 | 69.9 |
| උතුරු මැද | 11,030 | 66.6 | 12,632 | 66.3 | 13,625 | 70.0 | 14,116 | 72.7 |
| **එකතුව** | **189,428** | 69.3 | **200,208** | 69.9 | **216,815** | 73.0 | **222,281** | 75.1 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ඇගයීම් වාර්තාවන්

අ.පො.ස. සාමාන්‍ය පෙළ විෂය ධාරාවේ සමත් ප්‍රතිශතය සෑම පළාතක ම මෙන් වාර්ෂික ව ඉහළ ගොස් ඇත. 2018 වර්ෂයේ දී පෙර වර්ෂවලට වඩා සමත් ප්‍රතිශතය වැඩි ඉහළ යාමක් පෙන්නුම් කරන අතර ඒ අනුව සමස්තයක් ලෙස අ.පො.ස. සාමාන්‍ය පෙළ සමත් ප්‍රතිශතය මුළු දිවයිනේම සැලකූ විට 75.1% දක්වා ඉහළ ගොස් ඇත.




මූලාශ්‍රය - ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## 7.3 අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ශිෂ්‍ය සාධනය

### 7.3.1.වගුව : අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ශිෂ්‍ය සාධනය

| | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|---|
| පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 209,906 | 207,304 | 210,340 | 211,865 | 206,630 | 218,191 |
| විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලත් ශිෂ්‍ය ප්‍රතිශතය (%) | 58.56 | 61.25 | 62.35 | 63.36 | 66.02 | 64.70 |


මූලාශ්‍රය : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ඇගයීම් වාර්තාවන්

### 7.3.2. වගුව : විවිධ විෂය ධාරාවන්ගේ විශ්ව විද්‍යාල ප්‍රවේශ සුදුසුකම් ලැබූ ශිෂ්‍ය ප්‍රතිශතය - පළාත් අනුව (පාසල් අයදුම්කරුවන්) - 2018

| පළාත | විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය ප්‍රතිශතය | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | ජීව විද්‍යාව | භෞතික විද්‍යාව | වාණිජ | කලා | ඉංජිනේරු තාක්ෂණය | ජෛව පද්ධති තා: | පොදු |
| බස්නාහිර | 65.03 | 59.12 | 70.06 | 67.50 | 63.48 | 66.75 | 41.69 |
| උතුර | 60.21 | 62.88 | 71.47 | 69.35 | 50.89 | 61.82 | 48.99 |
| දකුණ | 57.35 | 56.25 | 71.13 | 68.92 | 66.58 | 68.49 | 38.61 |
| මධ්‍යම | 54.60 | 55.03 | 65.71 | 66.88 | 52.59 | 60.19 | 47.35 |
| සබරගමුව | 54.47 | 55.57 | 71.07 | 74.11 | 58.88 | 73.72 | 42.21 |
| වයඹ | 58.31 | 56.84 | 72.11 | 71.60 | 61.65 | 63.63 | 44.09 |
| ඌව | 52.66 | 53.08 | 67.68 | 70.78 | 59.63 | 65.86 | 47.26 |
| නැගෙනහිර | 56.04 | 52.80 | 64.46 | 65.24 | 46.05 | 58.04 | 53.10 |
| උතුරු මැද | 45.83 | 48.07 | 66.80 | 71.01 | 53.04 | 60.66 | 36.02 |
| **සාමාන්‍ය අගය** | **57.98** | **56.80** | **69.40** | **69.24** | **58.42** | **64.28** | **42.86** |


මූලාශ්‍රය : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ඇගයීම් වාර්තාවන්

**7.3.1 ප්‍රස්ථාරය : විවිධ විෂය ධාරාවන්ගෙන් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය ප්‍රතිශතය, 2015 - 2018**




එක් එක් විෂයය ධාරාවන්ගෙන් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය ප්‍රතිශතයන් සැලකීමේ දි ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, ඉංජිනේරු තාක්ෂණය හා ජෛව පද්ධති තාක්ෂණය යන විෂයය ධාරාවන් හි ප්‍රතිශතයන් හි ඉහළ යාමේ සාධනීය ප්‍රවණතාවයක් පසුගිය වර්ෂ කිහිපය තුළ ප්‍රතිඵල විශ්ලේෂණයේ දී නිරීක්ෂණය කළ හැකිය. එසේ වුව ද සමස්තයක් ලෙස සෑම පළාතකම විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා වැඩි ශිෂ්‍ය ප්‍රතිශතයක් සුදුසුකම් ලබනුයේ වාණිජ හා කලා විෂය ධාරාවන් ගෙනි.

**7. 3. 2. ප්‍රස්ථාරය : අ. පො. ස. උසස් පෙළ ප්‍රධාන විෂයන් කිහිපයක සමත් ශිෂ්‍ය ප්‍රතිශතය - 2016 හා 2018**




| | භෞතික වි: | රසායන වි: | ජීව වි: | ස: ගණිතය | ආර්ථික වි: | භූගෝල වි: | දේශපාලන වි: | ව්‍යාපාර අ: | ගිණුම්කරණය | ජෛව පද්: තා: | සිංහල |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2016 | 66.81 | 67.67 | 75.52 | 62.2 | 76.36 | 81.68 | 70.8 | 90.4 | 72.69 | 68.67 | 95.75 |
| 2017 | 67.36 | 69.17 | 75.79 | 66.06 | 76.69 | 86.68 | 76.23 | 87.38 | 76.29 | 70.33 | 94.81 |
| 2018 | 72.24 | 69.97 | 74.87 | 65.9 | 75.68 | 78.61 | 70.11 | 87.3 | 72.76 | 74.88 | 92.6 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## 7.4 සිසුන්ගේ ඉගෙනුම් ප්‍රාප්ති මට්ටම ඉහළ නැංවීම සඳහා ගනු ලැබූ පියවර

- 5වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය තරගකාරී විභාගයක් බවට පත්වීම නිසා ශිෂ්‍යයන්ට ඇතිව තිබෙන පීඩනය අවම කිරීම මෙන්ම ග්‍රාමීය පාසල්වල සිසුන්ට හා අඩු ආදායම්ලාභී පවුල්වල සිසුන්ට අවස්ථා ලබා දීම තවදුරටත් සහතික කිරීම යන අරමුණු දෙකම ඉටුවන පරිදි ශිෂ්‍යත්ව විභාගය සංශෝධනය කිරීම සඳහා යෝජනා ලබා දීමට විද්වත් කමිටුවක් පත් කරන ලද අතර එම යෝජනා මාලාව මේ වන විට ලබා දී ඇත.
- අ.පො.ස (සා.පෙළ) සාධන මට්ටම් ඉහළ නැංවීම සඳහා අඛණ්ඩව සිදු කරන විෂය සංවර්ධන වැඩසටහන්වල ප්‍රතිඵලයක් ලෙස විෂයය සාධන මට්ටම් ඉහළ යෑමක් දැකිය හැක. ගණිතය, ඉංග්‍රීසි සහ විද්‍යාව යන විෂයයන්ගේ සාධන මට්ටම් තව දුරටක් ඉහළ නැංවීම සඳහා විශේෂ අවධානයක් යොමු කර ඇත.
- අ.පො.ස.(උ.පෙළ) විභාගයට පෙනී සිට විශ්ව විද්‍යාල ප්‍රවේශයට සුදුසුකම් ලැබූ ශිෂ්‍ය ප්‍රතිශතය කලා හා වාණිජ විෂයය ධාරාවන්ගෙන් 70% ක් පමණ ද, ජීව, භෞතික, ජෛව තාක්ෂණ හා ඉංජිනේරු තාක්ෂණ විෂය ධාරාවන්ගෙන් 50% - 60% අතර පමණ ද වේ. 13 වසරක අඛණ්ඩ අධ්‍යාපනය තහවුරු කිරීමට අලුතින් වෘත්තීය විෂය ධාරාවක් හඳුන්වා දී තිබේ. වෘත්තීය විෂය ධාරාව හදාරණ සිසුන්ට අවසානයේ දී ජාතික වෘත්තීය සුදුසුකම් 4වන මට්ටම (NVQ 4) ලබා ගනිමින් උසස් වෘත්තීය ප්‍රවේශයක් සහිතව පාසලෙන් පිටවිය හැකිය. ඒ අනුව වෘත්තීය විෂයන්ට තම නිසඟ කුසලතාව දක්වන සිසුන්ට තමාගේ හැකියාවට ගැළපෙන විෂය ධාරාවක් තෝරා ගැනීමේ විකල්ප මාර්ගය මේ හරහා උදා වේ.

# ඇමුණුම්

## ඇමුණුම 1

### ප්‍රධාන අධ්‍යාපන දත්ත සහ දර්ශක

| දර්ශකය | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|---|---|
| **පාසල් (a)** | | | | | | | |
| රජයේ පාසල් සංඛ්‍යාව | 9,905 | 10,012 | 10,121 | 10,144 | 10,162 | 10,194 | 10,175 |
| පාසල් වර්ගය අනුව (b) | | | | | | | |
| 1ඒබී පාසල් | 753 | 868 | 959 | 1,004 | 1,016 | 1,029 | 1,044 |
| 1සී පාසල් | 2,013 | 1,910 | 1,852 | 1,801 | 1.805 | 1,818 | 1,856 |
| 2 වර්ගයේ පාසල් | 3,869 | 3,730 | 3,603 | 3,462 | 3.408 | 3,288 | 3,217 |
| 3 වර්ගයේ පාසල් | 3,270 | 3,504 | 3,707 | 3,877 | 3,933 | 4,059 | 4,058 |
| පන්ති පරාසය අනුව | | | | | | | |
| ප්‍රාථමික පන්ති පමණක් | 2,991 | 3,299 | 3,558 | 3,704 | 3,780 | 3,881 | 3,890 |
| 1 ශ්‍රේණියේ සිට 8 ශ්‍රේණිය දක්වා | 271 | 205 | 150 | 173 | 153 | 177 | 168 |
| 1 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා | 3,853 | 3,706 | 3,587 | 3,442 | 3,391 | 3,269 | 3,197 |
| 1 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා | 2,330 | 2,240 | 2,187 | 2,165 | 1,917 | 1.866 | 1,902 |
| 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා | 24 | 24 | 21 | 20 | 17 | 20 | 20 |
| 6 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා | 436 | 538 | 618 | 640 | 904 | 981 | 998 |
| පරිපාලන අධිකාරිය අනුව | | | | | | | |
| ජාතික පාසල් | 342 | 350 | 351 | 352 | 353 | 353 | 353 |
| පළාත් පාසල් | 9,563 | 9,662 | 9,770 | 9,792 | 9,809 | 9,841 | 9,822 |
| ඉගැන්වීමේ මාධ්‍ය අනුව | | | | | | | |
| සිංහල පමණක් | 6,368 | 6,355 | 6,388 | 6,389 | 6.338 | 6,332 | 6,370 |
| දෙමළ පමණක් | 2,914 | 2,949 | 2,982 | 3,018 | 2,989 | 3,009 | 3,031 |
| සිංහල හා දෙමළ | 39 | 60 | 53 | 39 | 66 | 75 | 35 |
| සිංහල හා ඉංග්‍රීසි | 403 | 446 | 495 | 504 | 554 | 558 | 531 |
| දෙමළ හා ඉංග්‍රීසි | 152 | 164 | 166 | 160 | 168 | 173 | 170 |
| සිංහල,දෙමළ හා ඉංග්‍රීසි | 29 | 38 | 37 | 34 | 47 | 47 | 38 |
| පිහිටීම අනුව (c) | | | | | | | |
| නාගරික | 1,071 | 1,078 | 1,116 | 1,140 | 1,095 | 1,089 | 1,098 |
| ග්‍රාමීය | 8,834 | 8,934 | 9,005 | 9,004 | 9,067 | 9,105 | 9,077 |
| ශිෂ්‍ය සංඛ්‍යාව අනුව | | | | | | | |
| 1 - 50 | 1,652 | 1,614 | 1,572 | 1,515 | 1,455 | 1,486 | 1,479 |
| 51 - 500 | 5,990 | 6,104 | 6,247 | 6,291 | 6,377 | 6,365 | 6,320 |
| 501 - 2500 | 2,069 | 2,094 | 2,103 | 2,140 | 2,138 | 2,137 | 2,165 |
| 2501 - 5000 | 183 | 187 | 185 | 184 | 175 | 192 | 194 |
| 5000ට වැඩි | 11 | 13 | 14 | 14 | 17 | 14 | 17 |
| පෞද්ගලික පාසල් සංඛ්‍යාව (d) | 73 | 78 | 78 | 78 | 80 | 80 | 80 |
| විශේෂ පාසල් සංඛ්‍යාව (e) | 25 | 25 | 25 | 25 | 25 | 26 | 26 |
| පිරිවෙන් සංඛ්‍යාව | 734 | 734 | 747 | 749 | 754 | 753 | 761 |
| **ගුරුවරුන් (a)** | | | | | | | |
| රජයේ පාසල්වල ගුරුවරුන් සංඛ්‍යාව | 223,333 | 226,983 | 232,993 | 236,988 | 235,999 | 241,018 | 247,045 |
| ස්ත්‍රී පුරුෂ භාවය අනුව | | | | | | | |
| ස්ත්‍රී | 160,544 | 163,860 | 168,642 | 172,536 | 172,000 | 176,530 | 182,855 |
| පුරුෂ | 62,789 | 63,123 | 64,351 | 64,462 | 63,999 | 64,488 | 64,190 |
| සුදුසුකම් අනුව | | | | | | | |
| උපාධිධාරී | 86,751 | 90,515 | 96,200 | 99,004 | 101,632 | 106,742 | 110,676 |
| වෘත්තියමය සුදුසුකම් සහිත (f) | 51,814 | 56,593 | 70,123 | 71,448 | 70,629 | 75,429 | ** |
| වෘත්තියමය සුදුසුකම් රහිත | 34,937 | 33,922 | 26,077 | 27,556 | 31,003 | 31,313 | ** |
| පුහුණු ගුරුවරු (g) | 128,152 | 129,686 | 131,622 | 132,952 | 129,937 | 129,616 | 130,725 |
| නුපුහුණු / අභ්‍යාසලාභී / වෙනත් | 8,430 | 6,782 | 5,171 | 5,042 | 4,430 | 4,660 | 5,932 |

| දර්ශකය | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|---|---|
| වෘත්තීයමය සුදුසුකම් සහිත ගුරුවරු ප්‍රතිශතය (h) | 81 | 82 | 86 | 86 | 85 | 85 | ** |
| ගුරු ශිෂ්‍ය අනුපාතය | 18 | 18 | 18 | 17 | 18 | 17 | 17 |
| ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සංඛ්‍යාව | 18 | 18 | 18 | 19 | 19 | 19 | 19 |
| ගුරු විද්‍යාල සංඛ්‍යාව | 9 | 9 | 9 | 9 | 8 | 8 | 8 |
| ගුරු මධ්‍යස්ථාන සංඛ්‍යාව (i) | 104 | 105 | 105 | 105 | 109 | 109 | 111 |
| **ශිෂ්‍යයින් (a)** | | | | | | | |
| රජයේ පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාව | 4,004,086 | 4,037,157 | 4,078,037 | 4,129,534 | 4,143,330 | 4,165,955 | 4,215,993 |
| ස්ත්‍රී පුරුෂ භාවය අනුව | | | | | | | |
| ස්ත්‍රී | 2,018,803 | 2,035,317 | 2,057,471 | 2,084,165 | 2,091142 | 2,106,159 | ** |
| පුරුෂ | 1,985,283 | 2,001,840 | 2,020,566 | 2,045,369 | 2052188 | 2,059,796 | ** |
| ප්‍රධාන ඉගෙනුම් මාධ්‍ය අනුව | | | | | | | |
| සිංහල | 2,920,720 | 3,006,262 | 2,982,715 | 3,022,072 | 3.034305 | 3,055,933 | ** |
| දෙමළ | 1,020,008 | 1,030,895 | 1,025,068 | 1,031,295 | 1.028032 | 1,025,302 | ** |
| ද්විභාෂා (w) | 63,358 | 67,061 | 71,015 | 76,167 | 80.993 | 84,720 | ** |
| ඉගෙනුම් චක්‍රය අනුව | | | | | | | |
| ප්‍රාථමික ( 1-5 ශ්‍රේණි) | 1,698,510 | 1,718,675 | 1,732,446 | 1,725,657 | 1.717092 | 1,700,666 | 1,672,742 |
| කනිෂ්ඨ ද්විතීයික ( 6-9 ශ්‍රේණි) | 1,245,609 | 1,272,645 | 1,294,756 | 13,08,485 | 1.314.381 | 1,331,069 | 1,346,305 |
| ජ්‍යෙෂ්ඨ ද්විතීයික ( 10-11ශ්‍රේණි) | 591,087 | 567,396 | 570,383 | 594,494 | 619.105 | 621,520 | 622,620 |
| ජ්‍යෙෂ්ඨ ද්විතීයික ( 12-13ශ්‍රේණි) | 468,880 | 478,441 | 480,452 | 494,597 | 492.752 | 512,700 | 567,547 |
| විශේෂ අධ්‍යාපන ඒකකවල | - | - | - | - | - | - | 6,779 |
| පිරිවෙන්වල ශිෂ්‍ය සංඛ්‍යාව | 64,608 | 66,116 | 62,870 | 64,606 | 66,003 | 62,872 | 60,440 |
| පැවිදි | 35,019 | 35,595 | 34,003 | 34,652 | 35025 | 33,441 | 31,818 |
| ගිහි | 29,589 | 30,521 | 28,867 | 29,954 | 30978 | 29,431 | 28,622 |
| පෞද්ගලික පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාව (විශේෂ පාසල් ද ඇතුළුව) | 125,669 | 127,986 | 131,427 | 133,749 | 136407 | 136,300 | 138,526 |
| **ප්‍රවේශය සහ සහභාගිත්වය (j)** | | | | | | | |
| රජයේ පාසල්වල 1 ශ්‍රේණිය සඳහා ඇතුළත් වන සිසුන් සංඛ්‍යාව | 339,142 | 350,294 | 349,182 | 334,877 | 325,369 | 327,925 | ** |
| ප්‍රාථමික අධ්‍යාපනයට (1ශ්‍රේණියට) ශුද්ධ ප්‍රවේශ අනුපාතය (k) | 98.3 | 99.4 | 99.5 | 99.4 | 99.4 | 98.5 | ** |
| ස්ත්‍රී | 98.2 | 99.4 | 99.6 | 99.3 | 99.3 | 97.4 | ** |
| පුරුෂ | 98.4 | 99.4 | 99.4 | 99.4 | 99.4 | 99.5 | ** |
| ප්‍රාථමික චක්‍රය තුළ (1-5ශ්‍රේණි) ඇතුළත්වීමේ ශුද්ධ අනුපාතය (l) | 99.9 | 98.4 | 98.5 | 97.5 | | 93.9 | ** |
| ස්ත්‍රී | 99.6 | 98.4 | 98.5 | 97.5 | 95.27 | 93.31 | ** |
| පුරුෂ | 100.0 | 98.4 | 98.6 | 97.5 | 96.54 | 94.49 | ** |
| කනිෂ්ඨ ද්විතීයික චක්‍රය තුළ (1-9 ශ්‍රේණි ) තුළ ඇතුළත්වීමේ ශුද්ධ අනුපාතය (m) | 98.4 | 98.7 | 99.0 | 98.3 | | 96.28 | ** |
| ස්ත්‍රී | 99.6 | 98.3 | 98.7 | 98.4 | 96.31 | 95.21 | ** |
| පුරුෂ | 98.2 | 99.1 | 99.8 | 98.3 | 98.38 | 97.33 | ** |
| ජ්‍යෙෂ්ඨ ද්විතීයික චක්‍රය තුළ (1-11 ශ්‍රේණි ) ඇතුළත්වීමේ ශුද්ධ අනුපාතය (n) | 98.6 | 96.2 | 96.3 | 96.2 | | 96.24 | ** |
| ස්ත්‍රී | 98.2 | 96.0 | 96.5 | 96.3 | 95.33 | 95.58 | ** |
| පුරුෂ | 99.0 | 96.3 | 96.8 | 96.2 | 96.49 | 96.89 | ** |
| 9 ශ්‍රේණිය දක්වා රැඳී සිටීමේ අනුපාතය(o) | 92.1 | 91.9 | 92.5 | 93.3 | 95.1 | 95.36 | ** |
| ස්ත්‍රී | 94.1 | 93.9 | 94.7 | 95.06 | | 96.98 | ** |
| පුරුෂ | 90.1 | 90.0 | 90.3 | 91.48 | | 93.79 | ** |
| 11 ශ්‍රේණිය දක්වා රැඳී සිටීමේ අනුපාතය(o) | N/A | N/A | 85.1 | 85.42 | 87.5 | 88.75 | ** |
| ස්ත්‍රී | N/A | N/A | 88.3 | 88.52 | | 91.03 | ** |
| පුරුෂ | N/A | N/A | 82.0 | 82.42 | | 86.54 | ** |

| දර්ශක | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|---|---|
| **ශිෂ්‍ය සාධනය ( p)** | | | | | | | |
| **5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ දී ශිෂ්‍ය සාධනය** | | | | | | | |
| 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 310,329 | 322,455 | 327,648 | 333,672 | 343,757 | 350,462 | 350,191 |
| ලකුණු 200න් 70ට වඩා ලබා ගත් ශිෂ්‍ය ප්‍රතිශතය | 64.3 | 78.96 | 78.96 | 76.33 | 75.67 | 69.40 | 79.09 |
| **අ.පො.ස. ( සා.පෙළ ) විභාගයේ ශිෂ්‍ය සාධනය** | | | | | | | |
| අ.පො.ස. (සා.පෙළ ) විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව (පළමු වරට පෙනී සිටින) | 268,995 | 264,772 | 257,322 | 273,410 | 286,251 | 296,812 | 296,029 |
| අ.පො.ස. (උ.පෙළ ) සඳහා සුදුසුකම් ලත් ශිෂ්‍ය ප්‍රතිශතය | 64.7 | 66.67 | 69.02 | 69.33 | 69.94 | 73.05 | 75.09 |
| සමත් ප්‍රතිශතය | | | | | | | |
| ගණිතය | 55.3 | 57.23 | 56.70 | 55.18 | 62.81 | 67.24 | 68.30 |
| විද්‍යාව | 68.2 | 67.53 | 60.58 | 68.02 | 66.33 | 73.46 | 69.83 |
| ඉංග්‍රීසි | 47.7 | 47.86 | 45.08 | 45.40 | 47.9 | 51.12 | 54.90 |
| **අ.පො.ස. (උ.පෙළ ) විභාගයේ ශිෂ්‍ය සාධනය** | | | | | | | |
| අ.පො.ස. (උ.පෙළ ) විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව (පාසල් අයදුම්කරුවන්) | 194,448 | 209,906 | 207,304 | 210,340 | 211,865 | 206,630 | 218,191 |
| විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලත් ශිෂ්‍ය ප්‍රතිශතය | | | | | | | |
| ජීව විද්‍යා විෂය ධාරාව | 53.8 (v) | 49.8 (v) | 50.30 | 53.3 | 53.26 | 55.71 | 57.98 |
| භෞතීය විද්‍යා විෂය ධාරාව | 44.7 | 47.1 | 46.60 | 48.6 | 53.35 | 54.05 | 56.80 |
| වාණිජ විෂය ධාරාව | 72.3 | 57.6 | 64.03 | 67.9 | 69.64 | 71.17 | 69.40 |
| කලා විෂය ධාරාව | 67.7 | 66.0 | 68.90 | 65.9 | 70.28 | 73.82 | 69.24 |
| ඉංජිනේරු තාක්ෂණවේදය විෂය ධාරාව | X | X | X | 50.09 | 55.58 | 57.74 | 58.42 |
| ජෛව පද්ධති තාක්ෂණයවේදය විෂය ධාරාව | X | X | X | 60.66 | 60.16 | 61.79 | 64.28 |
| විකල්ප විෂය ධාරාවන් | 55.33 | 48.9 | 47.42 | 39.0 | 39.36 | 40.83 | 42.86 |
| **මූල්‍ය (s)** | | | | | | | |
| අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සාමාන්‍ය අධ්‍යාපනය සඳහා දරන ලද මුළු වියදම (රු. මි. ) | 33,618 | 38,336 | 52,381 | 54,432 | 60,334 | 79,768 | 72,356 |
| පුනරාවර්තන (රු. මි. ) | 28,977 | 30,693 | 36,592 | 38,896 | 45,396 | 52,057 | 46,712 |
| ප්‍රාග්ධන (රු. මි. ) | 4,641 | 7,643 | 15,789 | 15,536 | 14,938 | 27,711 | 25,644 |
| අධ්‍යාපන අමාත්‍යාංශය සහ පළාත් සභා විසින් සාමාන්‍ය අධ්‍යාපනය සඳහා දරන ලද මුළු වියදම (රු. මි. ) | 90,422 | 110,737 | 117,000 | 151,130 | N/A | 213,119 | x |
| පුනරාවර්තන (රු. මි. ) | 82,872 | 99,297 | 97,000 | 127,000 | N/A | 36,922 | x |
| ප්‍රාග්ධන (රු. මි. ) | 7,550 | 11,440 | 20,000 | 24,130 | N/A | 176,197 | x |
| ඒක පුද්ගල ශිෂ්‍ය වියදම- සාමාන්‍ය අධ්‍යාපනය සඳහා (රු.) (X) | 22,581 | 27,427 | 35,577 | 36,621 | 45,880 | 51,157 | x |
| පාසල් පෙළපොත් ලබා දීම සඳහා වියදම (රු. මි.) | 2,055 | 2,700 | 2,703 | 3,000 | 5,414 | 4,280 | 4,160 |
| පාසල් නිල ඇඳුම් ලබා දීම සඳහා වියදම (රු. මි.) | 2,218 | 1,826 | 3,574 | 2,600 | 2,156 | 2,706 | 1,072 |
| පාසල් පෝෂණ වැඩසටහන (රු. මි.) | 2,790 | 3,000 | 3,725 | 4,082 | 3,915 | 4,434 | 5,325 |
| 5 ශ්‍රේණිය ශිෂ්‍යාධාර (රු. මි.) | 230 | 280 | 300 | 325 | 323 | 309 | 310 |
| දුෂ්කර හා අතිදුෂ්කර පාසල් සිසුන් සඳහා සපත්තු ලබා දීම | X | X | 298 | 600 | 479 | 411 | 219 |
| කිරි වීදුරුවක් ලබා දීම | 205 | 230 | 197 | 127 | 212 | 266 | 482 |
| **යටිතල පහසුකම් (q)** | | | | | | | |
| අ.පො.ස. (උ.පෙළ ) විද්‍යාගාර සහිත පාසල් සංඛ්‍යාව | 748 | 868 | 959 | 1004 | 1016 | 1127 | ** |
| තොරතුරු තාක්ෂණ විද්‍යාගාර සහිත 1ඒබී සහ 1සී පාසල් ප්‍රතිශතය | 95.9 | 95.9 | 73 | 73 | 75 | 72 | ** |
| තොරතුරු තාක්ෂණ විද්‍යාගාර සහිත 2 වර්ගයේ සහ 3 වර්ගයේ පාසල් ප්‍රතිශතය | 43.0 | 43.0 | 20 | 21 | 21 | 19 | ** |
| පානීය ජල පහසුකම් සහිත පාසල් ප්‍රතිශතය | 85 | 86.2 | 85 | 87 | 88 | 84 | ** |
| ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් සහිත පාසල් ප්‍රතිශතය (r) | 79 | 75 | 98 | 99 | 99 | 99 | ** |
| අන්තර්ජාල පහසුකම් සහිත පාසල් ප්‍රතිශතය | | | | | | 20.1 | ** |
| විදුලිබල පහසුකම් සහිත පාසල් ප්‍රතිශතය | | | | | | 96.5 | ** |

| දර්ශකය | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|---|---|
| පුස්තකාල/තාවකාලික පුස්තකාල/කියවීම් ශාලා සහිත ප්‍රාථමික පාසල් ප්‍රතිශතය ( 3වර්ගයේ පාසල්) | | | | | | 43.01 | ** |
| පුස්තකාල/තාවකාලික පුස්තකාල සහිත ප්‍රාථමික පාසල් ප්‍රතිශතය ( 1AB, 1C හා 2 වර්ගයේ පාසල්) | | | | | | 79.0 | ** |
| පුස්තකාල/තාවකාලික පුස්තකාල සහිත පාසල් ප්‍රතිශතය (සියලුම පාසල් ඇතුලත් වේ) | | | | | | 59.3 | ** |
| 6-11 ශ්‍රේණි සඳහා විද්‍යාගාර සහිත පාසල් ප්‍රතිශතය (y) | | | | | | 74.9 | ** |

(a) වාර්ෂික පාසල් සංගණන දත්ත ඇසුරිනි.

(b) 1AB : 1 සිට 13 හෝ 6 සිට 13 ශ්‍රේණි සහිත අ.පො.ස. (උ.පෙ) විද්‍යා, වාණිජ, කලා විෂය ධාරා තුන ම සහිත පාසල් (තෝරා ගත් පාසල්වල තාක්ෂණවේදය විෂය ධාරාව ක්‍රියාත්මක වේ.)

1C : 1 සිට 13 හෝ 6 සිට 13 ශ්‍රේණි සහිත අ.පො.ස. (උ.පෙ) වාණිජ හෝ කලා විෂය ධාරා දෙක ම හෝ එකක් හෝ සහිත පාසල් (තෝරා ගත් පාසල්වල තාක්ෂණවේදය විෂය ධාරාව ක්‍රියාත්මක වේ.)

2 වර්ගය : 1 සිට 11 හෝ 6 සිට 11 ශ්‍රේණි සහිත අ.පො.ස. (සා.පෙ) දක්වා වූ පාසල්

3 වර්ගය : 1 සිට 5 හෝ 8 ශ්‍රේණිය දක්වා ඇති ප්‍රාථමික හෝ කනිෂ්ඨ පාසල්

(c) නාගරික - මහ නගර සභා හෝ නගර සභා බල ප්‍රදේශයක පිහිටි පාසල්

ග්‍රාමීය - ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයක පිහිටි පාසල්

(d) මුදල් අය කරනු ලබන හෝ අය කරනු නොලබන ජාතික විෂය මාලාව උගන්වන පෞද්ගලික අංශයෙන් පාලනය වන පාසල් ( මෙහි දී ජාත්‍යන්තර පාසල් ඇතුළත් නොවේ)

(e) විශේෂ අවශ්‍යතා සහිත දරුවන් ( අන්ධ, ගොළු, බිහිරි, ඔටිසම් ) සඳහා වූ විශේෂ පාසල්

(f) පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහිත උපාධිධාරීන්

(g) ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ තුළින් හෝ ගුරු විද්‍යාල තුළින් පුහුණුව ලබා ඇති ගුරුවරුන්

(h) වෘත්තීය සුදුසුකම් සහිත උපාධිධාරීන් සහ පුහුණු ගුරුවරුන් සංඛ්‍යාව, සමස්ත ගුරුවරුන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස

(i*) මෙයට අගී ගණ්‍ය ගුරු මධ්‍යස්ථාන වන බිබිල, යාකරවත්ත හා මන්නාරම යන මධ්‍යස්ථාන තුන ද ඇතුළත් වේ.

(j) වාර්ෂික පාසල් සංගණන දත්ත, සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ජනගහන දත්ත හා ලෝක බැංකු දත්ත පාදකය ඇසුරිනි.

(k) අවුරුදු 5 සම්පූර්ණ වූ ජනගහනයෙන් රජයේ පාසල්, පෞද්ගලික පාසල් හා පිරිවෙන්වල පළමු ශ්‍රේණියට ඇතුළත් ව ඇති ශිෂ්‍ය ප්‍රතිශතය

(l) අවුරුදු 5-10 වයස් සීමාවේ සිටින ජනගහනයෙන් රජයේ පාසල්, පෞද්ගලික පාසල් හා පිරිවෙන්වල ප්‍රාථමික අධ්‍යාපන චක්‍රයට ඇතුළත් ව ඇති ශිෂ්‍ය ප්‍රතිශතය

(m) අවුරුදු 5-14 වයස් සීමාවේ ජනගහනයෙන් රජයේ පාසල්, පෞද්ගලික පාසල් හා පිරිවෙන්වල ප්‍රාථමික සිට කනිෂ්ඨ ද්විතීයික අවධිය දක්වා (1-9 ශ්‍රේණිවලට ) ඇතුළත් ව ඇති ශිෂ්‍ය ප්‍රතිශතය

(n) අවුරුදු 5-16 අනිවාර්ය අධ්‍යාපන වයස් සීමාවේ ජනගහනයෙන් රජයේ පාසල්, පෞද්ගලික පාසල් හා පිරිවෙන්වල ප්‍රාථමික සිට ජ්‍යෙෂ්ඨ ද්විතීයික පළමු අවධිය දක්වා (1-11ශ්‍රේණිවලට ) ඇතුළත් ව ඇති ශිෂ්‍ය ප්‍රතිශතය

(o) රජයේ පාසල්වලට පළමු ශ්‍රේණියට ඇතුළත් වන ශිෂ්‍යයින්ගෙන් 9 ශ්‍රේණිය හා 11 ශ්‍රේණිය දක්වා රැඳී සිටින ප්‍රතිශත

(p) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග ප්‍රතිඵල දත්ත ඇසුරිනි.

(q) පාසල්වල පවතින යටිතල පහසුකම් අතරින් ප්‍රධාන කිහිපයක් පමණක් මෙහි සලකා ඇත.

(r) පාසල් සනීපාරක්ෂක පහසුකම් පිළිබඳ ව සකස්කර ඇති ජාතික ප්‍රතිමානයන්ට අනුව අවශ්‍ය ප්‍රමාණයෙන් 50% ක් හෝ ඇති පාසල්

(s) අධ්‍යාපන අමාත්‍යාංශයේ දත්ත සහ මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාවේ දත්ත ඇසුරිනි.

(t) කිලිනොච්චි හා මුලතිව් දිස්ත්‍රික්කවල සියලු ම රජයේ පාසල් ද මන්නාරම සහ වවුනියා දිස්ත්‍රික්කවල ඇතැම් රජයේ පාසල් ද 2009 ජූනි 01 පාසල් සංගණන දිනය වන විට වසා තිබිණි.

(u) පළමු වර අ.පො.ස. (උ.පෙළ) විභාගයට පෙනී සිටි අපේක්ෂකයන්ගේ ප්‍රතිඵල අනුව

(v) පළමු වර හා දෙවන වර විභාගයට පෙනී සිටි අපේක්ෂකයන්ගේ ප්‍රතිඵල අනුව

(w) සිංහල හෝ දෙමළ මාධ්‍ය සහිත ව ඉංග්‍රීසි මාධ්‍යයෙන් ද විෂයයන් කිහිපයක් හදාරන සිසුන්

(x) සලකා බලන වර්ෂයේ සාමාන්‍ය අධ්‍යාපනය සඳහා කරන සමස්ත වියදම, වර්ෂයේ ශිෂ්‍ය සංඛ්‍යාවෙන් බෙදීමෙන් ඒක පුද්ගල ශිෂ්‍ය වියදම ගණනය කරනු ලැබේ.

(y) සාමාන්‍ය පෙළ විද්‍යාගාර/ විද්‍යා කාමර හෝ මිනි ලැබ් සහිත 6-11/ 6-13 පාසල් ප්‍රතිශතය

N/A—අදාළ නොවේ

X—දත්ත නොමැත

** අවසන් පාසල් සංගණන දත්ත එළි දැක්වීමෙන් පසු සකස් කරනු ලැබේ.

# ඇමුණුම 2

## 2018 වසරේ අධ්‍යාපන අමාත්‍යාංශයෙන් නිකුත් කළ චක්‍රලේඛ

| දිනය | චක්‍රලේඛ අංකය | විෂය හා යොමුව |
|---|---|---|
| 2018-01-19 | 2018/02 | සමාජ විද්‍යා තරගාවලිය (2018 වර්ෂයේ සිට බලපැවැත්වෙන පරිදි) |
| 2018-01-19 | 2018/02 | පාසල්,කලාප, පළාත්, සමස්ත ලංකා හා ජාතික මට්ටමේ සමාජ විද්‍යා තරගාවලිය පැවැත්වීම සඳහා වන චක්‍රලේඛය සංශෝධනය |
| 2018-01-30 | 2018/08 | සමස්ත ලංකා පාසල් බටහිර සංගීත හා නැටුම් තරගය -2018 |
| 2018-02-16 | 2018/03 | 2 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණි දක්වා සිසුන් ඇතුළත් කිරීමට අදාළ 2008/37 චක්‍රලේඛයේ 06 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීම සම්බන්ධ නව සංශෝධනය |
| 2018-03-12 | 2018/09 | සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය,පාසල්,කලාප,පළාත්,සමස්ත ලංකා හා ජාතික මට්ටමේ වාර්ෂික තරගාවලිය පැවැත්වීම සඳහා වන චක්‍රලේඛ සංශෝධනය- 2018 |
| 2018-03-13 | 2018/12 | පාසල්,කලාප,පළාත් හා සමස්ත ලංකා මට්ටමේ දෙවන ජාතික භාෂා (සිංහල/දෙමළ) වාර්ෂික තරගාවලිය පැවැත්වීම සඳහා වන චක්‍රලේඛය සංශෝධනය |
| 2018-03-14 | 2018/13 | සමස්ත ලංකා පාසල් නාට්‍ය හා රංග කලා උළෙල 2018 |
| 2018-03-23 | 2017/33(i) | 2018 - පාසල් වාර සටහන |
| 2018-03-29 | 2018/16 | 2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක නව විද්‍යා විෂයය නිර්දේශය හදාරන සිසුන් 2019 වර්ෂයේ සිය ඉදිරියට අ.පො.ස(උ/පෙළ) විභාගයට සූදානම් කිරීම |
| 2018-04-23 | 2018/18 | පාසල් ක්‍රීඩා ප්‍රවර්ධනය |
| 2018-04-25 | 2018/11 | පාසල් පුස්තකාල හා ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථාන සඳහා උපදෙස් සංග්‍රහය සංශෝධනය |
| 2018-05-23 | 2018/21 | පාසල් ගුරුවරියන් සඳහා ගර්භනී සමයට උචිත ඇඳුමක් හඳුන්වා දීම |
| 2018-05-31 | 2018/24 | පාසල් වල පළමු ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම |
| 2018-06-04 | 2018/21(i) | පාසල් ගුරුවරියන් සඳහා ගර්භනී සමයට උචිත ඇඳුමක් හඳුන්වා දීම |
| 2018-06-20 | 2018/17 | රජයේ අනුමත පෞද්ගලික පාසලක සිටිය යුතු අධ්‍යයන කාර්යය මණ්ඩලය නිර්ණය කිරීම |
| 2018-06-22 | 2018/26 | පාසල් පාදක ගුණාත්මක ප්‍රමාණාත්මක හා ව්‍යුහාත්මක සංවර්ධනය සඳහා සැලසුම්කරණට හා ප්‍රසම්පාදනය පිළිබඳ චක්‍රලේඛය හා මාර්ගෝපදේශ අත්පොත |
| 2018-06-25 | 2018/27 | අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව හා වැඩසටහන (2015-2019) අධ්‍යාපන අමාත්‍යාංශය |
| 2018-07-06 | 2018/22 | ජාතික පාසල් වලට අයත් නිල නිවාස වෙන් කර දීම |
| 2018-07-06 | 2018/25 | වතු පාසල් වැඩිදියුණු කිරීම සඳහා සමාගම් යටතේ පාලනය වන රාජ්‍ය වතු වලින් ඉඩම් ලබා ගැනීම |
| 2018-07-19 | 2018/32 | 2016 අංක 12 දරන තොරතුරු දැනගැනිමේ අයිතිවාසිකම පිළිබඳ පනත මහජනතාව වෙත සමීප කිරීමේ අරමුණින් පවත්වනු ලබන සමස්ත ලංකා සිංහල සහ දමිල මාධ්‍ය ගද්‍ය රචනා හා විවාද තරගාවලිය පැවැත්වීම සඳහා මූලික උපදෙස් |
| 2018-08-30 | 2018/34 | හතරවන ශ්‍රේණිය සඳහා 2019 වර්ෂයේ සිට නව විෂයමාලාව ක්‍රියාත්මක කිරීම |
| 2018-08-31 | 2017/48(i) | ආධාර ලබන රජයේ අනුමත පෞද්ගලික පාසල් වල අනුමත පත්වීම් ධාරී ගුරුවරුන් සඳහා 2017 අයවැය තුලින් යෝජිත දේපළ ණය පිළිබඳ වරප්‍රසාද ලබා දීම |
| 2018-09-10 | 2018/37 | සුහග සිසුන් සඳහා ශිෂ්‍යත්ව වැඩසටහන 2018 |
| 2018-09-26 | 2018/38 | පාසල් වාර සටහන - 2019 |
| 2018-10-26 | 2018/40 | දහතුන් වසරක සහතික කළ අධ්‍යාපන වැඩසටහන යටතේ උසස් පෙළ වෘත්තීය විෂය ධාරාව ක්‍රියාත්මක කිරීමට ලබා දෙනු ලබන පාසල් පාදක මූල්‍ය ප්‍රධාන ඵලදායී අයුරින් භාවිතයට ගැනීම |
| 2018-12-13 | 2018/41 | පාසල් සිසුන් වෙනුවෙන් පාසල් නිල ඇඳුම් සඳහා තිළිණපත් ලබා දීමේ චක්‍රලේඛය |
| 2018-12-13 | 2018/42 | දුෂ්කර, අතිදුෂ්කර, හුදකලා පාසල් සිසුන් සඳහා පාවහන් තිළිණපත් ලබා දීමේ චක්‍රලේඛය |
| 2018-12-26 | 2018/43 | සමස්ත ලංකා පාසල් නර්තන තරග චක්‍රලේඛය 2019 |